ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත

03 කතෝලික සභාවේ සමාජ ධර්මය හා ගිහි විශ්වාසය


08 බස්නාහිරට තරග වදින කතෝලික අපේක්ෂකයෝ - 01


12 පරිසර සංවර්ධනයද? භෞතික සංවර්ධනය ද?


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07


චතාරික සමයේ පළමුවන ඉරුදින

ක්‍රි.ව. 2014 ක් වූ මාර්තු 09 ඉරිදා 148 වෙළුම 40 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි. QD/35/NEWS/2014

# නිදහස්ව ප්‍රජාතාන්ත්‍රික අයිතිවාසිකම කතෝලික ආධ්‍යාත්මයෙන් සනිටුහන් කරන්න පෙරට එන්න

## මීගමුව කලාපීය පූජක හා පැවිදි සංඝය නිවේදනයකින් ඉල්ලා සිටී

**මෙවර බස්නාහිර පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වන සියළුම පක්ෂවල කතෝලික අපේක්ෂක / අපේක්ෂිකාවන්ගේ විශේෂ හමුවක් මාර්තු 12 බදාදා පැවැත්වීමට කටයුතු සංවිධානය කැරෙමින් පවතින බව වාර්තා වේ.**

කතෝලික ආධ්‍යාත්මය තුළ ගන්වමින් වටිනාකම් හා හරයන් මත පිහිටා කටයුතු කරන්නට අරමුණු කරගනිමින් පැවැත්වෙන මේ හමුව මඟින් කතෝලික අපේක්ෂකයන් අතර අන්‍යොන්‍ය අවබෝධය, සමඟිය, එකමුතුකම ඇති කරන්නට හැකිවෙතැයි බලාපොරොත්තු වේ.

15 පිටුවට

## සදා සාමය දිනයි

ජේසු නිකායේ ගරු කිංස්ලි අදිකාරම් පියතුමා ඉකුත් දා සග සුව දිනීය.

එතුමාගේ ආත්මයට සදා සාමය පතමු.

## දෙව්සත්හල් මංගල්‍යය

අම්පිටිය ජාතික දෙව්සත්හලේ 59 වන වාර්ෂික මංගලෝත්සවය පසුගියදා මහනුවර රදගුරු අති උතුම් වියානි ප්‍රනාන්දු සහ බදුල්ල රදගුරු අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දි.ස.නි. හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

## “භක්ති ප්‍රබෝධනය” නව සංස්කාරක

ටී. සුනිල් ප්‍රනාන්දු විසිනි

නිර්මල මරිය නිකාය මඟින් ප්‍රකාශයට පත් කරන “භක්ති ප්‍රබෝධනය” මාසික කිතුනු සඟරාවේ නව සංස්කාරක ලෙස ගරු ලාල් පුෂ්පදේව නි.ම.නි. පියතුමා පත්ව සිටී.

කොළඹ විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන ඩිප්ලෝමාධාරියකු ද වන මෙතුමා අගරදගුරු පදවි ජනසන්නිවේදන කේන්ද්‍රය හා සම්බන්ධව රූපවාහිනී වැඩසටහන් සම්පාදකවරයකු ලෙසද කටයුතු කර ඇත. නව සංස්කාරක පියතුමන්ට “ප්‍රදීපයේ” සුබ පැතුම්!

## සසුන් පියාගෙන් අගරදගුරු පදවි ළමා දිනයට සුබ පැතුම්




කොළඹ අගරදගුරු පදවියේ 66 වැනි ළමා දිනය පසුගියදා තේවත්ත ජාතික බැසිලිකාවේදී අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. තමන් සසුන් පියා හමුවූ මොහොතේ අපගේ ළමා දිනය ගැන එතුමන්ට කී පසු එතුමන්ගේ ආදරණීය සුබ පැතුම් පුංචි ඔබට එතුමන් එක් කළ බව අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ කොළඹ අගරදගුරු පදවියේ සියලුම දහම් පාසල් හා කතෝලික පාසල් නියෝජනය කරමින් පැමිණ සිටි දූ දරුවන් අමතමින් පැවසූහ. **(සේයා සටහන - අශේන් එස්. සේනාරත්න)**

## ද්‍රවිඩ ජන ගී සමස්ත ලංකා සම්මානය පමුණුගම විදුහලට



සමස්ත ලංකා සංගීත තරගයේදී ද්‍රවිඩ ජනගී අංශයේ දමිළ හා සියලුම පාසල් අභිබවා පමුණුගම මහ විදුහලේ ජන ගී කණ්ඩායම සමස්ත ලංකා ප්‍රථම ස්ථානය හිමිකර ගත්හ.

විදුහල්පති අනුර ගුණවර්ධන මහතාගේ උපදෙස් මත විදුහලේ ආචාර්ය දිනේෂ් අබේසේකර මහතා මෙය ඉදිරිපත් කළේය. **(සේයා - බෙන්ජමින් කිරිහෙට්ටි)**

## චතාරික හා පාස්කු තරගාවලියක්

“මිණි උදාන” නත්තල් කලාපය චතාරික හා පාස්කු සමය නිමිත්තෙන් පාසල් දරු දැරියන් සඳහා චිත්‍ර හා රචනා තරග පැවැත්වීමට යයි. කාණ්ඩ 4 ක් යටතේ සිංහල හා දමිළ භාෂා දෙකෙන් තරග පැවැත්වේ. මාර්තු 03 සඳුදා ළමා ප්‍රදීපයේ විස්තර පළවිය.

## “වෙරිටාස්” වෙබ් අඩවිය ඔස්සේ

වෙරිටාස් ගුවන් විදුලිය මාර්තු 05 අළු බදාදා සිට වෙබ් අඩවිය ඔස්සේ විකාශනය කැරේ. මෙතෙක් කෙටි තරංග ඔස්සේ විකාශනය වූ වෙරිටාස් සිංහල සේවය මෙතැන් පටන් www.rveritas-asia.org ඔස්සේ ශ්‍රවණය කළ හැකිය.

## දහම් ගුරු ධර්ම විවේකය

අගරදගුරු පදවියේ මීගමුව කලාපීය දහම් ගුරු ධර්ම විවේකය මාර්තු 16 ඉරිදා දහවල් 1.00 සිට සීදුව සුපුවත් අරණ දී ආරම්භ කරන බව කලාපීය සම්බන්ධිකාරක පියතුමා දන්වා සිටී.

## විශේෂ පාස්කු කලාපය

ඥානාර්ථ ප්‍රදීපය විශේෂ පාස්කු කලාපය සඳහා ඔබගේ ලිපි, කවි, කෙටිකතා, සමඟ නව නිර්මාණ හා දහම් ලිපි මාර්තු 31 ට පෙර ලැබෙන සේ පාස්කු අතිරේකය, සංස්කාරක, “ඥානාර්ථ ප්‍රදීපය”, කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08 ලිපිනයට එවන්න.

## කතෝලික ආධ්‍යාත්මයෙන් ජනතා මෙහෙවර වර්ණවත් කරන්න



පසුගියදා පැවති ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකික කතෝලික ශ්‍රම සංක්‍රමණිකයන්ගේ වාර්ෂික හමුවේදී ධීවර හා ජලජ සම්පත් නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න මහතා හා එම මහත්මිය අති උතුම් ප්‍රැන්සිස් සුදොතුම් පියාණන් බැහැදැක ආශිර්වාද ලබාගත්හ.

එම හමුවේදී ශ්‍රී ලංකාවේ සාමය හා සමඟිය පිළිබඳව සිය සතුට පළ කරන ලද සුදොතුම් පියාණන්, උන්වහන්සේට ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලෙසට කළ ඇරියුම සතුටින් බාරගෙන නුදුරේදීම ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා සහභාගි වන බවද සඳහන් කොට සිටියේය. **(තිළිණ අලහකෝන්)**

## නව ජ.වි.පෙ. නායක කාදිනල් හිමි බැහැදකී



ජනතා විමුක්ති පෙරමුණේ “අපේ දැක්ම” ප්‍රතිපත්ති මාලාව එහි වත්මන් නායක අනුර කුමාර දිසානායක හා හිටපු නායක සෝමවංශ අමරසිංහ යන මහත්වරුන් විසින් අති උතුම් කාදිනල් හිමිපාණන් වෙත පිළිගැන්වූ අයුරු.
**(සේයා - ජ.වි.පෙ. මාධ්‍ය ඒකකය)**

## “දෙවන ආදම් වන ක්‍රිස්තුන් වහන්සේගෙන් දැහැමි බව ලැබේ” (රෝම 4:1-11)

පදවියට

# ඇතුගල්පුර රදගුරු හිමිපාණෝ කට්ටිමහන මීසම බැහැදකිති

**කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් පසුගියදා කට්ටිමහන මීසම බැහැදැකීමේ සංචාරයක යෙදුනි. තූර්ය වාදක කණ්ඩායම පෙරටුකර ගනිමින් ඉතා උණුසුම්ව මීසම් වාසින් විසින් උන්වහන්සේව පිළිගත් අතර ඉරුදින දිව්‍ය පූජා යාගය උන්වහන්සේ විසින් සිදුකරන ලදී.**

තම පදවියට අයත් දේව ජනතාව බැහැදැකීම රදගුරු තුමකුගේ ප්‍රධාන වගකීම බව එහිදී පහදා දුන් උන්වහන්සේ කට්ටිමහන මීසමට අයත් පළුගමුව සහ හේනේගෙදර යන දේවස්ථාන සංඝයන් ද බැහැදුටහ. මීසමේ සමිති සමාගම්වල නියෝජිතයන් ඇතුළු දූත සේවා මණ්ඩලය සමග සුහද සාකච්ඡාවක යෙදුනු උන්වහන්සේ මීසම හා පදවි මට්ටමින් විසඳිය යායුතු ගැටලු රැසක් පිළිබඳව ජනතාව දැනුම්වත් කළහ.

මෙ අවස්ථාව කට්ටිමහන සා. ආනා ජාතික සිද්ධස්ථාන පාලක ගරු ටෙරන්ස් කන්නන්ගර සහ සහායක ගරු ක්‍රිස්ටි කුමාර පියතුමන් සමග දූත සේවා මණ්ඩලය විසින් සංවිධානය කර තිබුණි.

**ලෙස්ලි වර්ණකුලසූරිය**

## සංවත්සර උලෙළ දළුපතදී

සා. වින්සෙන්තිද පාවුලා සංගමයේ දළුපත ශු. අන්තෝනි කොන්ෆරන්සිය සිය තෙවන සාංවත්සරය පසුගිය දින මහත් ජයෝත්සවයෙන් පවත්වන ලදී. සහෝදර කොන්ෆරන්සිවල පිරිසක්ද ඊට සහභාගි වූහ. මීගමු දිසා මණ්ඩල සභාපති කිංස්ලි හෙට්ටිආරච්චි සොයුරා ආරාධිත අමුත්තකු වශයෙන් මුලසුන හෙබවීය.

**කේ. ඒ. රෝලන්ඩ් ලෙස්ලි**



නාත්තන්ඩිය මීසමට අයත් සාගරගම ශුද්ධවූ බ්ලාසියුස් මුනි දේවස්ථානයේ වාර්ෂික මංගල්‍ය මීසම් සහයක ගරු ජූඩ් ශානක පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදුකළ අතර දිව්‍ය පූජා යාගයෙන් අනතුරුව උගුරේ ආබාධ සඳහා සුවය පතා පැමිණි ජනතාවද මීසම් සේවක ගරු උපාලි චර්චිල් සහයක ගරු ජූඩ් පියතුමන්ලා හා ගරු ඉමෙල්ඩා පැවිදි සොයුරියද ආසිරි ගන්වන අයුරු.

**ශ්‍රියාංගණී ෆිලිෂියා**



වෙන්නප්පුව කොලින්ජාඩිය ලූර්දු දේව මාතාවහන්සේට කැප කළ දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යය පසුගියදා අතිඋත්කර්ෂවත් අයුරින් පැවැත්විණි. නිමල මරිය නිකායේ ගරු ගාමිණී සිල්වා පියතුමන් විසින් මංගල්‍යය දිව්‍ය පූජාව සිදුකරන ආකාරය ඡායාරූපයෙන් දැක්වේ. වෙන්නප්පුව මීසම් සේවක ගරු එරික් සී. ප්‍රනාන්දු පියතුමන්ද ඡායාරූපයේ සිටී.

**සටහන - ප්‍රියන්ත පීටර්ස්, ඡේයා - බර්නාඩ් විතාරණගේ**



බේරුවල මීසමට අයත් බණ්ඩාරවත්ත ශුද්ධ වූ ලාසරස් මුනිඳුන්ගේ දෙව්මැඳුරට අයත් ධීවර ජනතාව විසින් වාර්ෂිකව පවත්වනු ලබන සින්දාත්‍රි දේවමාතාවන්ගේ මංගල උලෙළ මග්ගොන සාන්ත විසෙන්ති නිවාසයේ ගරු ලාල් පුෂ්පදේව නි.ම.නි පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. බෝට්ටු පෙරහර බේරුවල සිට කළුතර දක්වා ගමන් කිරීමෙන් පසුව ගරු පියතුමන් විසින් ජනතාව ආසිරි ගන්වන ලදී. බේරුවල මීසම් සේවක ගරු චින්ද රොෂාන් පියතුමන්ගේ මූලිකත්වයෙන් බේරුවල ධීවර ජනතාව විසින් මෙය සංවිධානය කරන ලදි.

**ඩී. ඇන්සලම් ප්‍රනාන්දු**

# කුඩාවැව කිතුනු පිබිදීමට අතදෙන්න

බෞද්ධ පරිසරයක් තුළ කුඩා කිතුනු සංඝයක් සිටින (පවුල් 35) මට්ටාකොටුව මීසමට අයත් කුඩාවැව ශු. කතරිනා මුනිශ්වරියගේ දේවස්ථානය වසර 80 ක් පැරණිය. බෞද්ධ අයගේ සහයෝගයෙන් කුඩාවැව කිතුනු සංඝයේ ජනතාව ජනවන්දනාව හා දහම් පාසලේ කටයුතු ඉතා උද්යෝගිමත්ව කරගෙන යති.

උස් බිම ප්‍රදේශයක පිහිටා ඇති මෙ අලංකාර දෙව්මැඳුර ආරම්භකර ගැනීම සඳහා මීසම සේවක ගරු හයිසින්ත් තිසේරා පියතුමාගේ පූර්ණ මඟපෙන්වීමෙන් ප්‍රදේශවාසි දානපති ව්‍යාපාරික මහත්වරුන්ගේ දායකත්වයෙන් මෙපමණ කලක් අඩුපාඩුවක්ව තිබූ දෙව්මැඳුර ඉදිරිපිට තාප්පයක් ඉදිකිරීම දැන් ආරම්භ කර තිබේ. මෙ උතුම් සත්කාර්ය සාර්ථකව නිමකර ගැනීම සඳහා ඔබගේ නොමසුරු සහාය ගරු පියතුමා සමග කුඩාවැව කිතුනු සංඝය බලාපොරොත්තුවේ.

**ඇන්ටනි ස්ටැන්ලි කීර්තිසිරි පෙරේරා**

## වැඩිහිටි නිවාසයේ ලූර්දු ගුහාව විවෘත වේ

හාලි-ඇල, මාවලගොඩ. 'දෙවි සරණ' වැඩිහිටි නිවාසයට අඩුපාඩුවක්ව තිබුන ලූර්දු ගුහාව ඉදිකර විවෘත කිරීම පසුගියදා සිදුවුනි. මෙයට උපකාර කළේ පුත්තලම, මංගල එළියේ ගරු මාරි පැවිදි සොයුරියගේ සොයුරු එස්. එම්. ලාල් මහතාය.

මෙ වැඩිහිටි නිවාසය පාලනය කරන ලංසිගම ගරු පැවිදි සොයුරියන් කීපදෙනෙක්ද මෙදින පැමිණ සිටියහ. ඉතාලියෙන් ගෙන්වන ලද ලූර්දු මෑණියන්ගේ ප්‍රතිමාව සහ සා. බර්නදෙත් තුමියගේ ප්‍රතිමාව ඉතා අලංකාර ලෙස නිර්මාණය කර තිබූ ලූර්දු ගුහාවේ තැන්පත් කර ආසිරි ගැන්වීම, බදුල්ල, රොක්හිල් රදගුරු නිවෙසේ ගරු ප්‍රසන්න ස්වර්ණාධිපති පියතුමන් විසින් සිදුකරන ලදී. මෙම වැඩිහිටි නිවාසයේ ප්‍රධාන මව්තුමිය වන ගරු දීපානි පැවිදි සොයුරිය පැවසුවේ "මෙ නිවසේ සිටින ගරු ආන්ජලෝ ෆොන්සේකා පියතුමා ඇතුළු අනිකුත් වැඩිහිටියන්ට මෙ නිවසින් එළිමහනට පැමිණ ජපමාලය උච්චාරණය කරමින් වෙනසක් දකින්නට සැලැස්වීම මෙ ලූර්දු ගුහාව නිර්මාණය කිරීමේ අරමුණ වූ බවයි."

**ශ්‍රීකාන්ති ගුණවර්ධන**

## සහයක පියතුමාට සමුදෙයි

සේනාපොළ මීසමේ සේවය කළ ගරු ජූඩ් චානක කෲස් සහයක පියතුමාට සමුදීමේ උත්සව කරඹ, දළුව, මාම්පූරිය, මැල් කොළණිය හා නාවක්කඩු - නාරක්කල්ලි යන දේවස්ථාන වලදි පසුගියදා පවත්වනු ලැබීය.

ගරු පියතුමා නාත්තන්ඩිය ශුද්ධ වූ ලූර්දු දේවමාතා සිද්ධස්ථානයට මාරුවී යාම නිමිත්තෙන් මීසම සේවක සභාව දහම් ගුරුවරුන් දහම් පාසල් දරුවන් හා ජනතාව එක්ව මෙම උපහාර පිදීමේ උත්සව සංවිධානය කර තිබිණි.

**ඇන්ටනි මෙරිල්**



පමුණුගම මහවත්ත ශු. ජුසේ මුනිඳුන්ගේ සහෝදර සමිතිය මගින් ප්‍රදේශයේ පාසල් යන්නාවු සමිතියෙ දරුවන් වෙත අභ්‍යාස පොත් හා පාසල් උපකරණ නොමිලයේ ප්‍රදානය කරන ලදි. සභාපති සුසන්ත පෙරේරා මහතා එම පොත් දරුවනට ප්‍රදානය කිරීම මෙම ඡේයාරුවෙන් දැක්වේ.

**බෙන්ජමින් කිරිහෙට්ටි**

## කන්ද උඩරට සා. විසෙන්ති පාවුලා තරුණ සමිතියක්



මහනුවර පදවියේ පළමුවරට සා. වින්සෙන්ති පාවුලා තරුණ සමිතියක් ජාතික කොන්ෆරන්සයට අනුබද්ධිත ව පසුගියදා ගැටඹේ සා. මරියා දේවස්ථානයේ දී ඇරඹිණි. ජාතික කොන්ෆරන්සයේ ලේකම් රොෂාන් ගුණරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් හා මීසම් සේවක ගරු සුදත් රෝහණ පියතුමාගේ අනුශාසකත්වයෙන් ඇරඹි මේ සමිතියේ නිල මඬුල්ල මෙසේය. සභාපති - ජේරම් තෙන්නකෝන්, ලේකම් - මිෂෙල් ජෝර්ජ්, භාණ්ඩාගාරික - ශාලිනි රාමචන්ද්‍ර

# පන්නිපිටිය ඒකාබද්ධ තරුණ එකමුතුවක්!

පන්නිපිටිය මීසමේ දෙව්මැඳුරු හයට සම්බන්ධ ක්‍රියාකාරි තරුණ තරුණියන් එක්රැස් කොට මීසම් ඒකාබද්ධ තරුණ සංගමයක් පසුගියදා පිහිටුවා ගන්නා ලදි. පන්නිපිටිය ක්‍රිස්තු රජාණන්ගේ දෙව්මැඳුර කේන්ද්‍රීය කොට ගත් මෙම තරුණ සංගමයේ මූලික අරමුණ වන්නේ තරුණ තරුණියන් අතර එකමුතුවක් ගොඩ නංවා කිතුනු පෞරුෂය සහ කුසලතා නැංවීමයි.

දෙව්මැඳුරු වල තරුණ කණ්ඩායම සහෝදර දෙව්මැඳුරු වල තරුණ තරුණියන් අතරට ගොස් තරුණ ජීවිතයක ඇති වටිනාකම ගැන දැනුම්වත් කිරීම මෙ දිනවල සිදුවේ. එලෙසම සෑම ඉරුදිනකම සවස විශේෂ යාච්ඤා මෙහෙයක් පන්නිපිටිය දෙව්මැඳුරේ පැවැත්වීමටද තරුණ සංගමය විසින් පියවර ගෙන තිබේ. මීසම සේවක ගරු ටිරෝන් පෙරේරා පියතුමාගේ පූර්ණ සහය ඇතිව සහයක ගරු දිනේෂ් කීර්තිසිංහ පියතුමා විසින් මීසමේ තරුණ වැඩ පිළිවෙල මෙහෙය වනු ලබන අතර ක්‍රියාකාරි වැඩිහිටියන්ගේ සහයද මෙ වෙනුවෙන් ලැබේ.

**ක්‍රිස්ටෝපර් රණසිංහ**

මොරටුව සා සෙබස්තියන් විදුහල් ආදි ශිෂ්‍ය සංගමය 70 සරතල්, එකමුතුව ළමා සත්කාර වැඩසටහනක් යෝජනා කර ඇත. ආර්ථික වශයෙන් පසුබෑමකට ලක්ව සිටින අසරණ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන පැවැත්වීම අරමුණයි. අවට කතෝලික සහ අකතෝලික පාසල් ළමුන්ව එක්කර ගෙන ඔවුනට සරණවීම අරමුණු කර මරිය වසරට සමගාමීව චාරික සමයේ මෙය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තුවෙන් සිටි.

අප්‍රේල් නිවාඩු සමයේ විනෝද චාරිකා සහ සවාරි යාමට පෙර අසරණ දරුවන් ගැනත් ටිකක් සිතන්න හැකිනම් එය කිතුනු අපේ යුතුකමකි. විවිධ ප්‍රශ්න වලින් අසරණ වූ දරුවනට ඉතා සුළුවෙන් හෝ ඔබටද දායක වීමට කරන ආරාධනයකි මෙ. මෙම එක්වීමට ඔබ කැමති නම් ඔබගේ ද්‍රව්‍ය ආධාර සඳහා අප අමතන්න. 0714483806 ආදි ශිෂ්‍ය සංගමය උප සභාපති, s.angolosilva@yahoo.com.

# තාරුණ්‍ය හමුව මාතලේ

මාතලේ සා. තෝමස් දේවස්ථානයේදී වාර්ෂික මීසම් තරුණ හමුව මෙවරත් පැවැත්විය. තාරුණ්‍යය ආදරය, අධ්‍යාත්මය යන තේමාව මූලික කර ගනිමින් මීසම් සේවක ගරු ඩිලාන් ප්‍රනාන්දු පියතුමාගේ මෙහෙය වීමෙන් තරුණ තරුණියන් 100 කට වැඩි ප්‍රමාණයක සහභාගිත්වයෙන් එය පැවැත්විය. නෙල්සන් වාස් කලාකරුවාණන්ගේ සහ ගරු ඇල්විය පීටර් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් වැඩසටහන ක්‍රියාත්මක කැරිණ.

ඉන් අනතුරුව 2014 වර්ෂය සඳහා නව නිළධාරි මණ්ඩලය පත්කැර ගැනිණ. අනුෂා ප්‍රියදර්ශනි (සභාපතිනිය) වූ අතර 15 දෙනෙකුගෙන් සමන්විත පාලක කමිටුවක් පත් කරන ලදි.

**ඒ. ආර්. ඇන්. මදසේකර**

## පමුණුවිලට නව මීසම් ගෘහයක්!

දළුගම මීසමට අයත්, පමුණුවිල ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයට නව මීසම් ගෘහයක් තැනීම සඳහා මූලික කටයුතු ආරම්භ කිරීමේ සාකච්ඡාවක් පසුගියදා දළුගම මීසම් සේවක ගරු ජූඩ් ෂ්‍යාමන් ප්‍රනාන්දු පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය.

මෙ කටයුත්තට ප්‍රදේශයේ කතෝලික ජනතාව හා දානපතින්ගේ ආධාර උපකාර ලබාගැනීමට පියතුමා ඇතුළු මීසම් කමිටුව විසින් තීරණය කරන ලදී. මෙහිදී මුදල් කමිටුව සහ ගොඩනැගිලි කමිටුව යනුවෙන් කමිටු දෙකක් මීසම් සභාවේ සාමාජිකයන් අතරින් තෝරා පත් කැර ගැනිණ.

**ලූෂන් එඩ්වඩ් පෙරේරා**



ගුරුගල්ල මීසම් සේවක ගරු ක්‍රිස්ටෝපර් කුරේරා පියතුමා මීසමෙන් සමුගැනීමත් සමග මීසම් සේවක ලෙස පැමිණි ගරු ටෝනි හපුආරච්චි පියතුමාව මීසම් ජනතාව විසින් මහත් හරසරින් පිළිගන්නා ලදි. එතුමා වසර 25 ස්පාඤ්ඤයේ සේවය කිරීමෙන් පසුව කෑගල්ල මීසමේ සහයක ලෙස මාස අටක සේවය නිමකොට ගුරුගල්ල මීසම් සේවය භාරගත්තේය.

**ක්‍රිෂාන් ඩයස්**

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586

ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.com

ක්‍රිස්තු වර්ෂ 2014 මාර්තු 09 ඉරිදා

# අද්‍යතන දේශපාලන භූමිකාව තුළ කතෝලිකයා

බස්නාහිර පළාතේ මෙවර පැවැත්වෙන පළාත් සභා මැතිවරණයට සියළුම පක්ෂ වලින් තරග කරන කතෝලික අපේක්ෂක අපේක්ෂිකාවන් පිළිබඳව දැනුම්වත් කිරීමේ වාර්තාමය අතිරේකයක් මෙවර කලාපය හා ඉදිරි සතියේ කලාපය තුළින් එළිදැක්වීමට ඥානාර්ථ ප්‍රදීපය කටයුතු කරයි. මෙය එක්තරා අන්දමකින් යම් කෙනෙකුට කුකුසක් ඇති කරවන නිමිත්තක් වීමට පුළුවන. තවත් කෙනෙකුගේ ඇස් බැම් ඉහල නංවාලන තොරතුරක් බවටද පත්වීමට පුළුවන. නමුත් අප දේශයේ අද්‍යතන දේශපාලන භූමිකාව තුළ කතෝලිකයින් හැටියට ක්‍රියාකාරිව සම්බන්ධ වී කටයුතු කිරීමේදී ඒ කතෝලිකයින් අවශ්‍ය තැන්වලට යොමුකිරීම සඳහා ඡන්දයෙන් තෝරා පත් කර යැවීමට කතෝලික අනෙක් සැදැහැවතුන් ඔවුන් ගැන යම් අවබෝධයක් ඇතිව සිටීමද යෙහෙකි. මෑත කාලීන දේශපාලන යටගියාව පිරික්සා බැලීමේදී බොහෝ කතෝලික සැදැහැවතුන් විවිධ පක්ෂ වලින් තේරී පත්වී ක්‍රියාකාරී දේශපාලනය තුළ ඉටුකොට ඇති අනගිභවනීය මෙහෙවර පිළිබඳ බොහෝ තැන්වල කථාබහටද බඳුන් වී තිබේ. නමුත් කතෝලික ශික්ෂාව තුළ ලබා ගන්නා පරිචය විධිමත් ලෙස අන්‍ය සුබසෙත උදෙසා වැය කිරීමේදී ඒ හා සම්බන්ධ වූ පිබිදුනු අධ්‍යාත්මයකින් සන්නද්ධ නොවන්නේ නම් ඒ තැනැත්තන් හෝ තැනැත්තියන් විසින් ඉටුකරලනු ලබන සේවාව අඳුරු පැහැයක් ගන්නා අතර එවන් චරිත ද කළු චරිත සේ හැඳින්වීමට ඉඩකඩ ඇත.

අද අප දේශයේ විවිධ ආගම් නියෝජනය කරන පිරිස් ඒ ඒ ආගමික මුහුණුවර තුළින්ද දේශපාලන පක්ෂ බිහිකරගෙන ඇත. විවිධ තේමා පාඨයන් ඔස්සේ ධාර්මික ප්‍රතිපදාව තුළ පිහිටාලමින් ක්‍රියා කරන බවට සපථ කර දේශපාලන ක්‍රියාදාමයට පිවිස ඇති ඔවුන් අතර ගිහි භවතුන් මෙන්ම පැවිද්දන්ද දැක ගත හැකියි. විවිධ අරමුණු අවසානයේ ආගමික මුහුණුවරකට ගෙන එතුළින් දේශපාලන පොර පිටියේ ධර්ම යුද්ධයකට වඩා බාහිර පැවැත්මේ විවිධ ශෝෂාකාරී පැවැත්මක් වෙතට යොමුවී ඇති එවන් පිරිස් හමුවේ ඡන්දය පමණක් නොව පක්ෂය පවා හෑල්ලු වී ඇති අයුරු අතීතයේ කදිමට සාධක සහිතව පෙන්වා දී ඇති අතරම වර්තමානය තුළද එවන් තත්ත්වයන් නොඅඩුව දැක ගත හැකිවී තිබේ.

කතෝලිකයා හට දේශපාලනය අකැප දෙයක් නොවේ. එලෙසම මේ ශ්‍රී ලංකා දේශය තුළ කතෝලිකයාට පමණක් උරුම වන දේශපාලන පක්ෂ අවශ්‍ය නැත. අනාගතයේදීද කතෝලික දේශපාලන පක්ෂයක ඇතිවීමක් පිළිබඳව කිසිදු හැඟීමක් ඇතිවිය යුතු නොවේ. එලෙසින්ම අප දේශයේ පවත්නා විවිධ දේශපාලන පක්ෂ යටතේ කතෝලිකයින් හට තම අභිමතයන් පරිදි ක්‍රියාකාරී වී දේශපාලන තලයට පිවිසීමට කිසිදු තහංචියක් ද නොමැත. නමුත් අභාග්‍යයකට මෑත අතීතයේ කතෝලික ආධ්‍යත්මවාදින් සේ පෙනී සිටිමින් ක්‍රියාකාරී දේශපාලනයට කතෝලිකයාගේ ඡන්දය තුළින් බලයට ආ යම් යම් පුද්ගලයින්ගේ අගතිගාමී ක්‍රියාකලාපයන් බහුතර කතෝලිකයින්ගේ නොමඳ විවේචනයට බඳුන් වූ අවස්ථා අල්ප නොවේ. එහි අහිතකර ප්‍රතිඵල දුටු නිසාම වර්තමානය තුළ දේශපාලන රංග පිටියට අවතීර්ණ වන කතෝලිකයින් හට නිසි මඟ පෙන්වීමක් තිබිය යුතු බවට විවිධ කතිකාවන් ආරම්භ වුනි

එහි ප්‍රතිඵලයක් සේ ඕනෑම මැතිවරණයකට පෙර විවිධ පක්ෂ වලින් ඉදිරිපත් වන අපේක්ෂකයින් කවුරුන්ද යන්න ප්‍රකාශ කළ යුතු බවට ආ මතය පිළිගත් අපිදු එය ක්‍රියාකාරී කරවීමට මෙලෙස ඉදිරිපත් වී සිටින්නෙමු. ඒ අනුව කතෝලික විශ්වාසිකයා තම නියෝජිතයා තෝරා පත් කර ගැනීමේදී ක්‍රියාකාරී දේශපාලනයට පිවිසෙන ඒ තැනැත්තා හෝ තැනැත්තිය තුළින් ඉටුවන සේවා දැක්ම පෙරසිටම දර්ශනය කර ගැන්මට සමත් විය යුතුයි. ඒ සමත් වීම සාක්ෂාත් කර ගන්නට ඔවුන් ගැන දැනුම්වත් විය යුතුයි. ඔවුන් හා සමඟ කතිකාවන් ආරම්භ කළ යුතුයි. ඔවුන්ගේ කතෝලික අධ්‍යාත්මය ගැන සමස්ත විවේචනයක් ඇතිකර ගත යුතුයි. ඒ අධ්‍යාත්මය පුබුදුවා ලන්නට උත්සුක විය යුතුයි. අවර්ණ දේශපාලන තලය අධ්‍යාත්මයේ හික්මුණු දැක්මෙන් වර්ණවත් කරන මෙන් බලපෑම් කළ යුතුයි. අර්ථයෙන් හා ධර්මයෙන් දිය යුතු ඔවදන් දෙමින් නිරන්තරයෙන්ම ලබන බලය තුළින් ඔවුන් ශික්ෂාකාමී මාර්ගය වෙතට අවංකව කැඳවන්නට ඇරැයුම් කළ යුතුයි.

මේ සඳහා මේ දේශයේ උපන් සෑම ජාතියකටම අයත් කතෝලික ලබ්ධිකයන් හට ඇති අයිතිය පිළිබඳව කරන විවරණයක් ලෙස මෙය සලකා බලන මෙන් අපි මේ මොහොතේ ඉල්ලීමක් කරන්නට කැමැත්තෙමු.

# කතෝලික සභාවේ සමාජ ධර්මය ගිහි විශ්වාසකයින් සතු කාර්යභාරය



## අති උතුම් දේව ධර්මාචාර්ය මේරියස් පීරිස් රදගුරු හිමිපාණන් විසිනි

අප ස්වාමින්වහන්සේගේ මිදි උයනේ සේවය කරන ගිහි විශ්වාසකයින්ට (මතෙව් 20:1-16) ආවේණික වූ චරිතාංගය වනුයේ, ලොව පුරා විහිදී ගිය ක්‍රිස්තියානි ශ්‍රාවකයින්ගේ දේශීය ස්වභාවයයි.

දේව රාජ්‍යය දෙසට යෑමේදී දේවාභිමතයට අනුකූලව ලෞකික කාර්ය පටිපාටින් නිසි අයුරු හසුරුවාලමින් ක්‍රියාශීලි වීමේ වගකීම ගිහි ජනතාව වෙත පැවරී ඇත. (දේව සභාව පිළිබඳ දේවධර්මානුකූල ව්‍යවස්ථා පද්ධතිය - ලූමෙන් ජෙන්සියුම් 31)

ගිහි විශ්වාසවන්තයා නිසි අයුරින් හඳුනා ගැනීම ප්‍රත්‍යක්ෂ ලෙස තහවුරු වන්නේ ප්‍රසාද ස්නාපනය, අභිවෘද්ධි ආලේපය සහ දිව්‍ය සත්ප්‍රසාදවහන්සේ යන ත්‍රිවිධ දේව ප්‍රසාද නිධාන මගින් ලබන ආත්මික ජීවිතය සහ පෝෂණය තුළිනි.

ගිහි විශ්වාසිකයින්ගේ කාර්යභාරය වනුයේ ක්‍රිස්තුන් වහන්සේ තුළ උත්තරීතර සාක්ෂිකරුවකු ලෙසින් දේව හසුන ප්‍රකාශයට පත් කිරීමත්, ලෞකික ජීවිතයේදී අප අත් දකින පවුල, ලෝක ව්‍යාපෘතින් තුළ වෘත්තීමය කැපවීම. සංස්කෘතික විද්‍යාව සහ ගවේෂණය, සමාජ-ආර්ථික සහ දේශපාලනමය වගකීම කෙරෙහි යථාර්ථවාදීව ජීවත්වීමයි.

මෙමගින් යුක්ති-යුක්ත අව්‍යාජ ගිහි අධ්‍යාත්මික නැඹුරුවක් ගොඩ නැගීම සඳහා තමන්ද අන්‍යයන්ද පූජනීයත්වය කරා ගෙන ඒමට ඔවුහු ඇරයුම් ලබති. මෙම ක්‍රියාදාමය තුළ යළි උපත ලබන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම තමන් සතු සමාජීය ණය යුතුකම් ක්‍රියාවට නැංවීමේදී වඩාත් සාර්ථකවීම සඳහා තම තමන්ගේ අධ්‍යාත්මික සහ සදාචාරාත්මක දිවි පෙවෙත ශක්තිමත් කරගත යුතුව ඇත.

ඇදහිලිවන්ත ගිහියා විසින් තමාගේ විචක්ෂන භාවය හා වැටහීම අනුව හැම අවස්ථාවකදීම වඩාත් යහපත් දේ කුමක්දැයි තමා විසින්ම නිශ්චිත ලෙස තෝරාගෙන ක්‍රියා කළයුතු වේ.

ගිහි විශ්වාසිකයන් අභ්‍යාස කිරීමේදී සභා සමාජ ධර්මතා පිළිබඳ ඉගැන්වීම කෙරෙහි සැලකිලිමත්වීම වැදගත්ය. වත්මන් සමාජය තුළ ධර්මදූතික අරමුණු ක්‍රියාත්මක කරනු ලබන අවස්ථා වලදී, සභාවේ සමාජ ධර්මතා පිළිබඳව අවබෝධයකින් යුතුවීම ඉතාමත්ම අවශ්‍ය වන්නේය.

වත්මන් සමාජය තුළ ගිහි සහභාගිත්වය රඳා පවතින්නේ ඔවුන් විසින් කරනු ලබන විවිධ ක්ෂේත්‍ර වන පවුල සමාජ සංස්කෘතිය, දේශපාලනය සහ ආර්ථික කටයුතු වලදී දයාවේ සේවා ලක්ෂණ විද්‍යමාන විය යුතුමයි.

ගිහි විශ්වාසිකයාට අයත් සමාජ කටයුතු වලට අදාළ විවිධ ක්ෂේත්‍ර තුළ ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ මානව ගරුත්වය ව්‍යාප්ත කිරීම සඳහාය. සෑම මනුෂ්‍යයකුටම ජීවත්වීමේ පූර්ණ අයිතිය උපතේ සිට ස්වාභාවික මරණය දක්වාම ඇති බව තහවුරු කළයුතු වේ.

සභාව මෙන්ම පුද්ගලික ක්‍රිස්තියානි කාරයා සතු මෙම වගකීම සහිත කාර්යභාරය සංස්කෘතික වාතාවරණයන් තුළින් නියෝජනය විය යුතුමයි. මෙහිදී ජනමාධ්‍ය මගින් ඉටු කළහැකි ප්‍රබල බලපෑම ගිහියා විසින් අවබෝධ කරගත යුත්තකි. තවද ආර්ථික සහ දේශපාලනමය ක්ෂේත්‍ර වලදී ගිහි විශ්වාසකයින්ගේ සමාජීය කාර්ය භාරය සුවිශේෂ පැතිකඩයන් වනු ඇත.


සභාවේ සමාජ ධර්මතා පිළිබඳ ඉගැන්වීම ව්‍යාප්ත වෙමින් පවතියි. විවිධ මීසම් වලින් සමන්විත වූ දේශීය සභාවේ වගකීම සහ නිපුණත්වය වනුයේ සභා ඉගැන්වීම කවරේදැයි විමසිලිමත්ව හදාරමින් එයට සවන් දීමයි. මෙහිදී එකිනෙකාගේ අන්‍යෝන්‍ය වූ අවැසිතා සහ ප්‍රශ්න ඇඩි සෝදිසියකට ලක් කළයුතු වන්නා සේම එම සංකීර්ණ ද නිරාකරණය කිරීම සඳහා වඩාත්ම උචිත ක්‍රියාමාර්ග ගැනීමද අතිශයින්ම වැදගත් වේ.

තවද සමස්ත ශ්‍රී ලාංකිකයනට පොදුවේ බලපාන සමානාත්මතාවය, යුක්තිය සහ සාමය පිළිබඳ කතෝලික බැතිමතුන් සහ සමාජයේ බහු ජන කොටස් අතර පුළුල් සංවාදයකට වඩාත් සුදුසු වේදිකාවක් හා වාතාවරණයක් උදා කිරීමෙහි ලා සභාවේ සමාජ ධර්මතා පිළිබඳ ඉගැන්වීම ඉවහල් වන බවද අවධාරණය කරමු.

## මුහුණු පොත ලිපිය රචකයා ගැනයි...

පසුගිය සතියේ මේ පිටුවේ පළවූ 'මුහුණු පොත ජීවිත අවලස්සන කරයිද?' ලිපිය ශිරාන් මෛත්‍රී විසින් රචනා කරන ලද්දකි. දෝෂයකින් ඔහුගේ නම පළ නොවූ බව කරුණාවෙන් සලකන්න..

## කැමිලස්ගේ — තිත්ත ඇත්ත



# දේව ආදරයට ගමන් කළ යුත්තේ මිනිස් ආදරය තුළිනි

## අගරදගුරු පදවි සහයක රදගුරු හිමි පවසයි

**පියාණන් වහන්සේ තම එකම පුත්‍රයා දානය කර, මිනිසුන්ට දැක්වූ දයාව දේව දයාව යැයි මීගමුව කඩොල්කැලේ දේවස්ථානයේ පසුගියදා පැවැති දේව දයාවේ පස්වන අපෝස්තලික සම්මේලනය අමතමින් අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණෝ ප්‍රකාශ කළහ.**



එහි කැඳවුම් කරු ගුරුබැවිල දිසානායක හංවැල්ල මීසම් සේවක ගරු ගියොම් නෝනිස් පියතුමා තේමා දෙසුම පැවැත්වූ අතර ගරු සුබරාජ් පියතුමා දමිල බසින් සම්මේලනය ඇමතීය. කොළඹ, බදුල්ල, ත්‍රිකුණාමලය පදවි වලින් විශාල සාමාජික පිරිසක් පැමිණ සිටියහ.

**ඇන්තනි හෙට්ටිආරච්චි**

# කඩලාන සා. අන්තෝනි 2400 නුවානය පැවැත්වේ

දෙවියන් වහන්සේ ඔබව විටින් විට පරීක්ෂාවට ලක් කරනවා. ඔබට පැමිණෙන දුක්කම්කටොලු, කරදර, ලෙඩදුක්, අඩුපාඩු තුළින් උන්වහන්සේ ඔබව පරීක්ෂාවට ලක් කරනවා. නමුත් උන්වහන්සේ කිසි විටක ඔබව පාපයට වට්ටන්නේ නැතැයි කඩලාන සා. අන්තෝනි දේවස්ථානයේ 2400 වන නොවාන මෙහෙයේදී මීසම් සහයක මොරටු දිසා ලේකම් ගරු දිනේෂ් ප්‍රශාන් පියතුමා ප්‍රකාශ කළේය.

මීට වසර 47 කට පෙර දී මෙම නොවානය ආරම්භ කර ඇත්තේ ස්වර්ගස්ථ වූ ගරු ටියුඩර් වනිග සේකර පියතුමන් විසිනි. 2400 වන නොවානය අවසානයේ පාදුවා නගරයෙන් වැඩම කරවන ලද ශු. අන්තෝනි මුනි ධාතුවෙන් සැදැහැවතුන් ආසිරි ගැන්වීම මොරටු දිසා නායක කඩලාන මීසම් සේවක අතිගරු ලලිත් පෙරේරා පියතුමා සිදුකළේය.

**සුමිත් මාර්ක් ද සිල්වා**

# මොරටුව මීසමේ දේව වන්දනාව පිළිබඳව වැඩසටහනක්

දේව වන්දනාව පිළිබඳ වැඩසටහනක් පසුගිය දා කොළඹ අගරදගුරු පදවියේ ජන වන්දනාව පිළිබඳ අධ්‍යක්ෂ ගරු ඉන්ද්‍රජිත් පෙරේරා සහ මොරටුව මීසම් සේවක ගරු බර්ට්‍රම් රන්ජිත් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් මොරටුව ජයලත් අප ස්වාමිදුගේ කන්‍යාරාම, දේවස්ථානයේදී පැවැත්වුනි.

දේව ප්‍රසාද නිධාන, යාම යැදුම, දිව්‍ය සත්ප්‍රසාද ආශිර්වාදය, ශු. ජපමාලය, පාද නමස්කාරය, ශු. පැය ආදී කරුණු පිළිබඳව සවිස්තර විග්‍රහයක් මෙහිදී කරන ලදි.

මෙ වැඩසටහනට ජනවන්දනා කමිටුවේ සහ මීසම් සභාවේ සාමාජික, සාමාජිකාවෝ සහභාගි වූහ.

**රන්ජිත් කුරේ**



ගාල්ල පදවියේ හල්පාතොට නිර්මල ලූර්දු දේවමාතාවහන්සේගේ මීසමට අත්‍යවශ්‍යව තිබූ දහම් පාසල් ගොඩනැගිල්ල ගාලු පදවි රදගුරු අතිඋතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන් විසින් ආසිරිග න්වන ලදි. කතෝලික පවුල් 70 ක් පමණ සුළු පිරිසක් ජීවත්වන මෙම මීසමේ 50 කට පමණ ආසන්න දරු දැරියන් පිරිසක් දහම් දැනුමෙන් පෝෂණය ලබති. මීසම් සේවක ගරු ෂෙල්ටන් ප්‍රනාන්දු පියතුමාගේ ඉල්ලීම පරිදි මෙම දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව අනුග්‍රහය දැක්විය.

**ගරු අනුරාධ සෙනාලි සොයුරිය**



ප්‍රදේශයේ දිළිඳු ජනතාවට මහත් සේවයක් සලසන වැලිවේරිය සා. වින්සෙන්තිද පාවුලා දයා සේවා සමිතිය වාර්ෂිකව පවත්වන මහජන ආධාර ලබන්නන් උදෙසා පැවැත්වෙන තේ පැන් සංග්‍රහයට අමතරව වියලි ආහාර පාර්සල් බෙදා දීම මෙවරද සිදුකරන ලදී.

**ඩබ්. එම්. තිලානි පීරිස්**



ශ්‍රී ලංකා ක්‍රිස්තියානි කම්කරු ව්‍යාපාරය අනුබද්ධිත මාටින් ඩි කීගල් පදනම මගින් ශ්‍රී ලාංකික දු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වාර්ෂිකව පුරා අට වසරක් තිස්සේ ප්‍රංශයේ මැරතන් තරග වල නියැලෙමින් මුදල් ඉපයූ බෙල්ජියමේ එරික් වෑනි රිසැල්බර්ග් මහතාට සම්මානයක් පිරිනැමීම ඉකුත් දා පිටකොටුව සවන පාවුළු මධ්‍යස්ථානයේදී මීගමුව සා. ජූඩ් විදුහලේ අධ්‍යක්ෂ ගරු ලෙස්ලි ප්‍රනාන්දු පියතුමා අතින් සිදු කෙරිණ අනතුරුව ඡායාරූපය වමේ සිට ජාතික ලේකම් සුධර්මා පෙරේරා. ජාතික සභාපති තියබෝල්ඩ් සමරතුංග, ජාත්‍යන්තර සම්බන්ධිකාරක ශිරාන් මෛත්‍රි, ගරු ලෙස්ලි ප්‍රනාන්දු පියතුමා හා එරික් වෑන් රිසල්බර්ග් මහතා වෙති.

# මාර්තු 15 පමුණුගම චතාරික මඩු මංගල්‍යය

මඩු සිද්ධස්ථානයේ වාර්ෂිකව පවත්වන පමුණුගම මීසමේ චතාරික මඩු මංගල්ලය මෙවරද මාර්තු 15 දින ඉතා උත්කර්ෂවත්ව පැවැත්වීමට සංවිධායක මණ්ඩලය කටයුතු යොදා ඇත. මරිය වසරට සමගාමිව පවත්වන මෙම මංගල්ලය දෙව්මව්ගේ මහිමය ප්‍රකාශ කරමින් යැදුම් මෙහෙයන් පැවැත්වේ.

මාර්තු මස 12 දින මංගල්‍ය නිල ආරම්භක දිනයවේ. උදේ දිව්‍ය පූජාවද දවල්වරුවේ යැදුම් මෙහෙයන් හා සවස නුවානය පැවැත්වේ. මාර්තු මස 13 දින උදේ 10.30 ට පමුණුගම මඩු මංගල්ලයට සහභාගිවී නැසීගිය අයගේ ආත්මයන් වෙනුවෙන් විශේෂ දිව්‍ය පූජාවක් පැවැත්වෙන අතර දවල් 12.00 ට දෙව්මව්ට ගෞරවයක් වශයෙන් පවුල් උදෙසා පාළොස් පංති ජපමාලය ප්‍රසිද්ධියේ ඔප්පුකරනු ඇත. මෙදින සවස 3.30 ට එළිමහන් මහා පාදනමස්කාරයක් පැවැත්වේ.

මාර්තු මස 14 දින නිරතුරු වන්දනා දිනය වේ. දිව්‍ය සත්ප්‍රසාදවහන්සේ ප්‍රසිද්ධියේ වැඩමවා පෙරවරු 9.00 සිට පස්වරු 4.00 දක්වා පමුණුගම මීසමෙ ගම් කොටස් අනුව නිරතුරු ශු. පැය පැවැත්වේ. මෙදින සවස 6.30 ට සන්ධ්‍යා මෙහෙය හා දිව්‍ය සත්ප්‍රසාද පෙරහරද අනතුරුව ලූර්දු ගුහාව දක්වා දර්ශණීය ඉටිපහන් පෙරහරක් ගමන් කර ලූර්දු ගුහාව අභියස ලූර්දු මෑණියන්ට කැපවීමේ යාච්ඤාව හා ගීතිකා ගයනු ඇත. මාර්තු 15 දින සෙනසුරාදා පෙරවරු 6.15 ට මංගල මහා දිව්‍ය යාගය මන්නාරම රදගුරු අතිඋතුම් රායප්පු ජෝශප් හිමිපාණන් කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා රදගුරු හිමිපාණන් සමග පමුණුගම මීසම් පූජක පුතුන්ද පමුණුගම මීසම් සේවක පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් හවුල් දිව්‍ය යාගය සිදුකරනු ඇත. මංගල දිව්‍ය යාගයෙන් පසු මඩු මව්ගේ ප්‍රතිමාව රැගත් පෙරහර දෙව්මැඳුර වටා ගමන්කර අවසාන යාච්ඤාව පවත්වා ප්‍රතිමාවෙන් ආශිර්වාදය දානය කර මංගල්ල කටයුතු නිමාවට පත්වේ.

මෙවර ජනවන්දනා හා අධ්‍යාත්මික කටයුතු පමුණුගම මඩු මංගල්‍ය ආත්මික අධ්‍යක්ෂ ගරු ටයිටස් පොන්සේකා පියතුමා සමග දේශනාවාදි ගරු මංජුල නිරෝෂන් පියතුමා මෙහෙයවනු ලැබේ. මඩු සිද්ධස්ථානයේ භූමියේ ශු. ජුසේතුමාගේ ප්‍රතිමාවක් නොමැති අතර එය ඉදිකිරීමට සංවිධායක මණ්ඩලය බලාපොරොත්තු වේ. වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් සැකසීමට සිද්ධස්ථාන පාලක පියතුමා කටයුතු යොදා ඇත.

මාර්තු 15 මඩු මංගල්ලය පවත්වන පමුණුගම ජනතාව පැරණි කාලයේ මෙන්ම පවුල්පිටින් ජපමාලය. පාදනමස්කාර වැනි භක්ති අභ්‍යාසවල යෙදෙන ලෙසත් සිද්ධස්ථානයේ ගෞරවය කෙලෙසන කටයුතු නොකරන ලෙසත් සංවිධායක මණ්ඩලයය ඉල්ලා සිටිති. මෙම මංගල්‍යයට පමුණුගම මීසමෙ ගරු පියවරුන්ටත්, ගරු පැවිදි සහෝදරියන්ටත් ආරාධනාකර ඇති අතර මංගල්ල කටයුතු සාර්ථකව කරගෙන යාමට සැමගේ සහය බලාපොරොත්තුවන බව පමුණුගම මාර්තු 15 මඩු මංගල්ල සංවිධානයේ සභාපති සනි පොන්වීර ලේකම් ටියුඩර් ජයමාන්න මහතුන් සමග සංවිධායක මණ්ඩලය ප්‍රකාශ කරයි.

**බෙන්ජමින් කිරිහෙට්ටි**
**සනී නෝබට් පොන්වීර**

# මාවළියට නව ප්‍රසීඩියමක්

මරිය වසරට සමගාමිව මරිය හමුදාව පිළිබඳව ළමුන් දැනුම්වත් කර කණිෂ්ට මරිය හමුදා ප්‍රසීඩියම් ආරම්භ කිරීමට තුඩැල්ල පාලක සභාව කටයුතු යොදා ඇත. තුඩැල්ල පාලක සභාවේ ආත්මික අධ්‍යක්ෂ ගරු ජූඩ් සුරේස් රංගන පියතුමාගේ මඟපෙන්වීම අනුව ආරම්භ කර ඇති මෙම වැඩපිළිවෙළ යටතේ පළමු කනිටු ප්‍රසීඩියම ජාඇල මීසමේ මාඑළිය සා. රිටා දෙව්මැඳුරෙන් ආරම්භ විය.

තුඩැල්ල පාලක සභාවේ සභාපති ඇග්නස් විජේසුරිය මහත්මිය හා උප සභාපති බෙන්ජමින් කිරිහෙට්ටි මහතා ළමුන්ට මරිය හමුදාව පිළිබඳව අවබෝධයක් ලබාදී කණිටු ප්‍රසිඩියමක් ආරම්භ කරත. ජපමාල මාතා ප්‍රසීඩියම නමින් වන මෙහි සභාපති ශෂ්මි නදීමා සෙල්ලහේවා උපසභාපති හිසනි දිනු නිර්මාලි ලේකම් නිකොලා පෙරේරා භාණ්ඩාගාරික ඉෂාල් රුද්‍රිගු වෙති මඑළිය දෙටු ප්‍රසීඩියමේ සභාපති ධම්මිකා බණ්ඩාර මහත්මිය ගරු නිහාල් රුදිගු පියතුමාගේ මඟපෙන්වීම යටතේ මෙය සංවිධානය කළාය.

**පමුණුගම වාර්තාකරු**

# නව පූජක පුතාගේ පළමු දිව්‍ය පූජාව



හලාවත කාර්මෙල් දේවමාතා ආසන දෙව්මැඳුරේදී සලාපුර රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් අතින් ගරු ප්‍රදීප් සේවියර් තේවාචාර්ය තුමන් පූජක සේවා වරම් ලැබීමෙන් අනතුරුව තම උපන් ග්‍රාමය වන මෝරුක්කුලිය අන්‍යරූප විලාස වු ජේසුතුමන්ගේ දෙව් මැඳුරේදී අති විශාල ජනකායක් සමග තම කුළුදුල් දිව්‍ය යාගය පවත්වන ලදි. මෙය ඉතා සුවිශේෂි දිනයක් වූයේ මෝරුක්කුලිය ග්‍රාමයට බිහිවූ ප්‍රථම පූජක තුමා මෙතුමා වීමයි.

**ලයනල් කැලිස්ටස්**



'මරිය වසර' නිමිත්තෙන්, කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ සංකල්පයකට අනුව දෙස් - විදෙස් මරියොත්තමාවගේ සිද්ධස්ථාන වලට වන්දනා ගමන් සංවිධානය කිරීමේ වැඩපිළිවෙල යටතේ, පේරලන්ද මීසමේ 39 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ඉන්දියාවේ වේලන්කන්නි හි 'ආරෝග්‍ය දේව මාතා සිද්ධස්ථානයට සාර්ථක අධ්‍යාත්මික වන්දනා ගමනක් ගියහ. එම පිරිස එහිදී 'ඥානාර්ථ ප්‍රදීපය' කැමරා කාචයේ සටහන් වූ අයුරු මෙහි දිස්වේ. මීසම් සේවක ගරු ලියනගේ පැට්රික් පෙරේරා නි.ම.නි පියතුමා සමග සමන් විතානගේ මහතා මෙය සංවිධානය කළහ.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**



තලවිල මීසම් සේවක ගරු පයස් නිහාල් ප්‍රනාන්දු පියතුමාගේ මෑණියන් වු බොල්වත්ත ඩබ්ලිව් ඇලිස් ප්‍රනාන්දු මහත්මිය ස්වර්ගස්ථ වූවාය. අවමංගල මෙහෙයේදී තම මවට ගරු පියතුමා ඇතුළු පූජකවරුන් ගෞරවය පිරිනැමූ අයුරු.

**පර්සි ප්‍රනාන්දු**

ගරු විල්ප්‍රඩ් පින්තු පියතුමා

# දේව මවුන් වන මරියෝත්තමාවන්ගේ දිව්‍ය මාතෘත්වය



පසුගිය සතිය හා සබැඳේ

**මරිය තුමියගේ දිව්‍ය මාතෘත්වය හා ශු. සභාවේ මාතෘත්වය**

කැඳවීම හා දූත මෙහෙවර විමර්ශනය කිරීමේදී මරිය තුමිය හා ශු. සභාව අතර සමානත්වයක් දැකීම ස්වභාවිකය. මරිය තුමියගේ කාර්යභාරය ශු. සභාවේ කාර්යභාරය සමඟ සංසන්දනය කිරීම මුල් යුගයේ සභා පියවරුන් අතර ජනප්‍රිය තේමාවක් විය. හිප්පොලිටස් තුමා (ක්‍රි.ව. 170-235) මෙසේ ලියා ඇත. "ශු. සභාව නිරන්තරයෙන් ම වාක්‍යාණාන්ට උපත දෙන්නීය. එතුමිය මුලු ලෝකයම පාලනය කිරීම සඳහා නියම වූ ක්‍රිස්තුස් නම් සර්ව සම්පූර්ණ පිරිමි දරුවකු බිහි කරන බව ලියා ඇත. දේව දරුවා වන එතුමා සැබෑ දෙවියන් ද සැබෑ මිනිසා ද වන්නේ ය. ශු. සභාව සකල ජාතීන්ට ධර්මය දේශනා කිරීම මඟින් එම ක්‍රිස්තුන් වහන්සේට උපත දෙන්නීය" ශු. මෙතෝදියස් තුමා (815-885) මෙසේ පවසා ඇත. "ශු. සභාව තුළ දේව පුත්‍රයාණන්ගේ මාංශගතවීම පිළිනොගෙන අති ශුද්ධවූ කන්‍යමාතාව වෙතින් එතුමන්ගේ මාංශගතවීම ප්‍රකාශ කිරීම දෝෂ සහගතය. ඒ නිසා අපි හැම කෙනෙකුම ශුද්ධවූ කන්‍ය මාතාව තුළින් එතුමන්ගේ ශාරීරිකව පැමිණීම පිළිගන්නා සේම අප එකිනෙකා තුළින් එතුමන්ගේ ආධ්‍යාත්මිකව පැමිණීම පිළිගත යුතු වෙමු."

මරිය තුමියගේ දිව්‍ය මාතෘත්වය ශු. සභාවේ මාතෘත්වයක් සැසඳීමේ ලා ශු. සභා සම්ප්‍රදාය තුළ අග තැන් ගන්නේ ශු. අගුස්තීනු තුමාය. (354 - 430). "ශු. සභාව ක්‍රිස්තුන් වහන්සේටම උපත දෙන්නීය. මන්ද බෞතිස්ම ස්නාපනය ලබන සියල්ලෝ ක්‍රිස්තු දේහයේ කොටස්කරුවන් වන නිසාය. ශු. සභාව සැම අතින්ම මරිය තුමියට සමාන වන්නීය." ශු. අගොස්තීනු තුමා මෙසේ ද පවසා ඇත. "ක්‍රිස්තුන් වහන්සේට උපත දුන් මරිය තුමිය කන්‍යාවක හා මාතාවක වන්නීය. එමෙන්ම ක්‍රිස්තු සාමාජිකයන්ට උපත දෙන ශු. සභාව අපගේ ශුද්ධවූ හා මහිමාන්විත මාතාව වන්නීය."

මරිය තුමියගේ දිව්‍ය මාතෘත්වය හා ශු. සභාවේ මාතෘත්වය අතර සංසන්දනය දෙවන වතිකාන සම්මන්ත්‍රණයේ ජාතීන්ගේ ආලෝකය වේද ධර්ම ව්‍යවස්ථාවේ අංක 64 මනාව විස්තර කරයි. එහි අඩංගු ප්‍රධාන කරුණු මේ ආකාර වේ.

1. දේව වචනය විශ්වාසයෙන් යුතුව පිළිගැනීම තුළින් ශු. සභාව ද මරිය තුමිය හා සමානව මවක වන්නීය.
2. තම ධර්ම දේශනය හා බෞතිස්ම ස්නාපනය මඟින් ඇය ශුද්ධාත්මානුභාවයෙන් පිළිසිඳ දේවානුභාවයෙන් උපත ලබන දරුවන් හට නව හා සදාතනික ජීවිතය දානය කරන්නීය.
3. තම පියාණන් වන දෙවියන් වහන්සේට වූ පොරොන්දුවට මුළුමනින්ම විශ්වාසවන්තව පවතින ඇය කන්‍යාවක් වන්නීය.

තම ස්වාමින් වහන්සේගේ මාතාවන් අනුගමනය කරමින් ඇය ද පරිපූර්ණ විශ්වාසයක්, ස්ථිර බලාපොරොත්තුවක් හා අවංක ප්‍රේමයක් ආරක්ෂා කර ගන්නීය.

**නිගමනය**

ශු. සභාවේ ජීවිතය හා සමස්ත ගැලවීමේ ඉතිහාසය යන පසුබිම තුළ පමණක් මරිය තුමිය පිළිබඳ අභිරහස නිවැරදිව අවබෝධ කරගත හැකිය. ශු. සභාවේ ද සකල මානව වර්ගයාගේ ද පරමාදර්ශය මරිය තුමියයි. ප්‍රේමයෙන් යුතුව තමන් වහන්සේ වෙතට අප ඇදගන්නා දෙවි සමිඳාණන් විශ්වාසයෙන් යුතුව පිළිගන්නා ආකාරය ද උන්වහන්සේගේ ප්‍රේමයට මිහිමත සාක්ෂි දරන ආකාරය ද අපට පෙන්වා දෙන්නේ මරිය තුමියයි.    - නිමි -

**(අගරදගුරු පදවි භාග්‍යවත් ජුසේ වාස් දේව ධර්ම නිකේතනයේ "විද්වත් සමාස දෙසුම" ඇසුරිනි)**

**සිරනියේ සීමොන් යුදෙව් චාරිත්‍ර අනුව පාස්කු මංගල්‍යයට සහභාගි වීම සඳහා ජේරුසලමට පැමිණි ආගන්තුක යුදෙව් භක්තිවන්තයෙක් විය. ඔහු පංච පුස්තකය හෙවත් පැරණි ගිවිසුම රක්ෂා කළ දැහැමි පුද්ගලයෙකි.**

# සිරනීයේ සීමොන්....

# ඔබ කරට ගත්තේ මාගේ කුරුසයයි

ජන සමාජය තුළ දෙවියන් වෙත මිනිසුන් සමීප කරලීමට අන් දිවැසිවරුන්ට වඩා වෙනස් ක්‍රමවේදයක් අනුගමනය කළා වූ ජේසුස් නම් වඩු කාර්මිකයා මළවුන් පවා ජීවමාන කර තමාගේ වචනයේ සත්‍යතාවය තහවුරු කරලීය. මේ උතුම් මිනිසාට කැරලිකාර සොර දෙටුවකුසේ මරණීය දණ්ඩනය පනවා එම කුරුසිය ද උසුලාගෙන ගෙන යන මාවතේ සිරනීයේ සීමොන් ඇතුළු බොහෝ ජනතාව මඟ දෙපසට වී තුස්නිම්භූතව බලා සිටින්නට ඇත. කුරුසිය මතු පිටින් ලී දණ්ඩක් සේ දිස්වුවද එහි ඇතුළාන්තය මිනිසකුට උසුලාගත නොහැකි අප සැමගේ පව් වලින් පිරී තිබුණි.

උන්වහන්සේගේ කීර්තිය පැතිර ගිය අවධියේ භෝජන සංග්‍රහ වලට ආරාධනා කරනු ලැබුවෝ බොහෝ ය. වහන් පටිය ස්පර්ශ කර සුවය අත්දුටුවෝ අපමණය. උන්වහන්සේගේ දෑත් තම දරුවන්ගේ හිස මත තබා දෙවිඳුන්ගේ ආශිර්වාදය ලබා ගැනීමට මව්පියන් පොරකෑහ. පව් බරින් පෝෂිත වූ ආත්ම අභිෂේකවත් කර දෙවිඳුන්ගේ නිවහන වෙත යන මාර්ගයට අවතීරණය කළේ ජේසුස් නම් මේ යහපත් යෞවනයා ය.

කුඩා දරුවකුගේ ආහාර වේලකින් පන්දහසකගේ කුස පිරෙන්නට සලස්වා මහා ප්‍රාතිහාර්යයක් කළ මේ මිනිසා පිපාසිතව ගිනිගත් මද්දහනේ මහපොළොවේ වාරුවක් නොමැතිව අවසානය කරා ගමන් කරමින් සිටින අයුරු ජේරුසලමේ ස්ත්‍රීන් දුකින් බර වූ කඳුළු පිරි දෙනෙතින් බලා සිටින්නට ඇත. සිරනියේ සීමොන් උන්වහන්සේ කළ ප්‍රාතිහාර්ය කිසිවක් අත්දුටුවේ නැත.

☛ ලබන සතියට

✍ **සුනිල් ජැක්සන් ප්‍රනාන්දු**
**කඩලාන - මොරටුව**

# "මනස්ථාප වන්න, සුභ අස්න අදහාගන්න."

**මිනිසාගේ පාපී බව හා ගැලවීම සිහිපත් කරන සුවිශේෂ වූ දින 40 ක කාල වකවානුවකට චතාරික කාලය යැයි කියනු ලැබේ. කිතුනුවන් වන අපට එය ඉතා වටිනා දේව මිනිස් සබැඳියාව සිහි ගන්වන ශුද්ධවූ කාලයයි.**

අළු බදාදායින් ආරම්භ කරන මෙම උතුම් කාලයේ අළු යනු පසුතැවිල්ලේ ලකුණකි. තම පව්වු බව පිළිගැනීමේ සලකුණකි. පුරාණ යුගවල මනස්ථාපනයේ දිනයන් වල අළු තවරාගෙන බිම දිගාවී දෙවිඳුන්ගේ සමාව අයැදීම හා පව්වු බව පිළිගැනීමේ ලකුණක් ලෙස සැලකුණ වර්තමාන සමාජය එය සිහිපත් කරමින් අළු වලින් කුරුසියක් තවරනු ලබයි. එම නිසා අළු බදාදා යනු පසුතැවිල්ලේ හා මනස්ථාපනයේ දිනයකි.

මෙම ශුද්ධවූ කාලයට මුල පුරන්නා වූ අප සැම යාච්ඤාව, උපවාසය, දන්දීම, වැනි යහපත් ක්‍රියාවන් වලට මුල් තැන දෙමින් ගත කරන්නාවූ කාල වකවානුව චතාරිකය නම් වේ.

එලෙසම මනුෂ්‍යයන් හැටියට පාපී බව හා දුර්පරික්ෂා වැනි අයහපත් ක්‍රියාවන් අපගේ ජීවිත තුළ තිබෙන්නාවූ පොදු ලක්ෂණයකි. නමුත් දෙවිඳුන්ගේ ආදරය, කරුණාව තුළ අපි සැම විට නතුවී ඇත්නම් මෙවායෙන් ජය ගැනීම එතරම් අපහසු ක්‍රියාවන් නොවේ. මේ කාලය තුළ විශේෂයෙන් දේව වචනය දෙසට වඩාත් නැඹුරු වීම අත්‍යවශ්‍යය.

අපි දෙවිඳුන් තුළ නිතරම ගැඹුරු ලෙස සම්බන්ධ වී ඇත්නම් අසල්වාසින් සමඟ සම්බන්ධ වීම අපට අපහසු නොවේ.

අපගේ සිත තුළ ඇතිවන ඊර්ෂ්‍යාව, වෛරය, පළිගැනීම වැනි අන්ධකාර බලවේග තුළ කිඳා බැස නොගෙන, සත්‍ය සාධාරණය හා කරුණාව කෙරෙහි මෙනෙහි කිරීමට මෙවර චතාරිකය ඇරියුම් කරයි. දෙව්පියාණන්ගේ ආදරයට අපට ළං විය හැක්කේ අප මුහුණ දෙන ප්‍රශ්න, වේදනා, දුක් කම්කටොළු තුළිනි. නමුත් දුර්වල මිනිසුන් වන අපි, අපගේ ජීවිත ගමන තුළ අපට හමුවන විවිධාකාර ප්‍රශ්න බාධක හමුවේ ඒවාට මුහුණ දෙනවා වෙනුවට ඒවායින් පැන ගොස් ක්ෂණික පිළිතුරු සොයයි.

අපි අපගේ ප්‍රශ්න වේදනාවන් ජේසු සමිඳුන්ට ඔප්පු කරනවා වෙනුවට අන්‍යාගමික සහය පතමින් දේවාල ගානේ ගොස් පුද පූජා පවත්වන්නට අප පෙළඹී සිටී. මේ සැම පහත් ක්‍රියාවන් තුළින්ම අප මනිනු ලබන්නේ අපගේම ආගමයි, අපගේම කතෝලික විශ්වාසයයි. බොහෝ විට අපට දෙවිඳුන්ව මතක් වෙන්නේ ප්‍රශ්න හා ගැටලු පැමිණෙන විටයි. අපි නත්තල් දාට, පාස්කු දාට, මහා සිකුරාදාට පමණක් පල්ලි යන දේව ජනතාව ද? අපගේ කතෝලික වටිනාකම කුමක් ද? සමහර අවස්ථාවල අපගේ නිවෙස්වල පවත්වන විවිධාකාර උත්සව වලට මුල් තැන දෙන්නේ නැකැත් බලන, මිනිසා මත පදනම් වූ චාරිත්‍ර වලට ද? එහෙමත් නැත්නම් තොවිල් කාරයින්ට ද? එසේ නම්, මෙන්න ඔබ ගත කළාවූ දෙබිඩි ජීවිතෙන් මිදෙන්න. කාලය එළඹ ඇත. අපගේ ආශාවන්, සිහින, බලාපොරොත්තු වලට සහය සොයන විවිධ වූ කෙටි මං වලට වඩා උරුම වූ දුක, වේදනාව, කඳුලැල් තුළ දෙවිඳුන් කෙරෙහි විශ්වාසය තබා සහනයක් ලබන්නට උත්සුක වෙමු. දේව විශ්වාසය, බැහැපත්කම, ඉවසීම වැනි ගුණාංග අප හදවත් තුළ නිර්මාණය කිරීමට අපගේ හදවත් විවර කරමු.

✍ **කේ. යසිත සුපුන් පෙරේරා**
**මහනුවර**

## අප ගැළවූ ශ්‍රී කුරුසිය


ශ්‍රී කුරුසිය වෙත නෙත් යොමා
සිහි කරමී මගෙ පව් සැමා
සුදු කුරුසියෙ බරට වඩා
මගෙ පව්බර වැඩිය මෙදා

දුබල මාගෙ පාපී බවෙන්
දුක් වින්දේ ජේසු තුමන්
ශ්‍රී රුධිරය බිඳ හෙළුවේ
තම ජීවිත පුද කෙරුවේ

කල්වරි කඳු මුදුනට නැඟ
සිය නෙත් ලෝ සැම වෙත යොමු කර
පාපී සැමට සාමෙ පතා
පිය දෙවිඳුට මොර ගැසුවා

ඇණ තුනකින් කුරුසේ හිඳ
ජුවාම් වෙතට නෙත් යොමු කර
භාර දුන්න මරිමව් වෙත
ජුවාම්ව තම පුතා ලෙසට

ලෝ සත වෙත ගැළවුම දී
තම ජීවිත පුද කරමින්
දේව පියට තුති පුදමින්
ගත්තා තම දෙනෙත පියා



✍ **බර්නි එඬේරමුල්ල**

# ජපමාලය


චිත්‍ර - මර්සලින් හීන්කෙන්ද
කතාව - පිලිගියන් කල්දේරා

10 කොටස



# මරිය තුමිය මැදි කරගෙන යන වන්දනා ගමන

**මේ මරිය වසරයි. මරිය තුමිය මැදි කරගෙන යන වන්දනා ගමනකි. ජපමාලය යනු ක්‍රිස්තු අභිරහස පිළිබඳ ගැඹුරු භාවනාවකි. මානව වංශ කථාව ආරම්භයේදීම දුන් දේව පොරොන්දුව තුළ මරිය තුමිය ද සිටියාය.**



මරිය තුමිය මානව කරළියට පැමිණියේ නව ගිවිසුමට මඳ කලකට පෙරය. එය එසේ වුවද මරිය මවුන් පිළිබඳ පූර්ව සළකුණු සහ සංකේත ප්‍රකාශනයන් ද පුරාණ ගිවිසුමේ නොයෙක් තැන් වලින් සොයා ගත හැකිය. ජේසු සමිඳුන් උපදින්නට අවුරුදු හත්සියකට පමණ පෙර යෙසායා දිවැසිවරයා කළ ප්‍රකාශයක් බයිබලයේ දිවැසාවලියේ සඳහන්ව ඇත. "ස්වාමින් වහන්සේම නුඹලාට ලකුණක් දෙන සේක. බලන්න කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයකු බිහිකරන්නීය. 'එම්මානුවෙල්' යන නම ඔහුට තබන්නීය" (යෙසායා 7:14)

හිරු උදාවට පෙර පෙරදිග අහසේ විසිතුරු රැස් දහරා පැතිරෙන්නා සේ ගැළවුම්කරුවාණන්ගේ උපතට පෙර එතුමාණන්ගේ පැමිණීම ගැන විවිධ සළකුණු සහ සංකේත පුරාණ ගිවිසුමේ නොයෙක් තැන්වලින් අපට සොයා ගත හැකිය. එම සළකුනු මරිය තුමිය හා බැඳෙයි. බයිබලයේ මැවීමේ කථාන්තරයට සම්බන්ධ සුගති උද්‍යානයේ මැද ඉතා සරු සාර ලෙස වැවී තිබුණු එසේම මානව සංහතියේ බලාපොරොත්තු වූ ජීවන වෘක්ෂය මරිය තුමිය පිළිබඳ සළකුණකි. නිසරු පෙදෙසක ගංගා වලින් සරු සාර වූ සුගති උද්‍යානයක් අර්ථවත් වන්නේ ද මරිය තුමියයි. ජල ගැල්මෙන් ලෝකය විනාශ වෙද්දී මානව සංහතිය ආරක්ෂා වීම සඳහා සකස් කළ නෝවාගේ නැවද මරිය තුමිය පිළිබඳ සළකුණකි.

ජල ගැල්ම අවසානයේ දෙවියන් වහන්සේ නෝවා සමඟ ගිවිසුමක් ඇති කර ගත් සේක. ලෝකය නැවත ජලයෙන් විනාශ නොකිරීමේ පොරොන්දුවක් වශයෙන් දේදුන්න සළකුණක් ලෙස අහසේ තැබූ සේක. අහසේ තැබූ දේදුන්න මරිය තුමිය පිළිබඳ සංකේතයකි. ඇය මිනිස් වර්ගයාගේ ආරක්ෂාවේ බලාපොරොත්තුවයි. ජලය බැස ගිය පසු නෝවා නැවෙන් පිටතට පරෙවියකු යැවූ බවත් ඌ ඔලිව් අත්තක් කඩාගෙන ආපසු පැමිණි බවත් කියවේ. පරෙවියා සහ ඔලිව් අත්ත සාමයේ සළකුණකි. අනාගතයේ සාමයේ කුමරා ලොවට ගෙන එන්නට සිටි මරිය තුමිය ගැන මේ සළකුණින් ඉඟියක් නොවන්නේ ද?

සලමොන් රජතුමා සැදූ මහා දේව මාළිගය කැප කළ පසු ස්වාමින් වහන්සේ එහි වැඩසිටින බව ප්‍රකාශ විය. එය අප දකින්නේ මරිය තුමිය ලෙසයි. අසිරියන් බලවේගයෙන් ඊශ්‍රායලය මුදාගත් වීර කාන්තාව වූ ජූඩිත් ඊට වසර දහස් ගණනකට පසු සමස්ත මානව සංහතිය ගලවා ගත් ගැළවුම්කරුවාණන්ගේ මෑණියන් වූ මරිය මාතාවන් පිළිබඳ පූර්ව සළකුණක් නොවන්නේ ද එපමණක් නොව පුරාණ ගිවිසුමේ දැක්වෙන එස්තර්ද මරිය තුමියගේ සළකුණකි. එදා එස්තර් මෝර්දෙකෙයි සහ ජනතාව ගලවා ගත් වීර රැජිණිය වූවාය. අද ලොව ගැළවීමේ කාර්යයට හවුල් වන වීර මාතාව මරිය රැජිණියයි. අද මුළු ලෝකයම පාපයෙන් මුදා ගන්නට දෙව් පියාණන් ඉදිරියේ අප වෙනුවෙන් මැදහත්වනුයේ ගැළවුම්කරුවාණන්ගේ මෑණියන් වන මරිය මාතාවයි.

**බෙත්ලෙහෙම් නගරයට ගමන් කිරීම**

රෝමානු රාජ්‍යයේ අගරජ වූ අගොස්තුස් සේසරු ගාම්භීරයෙන් තම රාජ්‍යයේ ජන ලේඛනය ගනු වස් සියල්ලන් තම තමන්ගේ නම් ලියවන්නට ස්වකීය ජන්ම නුවරට පැමිණෙන ලෙස අණ කළේය. එයින් ජුසේ තුමාත් කන්‍යා මෑණියන් කැටිව නාසරෙත් නුවරින් සැතපුම් අසූවක් පමණ දුර වූ බෙත්ලෙහෙම නගරයට යෑමට ශීත කාලයෙහි තිබූ අපහසුතාවයන් නොසලකා අග රජගේ ආඥාවටත් දේවාභිප්‍රායටත් යටහත්ව පිටත් වූයේය. එහි පැමිණි කල කිසිවකුගේ නිවාසයක නවාතැනක්වත් උන්වහන්සේලාට නොතිබුණේය.

☛ ලබන සතියට

✍ දොන් වින්සන්ට් රූපසිංහ

## පූජා සතිය
## මාර්තු 09 - 16 දක්වා

| | |
|---|---|
| 09 ඉරිදා | **චතාරික සමයේ පළමුවන ඉරුදින**<br>(දම්) උත්පත්ති 2:7-9,3:1-7<br>ගීතාවලිය 51:1-4,10-12,15<br>රෝම 5: 12-19 මතෙව් 4:1-11 |
| 10 සඳුදා | (දම්) ලෙවී ව්‍යවස්ථාව 19:1-2,11-18<br>ගීතාවලිය 19:7-9,14 මතෙව් 25:31-46 |
| 11 අඟහරුවාදා | (දම්) යෙසායා 55:10-11<br>ගීතාවලිය 34:3-6,15-18 මතෙව් 6:7-15 |
| 12 බදාදා | (දම්) ජෝනා 3:1-10<br>ගීතාවලිය 51:1-2,10-11,16-17<br>ලූක් 11:29-32 |
| 13 බ්‍රහස්පතින්දා | (දම්) එස්තර් (ද්.ස.ග්‍ර.) 4:17<br>ගීතාවලිය 138:1-3,7-8<br>මතෙව් 7:7-12 |
| 14 සිකුරාදා | (දම්) එසකියෙල් 18:21-28<br>ගීතාවලිය 130:1-8 මතෙව් 5:20-26 |
| 15 සෙනසුරාදා | (දම්) ද්.නී.සං. 26:16-19<br>ගීතාවලිය 119:1-2,4-5,7-8<br>මතෙව් 5:43-48 |
| 16 ඉරිදා | **චතාරික සමයේ දෙවන ඉරුදින**<br>(දම්) උත්පත්ති 12:1-4<br>ගීතාවලිය 33:4-5,18-20,22<br>2 තිමෝති 1:8-10 මතෙව් 17:1-9 |

# ළදරු ප්‍රසාද ස්නාපනය

**මූල ධර්මවාදී කණ්ඩායම් වලට අයත්, අප සාමාන්‍ය ව්‍යවහාරයේ දී බයිබල්කාරයෝ වශයෙන් හඳුන්වනු ලබන පුද්ගලයින් කණ්ඩායම් වශයෙන් අප කතෝලික නිවෙස් කරා යමින්, බයිබලයේ විවිධ පාඨ උපුටා දක්වමින්, කතෝලික විශ්වාසය හා ධර්මය අභියෝගයට ලක්කොට, ඔවුන්ගේ කණ්ඩායම් වලට කතෝලික අපවද බඳවා ගැනීමට මහත් වෑයමක් දරති.**

සමහර විට මෙවැනි කණ්ඩායම් මේ වන විට ඔබගේ නිවෙස් කරාද පැමිණ සිටිය හැකිය. මේ අය මුණ ගැසුන විට අප කුමක් කළ යුතුද? ඔවුන් හා තර්ක කිරීම කිසිම පලක් නැත. මන්ද මූලධර්මවාදියෙක් යනු කිසිවක් සාකච්ඡා කොට විසඳා ගත හැකි පුද්ගලයෙක් පමණක් නොව, හැමවිටම තමන්ගේ මතය පමණක්ම නිවැරදිය යන මතයෙහි වහලකු සේ එල්බ ගෙන සිටින කෙනෙකි. බයිබලීය පසුබිම ගැන කිසිත් නොදන්නා මොවුන්ගෙන් බොහෝ දෙනා, තමන්ගේ හිතුමතේට බයිබල් පාඨ උපුටා දක්වමින්, එකී පාඨයන්ගේ මතුපිට අර්ථය ගැන පමනක් ගිරවුන් වාගේ කියවනවා මිස, නිසි බයිබලීය හැදෑරීමක් ඔවුන් සතු නොවේ. එවැන්නන් සමඟ තර්ක කිරීම හෝ සාකච්ඡා කිරීම කිසි පලක් නොමැති අසාර්ථක ව්‍යායාමයකි. නමුත් අප ඔවුන් ඉදිරියේ මුනිවත රැකීමද නොකළ යුත්තකි. එවැනි අය මුණ ගැසුන විට අප කළ යුත්තේ අපගේ විශ්වාසයේ එඩිතර සාක්ෂිකරුවන් මෙන්, ඔවුන් ඉදිරිපත් කරන තර්කයන් ගැන හොඳ අවබෝධයකින් යුතුව, ඔවුනට යම්තාක් දුරට හෝ ඒත්තු යන අයුරින්, අපගේ විශ්වාසය හා කතෝලික සභාවේ ඉගැන්වීම් ඉදිරිපත් කර සිටීමය. එම නිසා මෙවැනි අවස්ථාවන්ට මුහුණ දීම සඳහා මෙම මූලධර්මවාදීන් නඟන ප්‍රශ්න කිහිපයකට, අපගේ කතෝලික පිළිතුරු කෙසේ විය යුතු දැයි තේරුම් ගැනීමට උත්සාහ කරමු.

මෙවැනි මූලධර්මවාදී කණ්ඩායම්වලට බැඳී සිටින කතෝලිකයන් නඟන තර්කයක් නම්, ළදරු ප්‍රසාද ස්නාපන පිළිවෙත කිසිම තේරුමක් නොමැති දෙයක් බවත්, ඔවුන් මෙම කණ්ඩායම් තුළ "නැවත ඉපදීම තුළින් නියම කිතුනුවකු වූ බවත් ය. නමුත් පුරාණ ගිවිසුමේ තිබූ චර්මඡේදන පිළිවෙත වෙනුවට අලුත් ගිවිසුම තුළ බව්තිස්ම ස්නාපනය ක්‍රිස්තුන් වහන්සේ විසින්ම ස්ථාපිත කළ බව ශුද්ධවූ බයිබලයේ පැහැදිලිව සඳහන්ව තිබෙන බව තේරුම් ගන්නට මේ අයට නොහැකි වී ඇත.

☛ ලබන සතියට

✍ අතිගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා

**ගරු හෙන්රි සිල්වා පියතුමා**

# අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත



**පසුගිය සතිය හා සබැඳේ**

**අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචිත අරමුණ**

සමහර කතුවරුන් විසින් අපොස්තුළුවරුන්ගේ ක්‍රියා පොත, සභාවේ ප්‍රථම 'භක්ති සංරක්ෂණාක ග්‍රන්ථය' ලෙස හඳුන්වනු ලබයි. ඔවුන් පවසනුයේ ජුදා දහම මෙන්ම රෝම අධිරාජ්‍යය ද හමුවේ කිතුනු දහම් දූත සේවාවේ වලංගුතාවය තහවුරු කිරීම එහි අරමුණ වී ඇති බවය. මෝසෙස් තුමාගේ නීතිය, සම්ප්‍රදායයන් හා ජුදා ආගමික අභ්‍යාස වෙත කිතුනු පණිවුඩය දැක්වූ ලිහිල් ආකල්පය මුල් කොටගෙන, එවකට පැවති නිල ජුදා දහම මගින් එය ප්‍රතික්ෂේපයට ලක් වූ බව නිසැක ය.

එලෙස කිතුනු පණිවුඩය, අව්‍යාජ ජුදා දහමට තර්ජනයක් මෙන්ම ඉන් පැන නැගුණ වේද භේදික අංකුරයක් ද ලෙස සලකන ලදී. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත තුළ ජේසුස් වහන්සේගේ ජීවිතය, දූත මෙහෙවර, මරණය හා උත්ථානය ඉදිරිපත් කෙරෙනුයේ ද අර්ථකථනය කෙරෙනුයේ ද පුරාණ ගිවිසුමේ අපේක්ෂාවන් පූර්ණත්වයට පත් වීමක් ලෙසය (13:16-41, 26:2-23). ඒ අනුව, කිතුනු පණිවුඩය හඳුනා ගැනුනේ දේව අනාවරණයේ ඉදිරි පියවරක් වශයෙනි. කිතුනුවනට එරෙහිව රෝම පීඩන දියත් වූයේ කිතුනුවන් ජේසුස් වහන්සේගේ උත්ථානය කෙරෙහි විශ්වාසය තබන ලද, යම් දිනෙක රෝම අධිරාජ්‍යය පරාජයට පත්කරන කඩාකප්පල්කාරී පිරිසක් ය යන වැරදි අවබෝධය නිසා ය.

තම දූත සේවාවේ වලංගුතාවය පෙන්නුම්කිරීම සඳහා පාවුලු තුමා ඉදිරිපත් කෙරෙන දේශනයක් හි උක්ත කාරණයට ඉඟිකරන බව ද, පෙනේ (24:13-17, 25:7-8, 26:31-32). අවසන් කොට, අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත හොවා දක්වනුයේ, කිතුනු පණිවුඩය ප්‍රචලිත වීම පිළිබඳ විචිත්‍ර නිදසුනකි. ජුදා දහමේ කේන්ද්‍රස්ථානය වූ ජෙරුසලෙමෙන් ආරම්භ වූ කිතුනු පණිවුඩ ප්‍රකාශය, ක්‍රමයෙන්, එහෙත් ස්ථාවරව, රෝම අධිරාජ්‍යයේ කේන්ද්‍රස්ථානය කරා පැතිර ගිය අයුරු දක්වන සිතුවමකි.

☛ ලබන සතියට

# චතාරික සිතුවිලි



**සමිඳුන් එදා...**

පාළුකරේ ඔබ හිඳිනා කුසගින්නේ
සිත පිරිසුම් කළ හිංසා වද දුන්නේ
බඩ ගින්දර බලය යසස
බාධක සේ පෙනුනේ
ජයගෙන ඔබ අප දිවියට
අලුත් පණක් දුන්නේ

**මම අද ...**

අද සාතන් අඳුනන්නට බැරි තරමට අලුත් වෙලා
පාපය පාපයක් ලෙසට නොපෙනෙන ලෙස වෙනස් වෙලා
පව් සිතුවිලි දිනෙන් දිනම ලෝකයෙ මුල් ඇදලා
දෑස් අන්ධ වී අත පය විලංගුවේ වැටිලා

සුන්දර වන තරමට පව් පෙනුම වෙනස් වෙලා
ගින්දර දැක පැන්නට එහි සතුට පිරී ගලා
පාන් ගල් කරන් කෑවත් දිරවන බඩ හැදිලා
ඒ නිසාම සමාව දෙනු මැන අනුකම්පා කරලා

**ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි. පියතුමා**

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

**දෙවන සතිය**
**සෙනසුරාදා**
**උදා යැදුම**

**92 වැනි ගීය**

**පසුගිය සතිය හා සබැඳේ ..**

ඔබේ පෙම ... ඔබේ විශ්වාසවන්තකම

මෙම යෙදුම් දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර සබැඳියාව තුළින් විදහා දැක්වෙන දේව ගුණාංග වශයෙන් බයිබලීය සම්ප්‍රදායන්හි දැක්වේ.

තත් දසයේ වීණාව:

හෙබ්‍රෙව් බසින් "අසෝර්" යනුවෙන් මෙම සංගීත භාණ්ඩය දේව වන්දනාවේ ගාම්භීර අවස්ථාවල යොදා ගැනිණි. එවැනි අවස්ථාවල විවිධ වූ අනෙක් භාණ්ඩයන් ද එක් කෙරිණි. (ගීතා 33:2, 150:3-5)

මා සතුටට පත් කරන්නේය :

තුති පැසසුම් ගී වල තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ සැදැහැවතා තුළ ඇතිවන ඇතුළාන්ත සංතුෂ්ටියයි. එය විශ්වාසයේ ගැඹුරු අත්දැකීමක් ද වන්නේ ය (ගීතා 9:3, 34:3, ලූක් 1:47)

ක්‍රියා කොපමණ උත්තරීතර ද... සිතිවිලි කොතරම් ගැඹුරුද?

විශ්වයේ දිස්වන දෙවියන් වහන්සේගේ මහිමතාව පැසසීම දේව ජනතාව එකම දෙවියන් කෙරෙහි ඇති විශ්වාසය ඉස්මතුකොට දක්වයි. (2 රාජා 19:15, ගීතා 72:18). මිනිස් ඥානය අභිබවා යන දෙව් සමිඳාණන්ගේ සැලසුම් ගැන විශේෂයෙන් ප්‍රඥා සාහිත්‍යයෙහි දැක්වේ. (ප්‍රඥා 17:1, ජෝබ් 38, ගීතා 36:6)

**(ආ) වගන්ති 7-9 :**

මෙම කොටස විස්තර කරන්නේ දුදනන්ට අත්දැකීමට සිදුවන යථාර්ථය පිළිබඳවයි.

අනුවණයන්ට : අනුවණ

# ගීතාවලිය



ශුද්ධ ලියැවිලි වසර

**(82)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

අයගේ හැසිරීම් රටාව නිති අයහපත් මාර්ගයට යොමුවන්නේ ගැඹුරුවූ දේව ප්‍රඥාව ඔවුන් වටහා නොගන්නා හෙයිනි (සලමොන්ගේ ප්‍රඥාව 17).

☛ ලබන සතියට

# දෙව් මැඳුරේදී අඩනිරුවත විලාසිතාව ද? බැහැපත්කම ද?

**කතුතුමනි,**

ඇතැම් සැදැහැවතුන් දෙව් මැඳුරට අඳින ඇඳුම් හා පැළඳුම් කොතරම් දුරට නිසි තැනට ගැළපේද?

අලුත් ඇඳුමකට ලස්සන ඇඳුමකට ඇතැමුන් මුල්තැන දීමට කටයුතු කර ඇති බව පෙනුනේ නත්තලට මංගල සිරිය එක් කරමිනි. එදින මැදියම් රාත්‍රියේ ගාල්ල නගරයේ ප්‍රධාන දේවස්ථාන කිහිපයකම විදෙස් සංචාරකයන් දැකගත හැකි විය.

මනා පිළිවෙළට හැඳ පැළඳ ගෙන සිටි ඔවුන්ගෙන් කාන්තාවන් කිහිප දෙනෙක් දෙව් මැඳුරට ඇතුලු වීමට මොහොතකට පෙර තවත් සළුවකින් දෙවුර වසා ගෙන ඇතුලු වූයේ ඔවුන් ගේ උඩුකය ඇඳුම ප්‍රමාණවත් නොවූ බව ඔවුන්ටම වැටහී ගිය නිසා යැයි සිතිය හැකිය.

අවාසනාවකට 'අපේ' ඇතැම් සැදැහැවතුන්ගේ අඩනිරුවත් ඇඳුම් දැකීමෙන් බොහෝ දෙනාගේ අදහසද වූයේ ඒ මසා 'නිම' නොකළ ඇඳුම් බවයි.

තවත් කෙනෙක් ඊට අර්ථ දක්වන්නේ තියෙන ඇඳුම ඇඳගෙන යාමේ අවංක 'බැහැපත්' කමයි. ඒ බැහැපත්කම නිසා දෝ 'පිට නැති' ඇඳුම් ද 'දිගනැති' ඇඳුම් ද දැක ගත හැකි වූ අතර කෙනෙකුගේ 'බැහැපත්'කම තව කෙනෙකුට පිළිකුල් සහගත විය.

'පල්ලියට ලස්සනට අඳින්න ඕන' යන අදහස මුදුන්පත් කරගත් තව කෙනෙක් තම ඇඳුමට එහෙන් මෙහෙන් කැලි එල්ලා ගෙන දෙව්මැඳුරට පිවිසෙන්නේ සැණකෙළි සිරි ගෙනය.

අද අඩනිරුවත තවත් වසර කිහිපයකින් තවත් 'අඩක්' අඩුවුවහොත් ඒ විපාකයෙන් ගැළවීමට අප කිසිවකුට නොහැකි වනු ඇත.

**මංගල ජයවර්ධන**
ගිංතොට

# ලිංගික වෙබ් අඩවි ප්‍රචලිත වීම

**කතුතුමනි,**

ශ්‍රී ලංකාව තුළ ලිංගික ක්‍රියා පිළිබඳ වෙබ් අඩවි ප්‍රචලිත වීමේ ප්‍රවනතාව පිළිබඳව ප්‍රදීපයේ කතුවැකිය ඉතා ප්‍රබල විශ්ලේෂණයකි. මුලින්ම බැලිය යුත්තේ මෙවැනි කාමුක ක්‍රියා අඩංගු වෙබ් අඩවි බලන්නේ ඇයිද යන්නය. මිනිසාගේ උපවිඥානයට රූපවලින් සිදුවන ක්‍රියාවන් හා සැබෑ මානුෂික ක්‍රියාවල වෙනස නොවැටහේ. ඒ නිසා යටි සිත විසින් කාමුක වෙබ් අඩවි සැබෑ ලිංගික ක්‍රියා බවට පෙන්නුම් කරයි. මිනිසා ලිංගික ක්‍රියාකාරීත්වයට පොළඹවන 'Libido' හෙවත් මනසේ ලිංගික ක්‍රියාවලිය උත්තේජනය වීම ඒ මගින් සිදුවේ. ලිංගික ක්‍රියාවලියට පෙරහුරුවක් මෙම වෙබ් අඩවි වලින් ලබාදෙන බව පෙන්නුම් කළ යුතුය. පරිණත සාක්ෂරතාවය ලබාගත් තරුණ පෙළසේම වැඩිහිටියන් ද මේ නිසා කාමුක ක්‍රියාවන්ට ප්‍රබල ලෙස පෙළඹෙන බව පෙන්වා දීම සුදුසුය. කාන්තාවන්ට එරෙහිව සිදුකරන අපරාධ රැල්ල මෙකී ප්‍රවනතාවයේ ප්‍රතිඵලයකි.

ශ්‍රී ලංකා නිල්වෙබ් අඩවිවලින් පමණක් නොව මත්පැන් පානය අතින්ද ලොව පළමුතැන ගන්නා බව ඒක පුද්ගල මත්පැන් පරිභෝජන දත්ත අනුව පෙන්වා දී ඇත. නිත්‍යානුකූල මත්පැන් පානය අතින් පළමු තැන රුසියානු රටවලට හිමිව ශ්‍රී ලංකාව දෙවැනි තැනට වැටුනද නීති විරෝධි මත්පැන් පානය ගත්කල ලංකාව ලොව පළමුතැන ගන්නා බව පැහැදිලිය. මෙසේ බලන විට මත්පැනින් හා ලිංගිකත්වයෙන් ශ්‍රී ලංකාව ලොව ඉදිරිපෙළ ජාතියක්ව සිටින බව කිව යුතුය. ඒ නිසාම අපරාධ අතින්ද ලොව ඉහළ තැනක් ශ්‍රී ලංකාවට හිමිවේ. මෙසේ මත්පැනින් මත්වූ ලිබිඩෝ උත්තේජනයක යුක්ත පිරිමින්ට අඩනිරුවත් ඇඳුම සහිත කාන්තාවන් මනා ගොදුරක් සේ පෙනීයාම පුදුමයක් නොවේ. අඩනිරුවත් ඇදුම කාන්තාවන් අතර ජනප්‍රිය වී ඇත්තේ ඒ තුළින් අන්‍යයන්ගේ අවධානයට ක්වීම සඳහාය. යම් ප්‍රසිද්ධ ස්ථානයකදී අනුන්ගේ අවධානයට යොමුවීමට කැමතිවීම ස්වභාවිකය. එය මිනිස් ගතියක ලිංගික බලවත් පිරිමින් සහිත සමාජයක ඔවුන්ගේ අවධානයට ලක්වීම සඳහා නවීන විලාසිතා වශයෙන් හඳුන්වනු ලබන අඩනිරුවත් ඇඳුම සමාජයේ අවධානය තමා වෙත යොමුකර ගැනීමට කාන්තාවන්ට මහඟු අවස්ථාවක් ලබාදෙයි. එකී අවස්ථාව නිසා චර්යාවට පටහැනි ඇඳුම් නිසා හෝ කාන්තාවන් මුහුන දෙන අවස්ථා අපහට නිතර කියවීමට ලැබේ.

මෙවැනි සමාජ විපිළිසර ගැන විශ්ලේෂනවල යෙදීම සුදුසු නමුත් වඩාත් වැදගත් වනුයේ ඒවායේ අහිතු ප්‍රතිඵල අවම කරන සමාජ විසඳුම් සාකච්ඡා කිරීමය. ප්‍රදීප කතුවැකිය මගින් ඒ සඳහා යෝජනා කර සිටින්නේ කුට සුචරිතවාදයක් නොව විවෘත අධ්‍යාපනික සංවාදයකි. එය ඉතාමත් කාලෝචිත ක්‍රියාවක් බැවින් ඒ ගැන තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා මෙවැනි විශ්ලේෂනයක් උපකාරි වනු ඇත.

කුල ගෝත්‍ර මත පදනම්වූ වර්ගවාදය තුළින් ක්‍රියාත්මක වූ ලාංකික සමාජ සංස්කෘතිය ඉතා පැරණි මානව සංස්කෘතින් අතර පවතී. කෘෂි ආර්ථිකයත්. වැඩ වසම් ක්‍රමයක්, මත පදනම වූ සමාජ හරයයන් මෝදු කර ඇත්තේ බුදු සමයෙන් ලැබුනු ආභාසයෙනි. පන්සිල් මත පදනම්වූ පැරණි සිංහල සමාජය තුළ බුදු සමයේ ආභාසය අගය කළ යුතුය. එහෙත් දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ව්‍යාප්තවී ගිය පශ්චාත් නූතනවාදය නිසා බුදු සමයේ සංවර කරනු ලැබූ සිංහල සමාජය මෙන්ම, හින්දු දේවවාදයෙන් කුළු ගැන්වී තිබුණු ද්‍රවිඩ සමාජයත් පෙරළී ගියේය. එලෙසම බටහිර රටවලින් පැමිණි ප්‍රජාතන්ත්‍රවාදය සංවරශීලි ස්වභාවය වැනි සංකල්පද උඩුකුරු වී ගියේය. පශ්චාත් නූතනවාදය අනුව පොදු සමාජ සම්මතය කොතරම් අමානුෂික වුවද එය යුක්ති යුක්ත කරනු ලැබේ. මේ නිසා අසංවර කාමුක ක්‍රියා ප්‍රචලිතවීම පොදු සම්මතය තුළින් සාධාරණීකරණය කරනු ලැබ තිබේ. ඊට ප්‍රතිවිරුද්ධ බලවේගය ගොඩනැගීම සියලුම ආගමික නායකයන්ට ඇති ප්‍රබල අභියෝගයක් වන්නේය.

එකී සමාජ උඩිකුරු යටිකුරු කරන කෘෟර සමාජ බලවේගය දැන් ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වී ඇත. මත්පැනින්, මත්ද්‍රව්‍යයෙන් හා කාමුකත්වයෙන් මෙන්ම අපරාධ රැල්ලෙන් ශ්‍රී ලංකාව දැන් ගිලී ඇත. 70 වේ දශකයේ උතුරු සහ දකුණු ප්‍රදේශවල ඇරඹි කෘෟර ක්‍රියා උතුරේ ජාතිවාදය ලෙසටත්, දකුණේ පන්ති විරෝධතාව ලෙසත් ප්‍රබලව පැතිර ගියේය. ඊට ප්‍රතිවිරුද්ධව ක්‍රියාකර සමාජ සංවරය ඇති කිරීම පිළිගත් ආගමික නායකයන්ගේ ඊතමාන කාර්යවේ. එය පහසු නොවුවත් නොකළ හැක්කක් නොවන බව කිව යුතුය.

**පී. වී. ඩී. ලියෝ සැම්සන්**
කඳාන

# මරිය 'හමුදාව' ප්‍රබල යෙදුමකි

**කතුතුමනි,**

මරිය හමුදාවේ නිර්මාතෘවරයා නම් ෆ්‍රැන්ක් ඩෆ් සහෝදරයාය. එතුමාගේ ප්‍රකාශය අනුව මරිය හමුදාව ප්‍රබල සේනාවකි. අත්පොතද මෙසේ කියයි. සඳමෙන් සොමි ගුණැති. හිරුමෙන් පැහැබර සකල වරප්‍රසාදවල මැදිහත්කාරිය වූ නිමල මරියමාතාවන්ගේ ප්‍රබල නායකත්වය යටතේ සාතන් සහ උගේ හමුදාවට එරෙහිව සටන් වදින හමුදාවක් බඳු 'මරිය හමුදාව' ශු. සභා අනුමැතියෙන් පවත්වාගෙන යනු ලබන කතෝලික සංවිධානයකි.

හමුදාව යන වචනයේ පරිසමාප්තයෙන්ම නිරන්තරයෙන් නපුරා ඉදිරියේ මරියතුමී සමගම සටන් කිරීම මෙම සේනාවේ අරමුණ බැවින් මෙයට මරියවහන්සේගේ සේනාව නොහොත් 'මරිය හමුදාව' යන නිර්භීත නාමය යොදා ඇතිබව ඉතා ගෞරවයෙන් සඳහන් කරමි.

යුද හමුදාව කී පමණින්ම ආයුධ සන්නද්ධව සිටිය යුතු බව සත්‍යයකි. නමුත් මරිය හමුදාව කී පමණින්ම ශු. ජපමාලය නමැති ආයුධයෙන් මරිය භටයා සන්නාහ සන්නද්ධ විය යුතු බව නොරහසකි. මරිය හමුදාව තුළ ශු. බයිබලය ලෙස ගරු කරන්නේ අත්පොතයි. එහි සඳහන් පරිදි ද මාතාවෝ මුළු විශ්වයේම රාජේශ්වරියයි.

ඕතොමෝ යටතේ සටන් වදින සේනාවද ඉතා ප්‍රබල විය යුතුයි. කරුණාවන්තව ද, ජ්වලිතවත්වද, මානුෂික හැඟීමෙන් යුතුව ආදර්ශමත් ද විය යුතුය. මරිය හමුදාව නිසා තමා බැබැළෙන්නේ නැතිව තමා නිසා මරිය සේනාව බැබළවීමට අවංකව කැපවීමෙන් ක්‍රියා කළ යුත්තෙමු. විශේෂයෙන්ම මෙ මරිය වසර තුළ කැපවීමෙන් ක්‍රියා කළ යුත්තෙමු, විශේෂයෙන්ම මේ මරිය වසර තුළ.

මරිය භටයන් නොහොත් සේනාවේ සෙබළ සෙබළියන් ඕනෑම දුෂ්කර සේවයක් වුවද කිරීමට නොසැලී නිතරම සූදානමෙන් සිටිය යුතුයි. යුද්ධ හමුදා භටයෙක් සතු ක්ෂණික සූදානම, විමසිල්ල කැපවීම සහ ඉවසීම ආදි දේ සැබෑ මරිය භටයෙක් තුළද තිබිය යුතුම විශේෂ ලක්ෂණය. එම වගකීම් රැසක් දරා සිටීම නිසාම මෙයට මරිය හමුදාව යන නාමය ඉතාමත් අගනේය.

තමා ශුද්ධවත්වී නොමග යන අය යහමගට ගෙන පියාණන් වහන්සේ වෙත ආත්මයන් දිනා දීමටද, සක්‍රමේන්තු ගත කළ යුතු අය ගරු පියතුමන්ලාට යොමු කිරීමටද, අසරණ, කොන්වූ පීඩිත අය සැනසීමටද, සිරගතවූවන් සහ රෝගීන් බැහැදැක දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා දීමට උදව් කිරීමටද, ගෘහ බැහැදැකීම් තුළින් දැහැමි මීසම් පවුලක් ගොඩ නැගීමටද, ළමා, තරුණ, වැඩිහිටි වශයෙන් නොබියව එකාමෙන් පෙලගැසී සිටින මේ සේනාවට 'මරිය හමුදාව' නමැති ශක්තිමත් නාමය ඉතාමත් සුදුසු බව සභා ශ්‍රේෂ්ඨ සැමට ඉතා ගෞරවයෙන් ප්‍රකාශ කරමි.

**කේ. ඩේසි පෙරේරා**
කඳාන

# අපරාධ රැල්ල මැඩ පැවැත්වීමට රටේ නීති දැඩි කළ යුතුයි

**කතුතුමනි,**

දශක තුනක් පුරා පැවති කුරිරු යුද්ධය දැන් අවසන් වී දේශයට සාමය උදාවී ඇතැයි දේශපාලකයන් වහසි බස් දෙඩුවත් රටේ සිදුවෙන මිනීමැරීම, ස්ත්‍රී දූෂණ, මංකොල්ලකෑම්, සිය දිවි නසා ගැනීම් හා මත්ද්‍රව්‍ය උවදුර දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. දහම් දිවයින අධර්මයේ තෝතැන්නක් බවට පත් වී රුපියල් සතවලට මිනීමරන දේශයක් බවට පත් වී ඇත.

කොපමණ පන්සල්, පල්ලි හා කෝවිල් තිබුණත්, දවස පුරා පිරිත්, බණ, දේශනා යාච්ඤා කළත් මිනිසුන් හොඳමඟට හැරෙන බවක් නොපෙනේ. අපරාධයට දඬුවම දීම හැර ඒ වෙනුවට කළ හැකි විකල්පයක් නොමැත. අපරාධකරුවෝ සතියෙන් දෙකෙන් ඇප පිට නිදහස්වී නැවත ඒ දේම කරති. නීති සංශෝධනය තුළින් හෝ නීතිය හරිහැටි ක්‍රියාත්මක කරන තාක් රටේ සිදුවෙන අපරාධ රැල්ලේ වේගය අඩු කළ නොහැකිය.

**ඩබ්ලිව්. සී. ටයිටස් පෙරේරා**
කටුනායක

# සෙත් සරණින් අරුත්බර නත්තලක් !

**කතුතුමනි,**


අරුත්බර නත්තලක් යනුවෙන් සංවිධානය කර තිබූ දිළිඳු දරුවන් 323 දෙනෙකු කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් තුමන් සමගින් ගත කළ පුවත ප්‍රදීපය පුවත් පතින් දැක ගන්නට ලැබුනි. අගනුවර මුඩුක්කු හා වතු ආශ්‍රිතව දිවි ගෙවන මේ දරුවන්ට කළ මහඟු සත්කාරය නම් ඉතාම වැදගත්ය. කවදාවත් වැදගතුන්ගේ දේශපාලකයන්ගේ දෙනෙත් නොගැටෙන මේ අසරණ පීඩිත පංතියේ සිටින දු දරුවන් සඳහා පවත්වනු ලැබූ මානුෂික සත්කාරය ඇත්තෙන්ම මෙවර අරුත්බර නත්තලක් ලබාදීමට වෙහෙසුනාට අප කතෝලික



ජනතාවගේ සුබාශිංසනයයි මේ.

දහසකුත් එකක් මහා පරිමාණයේ සේවා කරමින් මහත් ගාම්භීරාකාරයෙන් ජනමාධ්‍යයෙන් පෙන්වා නම සාදා ගැනීමට වෙහෙසන සැමට මෙය ඉතාම වැදගත් පාඩමකි. මෛත්‍රී මහත්මා එවැනි වාර්තා පලකරමින් අප කතෝලික ජනතාවට දෙන මහඟු සේවාව ගැනත් ඉතා අගය කරමු. තේවත්ත ජාතික බැසිලිකා පුදබිමට රැගෙන යාමත් අගරදගුරු මැඳුරේ විශේෂ නත්තල් වැඩසටහනකට සම්බන්ධවීමත් ඉතාමත් වැදගත් වගේම ඒ අසරණ දරුවන්ගේ මුහුණු වලින් වගේම හදවත් වලින් වටවූ අදහස් වචනවලින් එළිදක්වූ ආකාරයක් මොනවට පැහැදිලි වී තිබුනි. නත්තල යනු බෙදා ගැනීම බව ක්‍රියාවෙන් ඔප්පු කළ සෙත්සරණ අධ්‍යක්ෂ පියතුමා කළේ අපූරු ආදර්ශයක් බව අප ලංකාවාසි සැම කතෝලිකයෙක්ම අවංකව පිළිගන්නා බවද අවසානයේ දන්වනු කැමැත්තෙමි.

**ක්‍රිස්ටෝපර් සිල්වා**
හපුගොඩ



# මෙවර බස්නාහිර පළාත් සභාවට තරග

බස්නාහිර පළාත් සභාවට තරග වදින සියළුම පක්ෂවල කතෝලික අපේක්ෂකයින් හඳුන්වා දෙන පියවරේ මුල් අදියර
දේශපාලන ගමනක් යන්නට කතෝලික අපගේ ඡන්දය අප සහෝදර සහෝදරියන් වෙත ලබා දීම අප සතු යුතුකමක් බව අමප
පායන අවංක තරු සේ ඔවුන් මඟ සකසන්නට අපටත් යුතුකමක් ඇත. **(තවත් අපේක්ෂකයින් පිළිබඳ විස්තර ලබන සතියේ)**

## එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කතෝලික අපේක්ෂකයෝ

### ගොඩ්ප්‍රි කුරේ

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 27**



කඳාන මීසම් පුත්‍රයකු වන ගොඩ්ප්‍රි කුරේ මහතා වෘත්තියෙන් නීතිඥයකු හා වැඩ බලන මහේස්ත්‍රාත් තුමකු විය. කතෝලික ලේඛකයකු ලෙසත්, පර්යේෂකයකු ලෙසත් කටයුතු කළ අතර නීතිමය ගැටළු වලට පිළිතුරු ලබා දීමට විශේෂ අවධානයක් යොමු කළේය. කරිටාස් හි නීති උපදේශකයකු ද වන ඒ මහතා කාන්තා අයිතිවාසිකම් ගැන ජනතාව දැනුම්වත් කිරීමට වෙහෙස විය. කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ ක්‍රියාකාරී කතෝලික සිසුවකු ලෙස තරුණ අවධියේ සිටම ජාතික හා අන්තර්ජාතික වශයෙන් අත්දැකීම් බහුල සමාජ ක්‍රියාධරයෙකි.

### මෙරිල් පෙරේරා

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 29**



මෙරිල් පෙරේරා මහතා කඳාන මීසමේ උපත ලබා කතෝලික පන්නරය තුළින් ජීවිතය හැඩගස්වාගෙන ඇත. ජා-ඇල ප්‍රාදේශීය සභා විපක්ෂ නායක ලෙසත්, බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙසත් කටයුතු කරති ඒ මහතා මහ ඇමැතිවරයාගේ අධ්‍යාපන සම්බන්ධීකරණ මන්ත්‍රී ලෙස ගුරුවරුන් සම්බන්ධ කටයුතු කර ඇත. කතෝලික දෙව්මැඳුරු ආශ්‍රිත මාර්ග තනා දීමට පෙරමුණ ගත් ඒ මහතා "සරුදම් අරුණැල්ල" වැඩසටහන ඔස්සේ දෙව්මැඳුරුවලට රු. ලක්ෂ දෙක බැගින් ද දහම් පාසල්වලට උපකරණ ද ලබා දී ඇත. කතෝලික පාසල් සාමාන්‍යාධිකාරි පියතුමාගේ මඟ පෙන්වීම යටතේ කතෝලික පාසල් සංවර්ධන කටයුතු වලට දායක වී ඇත.

### නිමල් ලාන්සා

**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 16**



වැල්ලවීදිය මීසම් පුත්‍රයෙකි. කුඩාපාඩුව දෙව්මැඳුර ආශ්‍රිතව කටයුතු කළ අතර එයින් ලත් පන්නරය ඔස්සේ දේශපාලනයට පියමං කළේය. මීගමුව නගර සභාවට තරග කර ජය ලබා පසුව බස්නාහිර පළාත් සභාවට තරග කර වැඩිම මනාප සංඛ්‍යාවක් ලබා ඇමැතිවරයකු ලෙසද පත්විය. බස්නාහිර පළාතට සුවිසල් සේවාවක් ඉටු කරන අතරම කතෝලික දෙව්මැඳුරු හා ආයතන වෙත ද විශේෂ අවධානයක් යොමු කර සේවය කළේය.

### ආචාර්ය පෝල් පෙරේ

**- ගම්පහ දිස්ත්‍රික්කය**


**- මනාප අංකය 08**



ආචාර්ය පෝල් පෙරේරා මහතා ගෝනවිල මීසම් පුතකු ලෙස උපත ලබා අධ්‍යාපනයෙන් සිසු නැණස පාදන්නට උපරිමව දායක වූ කිතු
පළාත් සභා මන්ත්‍රීතුමකු ලෙස කටයු
ඔහු කතෝලික දෙව්මැඳුරු රැසක
කටයුතු සඳහා දාය ක වී ඇත.
කටයුතු වලින් ජනතාවට සේවය කර
කැපවී සිටින පෝල් පෙරේරා මහතා
අඩු ආදායම්ලාභීන් හා ජ්‍යෙෂ්ඨ
අද සමාජයේ සියලු කොටස් නැංවී

## එක්සත් ජාතික පක්ෂයේ කතෝලික අපේක්ෂකයෝ

### කේ. පී. ඇන්ටනි සිල්වා



**- කළුතර දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 13**

පයාගල මීසම් වාසී කේ. පී. ඇන්ටනි සිල්වා කළුතර දිසා කතෝලික තරුණ සංවිධානයේ සභාපති, කළුතර දිසා ධර්ම සේවා සභා සාමාජික හා සෙත්සරණ ක්‍රියාකාරී සාමාජිකයෙකි. මහජන බැංකු සේවකයකු වූ ඔහු එහි කිතුනු එකමුතුවේ විධායක නිළධාරියෙකි. ප්‍රදීප ලේඛකයකු ද වන ඔහු සභාව මුහුණ දෙන අභියෝග වලදී ගිහි නායකයකු ලෙස කිතුනු ලීලාව ප්‍රදර්ශනය කර ඇත. බේරුවල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයකු ලෙස 2002 සිට අඛණ්ඩව සේවය කරයි.

### ඇතිගේ සිරිකමල් ද සිල්වා



**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 11**

කඳාන, නාගොඩ මීසම් වාසී බැතිමත් කතෝලිකයෙකි. කතෝලික පාසල් වලින් මූලික අධ්‍යාපනය හදාරා 1988 සිට ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි ඔහු බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රී ධුර හොබවා ඇත. ළමා වියේ සිට පූජා සහයක සමිතියේ හා තරුණ සමිතියේ ක්‍රියාකාරී සාමාජිකයකු වූ ඔහු "ඥානාර්ථ ප්‍රදීපය" ගෙයින් ගෙට ගොස් අලෙවි කිරීමට ද මූලික වී කටයුතු කර ඇත. විශේෂයෙන් කතෝලික පාසල් පිළිබඳව පළාත් සභාවේදී හඬක් නැගූ කෙනෙකි.

### බී. රන්දීර් ආසිරි රුද්‍රිගු



**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 09**

පල්ලියවත්ත මීසම් වාසී කතෝලික පවුලක උපත ලැබූ ඔහු 2009 වසරේ බස්නාහිර පළාත් සභාවට තේරී පත් වී සිය ධන පරිත්‍යාගයෙන් කතෝලික දෙව්මැඳුරු වලට ආධාර කර ඇති ඔහු බලගල, නායකකන්ද හා වැල්ලපල්ලිය මීසම් හී කටයුතු සඳහාද ක්‍රියාකාරීව සහභාගී වේ. "රන්දීර් පදනම" යටතේ විවිධ ජන කොටස් වලට ද ප්‍රජා සත්කාර රැසක් සිදු කර ඇත. ප්‍රදෙශයේ තරුණයින් අතරද ජනප්‍රිය චරිතයකි.

### දොස්තර කවින්ද ජයවර්ධන



**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 41**

වැලිගම්පිටිය මීසමේ ක්‍රියාකාරීව කටයුතු කළ ස්වර්ගස්ථ දොස්තර ජයලත් ජයවර්ධනයන්ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා ය. වැලිගම්පිටිය මීසම හා සමීප සම්බන්ධතාවයක් ඇති මොහු සිය පියා සමඟ එක්ව මරුද මඩු සිද්ධස්ථානයේ කටයුතු වලදී සමීපව කටයුතු කළේය. කතෝලික ජනතාව වෙනුවෙන් කතෝලිකයකු හැටියට තම වගකීම් හඳුනාගෙන කතෝලිකයන්ට යුතුකම් ඉටුකිරීමට සැදී පැහැදී සිටී. වැඩබලන සංවිධායක ධූරයක්ද මෙවර පක්ෂය තුළ හිමිවී ඇත.

### යූ. ජෝර්ජ් පෙරේරා



**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 15**

පැලියගොඩ (පිලපිටිය) මීසම් වාසී බැතිමත් කතෝලිකයෙකි. තරුණ සමිති සාමාජිකයෙකි. ප්‍රාදේශීය සභා මංත්‍රීවරයකු හා බස්නාහිර පළාත් සභාවේ විපක්ෂ ප්‍රධාන සංවිධායක ලෙස වසර 23 කට වැඩි කාලයක් කටයුතු කර ඇති අතර කිතුනු ලීලාව තුළ ඔහු ක්‍රියාකාරී දේශපාලනය පවත්වාගෙන යයි. මහර එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායක ධූරය උසුලයි. පරම්පරා තුනක් තුළ විඩිමත්ව දේශපාලනයේ නියැලී අත්දැකීම් ඇති කැළණියේ වැදගත් කතෝලික පරපුරක පුරුකකි.

### ශ්‍රීනාත් සුදේශ් මහේන්ද්‍ර පෙරේරා



**- ගම්පහ දිස්ත්‍රික්කය**

**- මනාප අංකය 28**

තුඩැල්ල මීසමේ කතෝලික බැතිමතෙකි. සිය පියා වූ ජෝශප් මයිකල් පෙරේරා මහතාගේ අඩිපාරේ යමින් දේශපාලනයට පිවිසි මේ මහතා බස්නාහිර පළාත් සභාවේ හිටපු මංත්‍රීවරයෙකි. දහම් ගුරු භවතුන් 200 කට ශුද්ධවූ බයිබලයේ පිටපත් බෙදා දුන් අතර සදහම් දැක්ම සංකල්පය යටතේ සමාජ සත්කාරක වැඩකටයුතු රැසක් ඉටු කළේය. ප්‍රදේශයේ මීසම් සේවක පියවරුන් හා අත්වැල් බැඳගනිමින් දෙව්මැඳුරුවල අවශ්‍යතා වලට ප්‍රතිපාදන ලබා දීමට ද උත්සුක වී සිටී.

# වදින කතෝලික අපේක්ෂකයෝ කොටසක්

ි මේ. කතෝලික ආධ්‍යාත්මය තුළ අවංක, හරයාත්මක
ක නොකරමු. ශ්‍රී ලාංකීය දේශපාලන අඹරේ හෙට දවසේ

**විස්තර සැපයුවේ**
**ජෝ. සංගපාලආරච්චි, තියබෝල්ඩ් සමරතුංග, ඩික්සන් ඇන්ටනි, රංජිත් ලොකුපෝතාගම, රනිල් රාජපක්ෂ**

## රා



ැතිමතෙකි.
ු කර ඇති
සංවර්ධන
සුබ සාධක
න්නට ඇප
ු දරුවන්,
පුරවැසියන්
මට අතහිත
දෙන්නෙකි.

## ජානක සූරියබණ්ඩාර

**- ගම්පහ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 24**



කිරිමැටියාගාර මීසමේ කුරුකුලාවේ උපන් ජානක සූරියබණ්ඩාර මහතා කතෝලික දේවස්ථාන වලට ඒ ඒ අමාත්‍යාංශ වලින් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කර ඇත. 1991 සිට ක්‍රියාකාරී දේශපාලනයේ නියැලෙමින් වත්තල ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක, සභාපති ලෙසත්, පළාත් සභා මන්ත්‍රීවරයකු ලෙසත් සේවය කර ඇත. විවිධ ප්‍රජා සත්කාර සේවාවන්හි නියැලෙයි.

## ශිරන්ත අමරසේකර

**- ගම්පහ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 4**



හපුගොඩ මීසම් වාසී බැතිමත් කතෝලික තරුණයකු වූ ඔහු මීසම් ධර්මසේවා සභාවේ නියෝජිතයකු මෙන්ම නොවාන මූලිකයකු ද විය. 1991 දී ජා-ඇල ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක ධුරයට පත් විය. පසුව දෙව්මැඳුරු ගණනාවකට පොදු අරමුදලෙන් උදව් කර ඇති අතර දහම් පාසල් සඳහා ද ආධාර කර තිබේ. “කිතුනු මඟට සවියක්” යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දෙව්මැඳුරු සංවර්ධනයට ආධාර කර අවශ්‍ය දෙව්මැඳුරු වලට ප්‍රතිසංස්කරණ ආධාර ලබා දීමට මූලිකත්වය ගෙන කටයුතු කර ඇත.

## රොයිස් විජිත ප්‍රනාන්දු

**- ගම්පහ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 20**



රොයිස් විජිත ප්‍රනාන්දු මීගමුවේ උපන් කතෝලික බැතිමතෙකි. කුඩා කල සිට ක්‍රියාකාරීව සමාජ කටයුතු වෙනුවෙන් කැපවී සිටි ඔහු ආරක්ෂක අංශ වලට කැපවී කලක් තම සේවය මුදා හල අයෙකි. මීගමුව මහ නගර සභාවට කිහිපවරක්ම තේරී පත් වූ ඔහු මීගමුව නගර සභා පාලනයේ විපක්ෂ ධුරය ද හොබවා ඇත.

මෙවර බස්නාහිර පළාත් සභාවට ගම්පහ දිස්ත්‍රික්කයෙන් තරග වදින ඔහු වර්තමානයේ දී මීගමුව ආසනයේ එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායක ධුරය උසුලනු ලබයි. ජනතා ප්‍රශ්න හමුවේ එහි විසඳුම් සඳහා දක්වන ධෛර්යවත් බව නිසා අභියෝග රැසකට මුහුණ දුන් අයකු ලෙස තරුණයන් අතර ජනප්‍රිය චරිතයකි.

## ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ කතෝලික අපේක්ෂකයෝ

## සීසර් රණවීර

**- කොළඹ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 42**



නිරිපොල මීසමේ උපන් බැතිමත් කතෝලිකයකු වූ සීසර් රණවීර මහතා පුරා 40 වසරක් ශ්‍රී ලංකා පොලීසියේ අවංක හා කැපවූ සේවාවකින් විශ්‍රාම ලැබුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයකු ලෙසය. ත්‍රස්තවාදීන්ගේ රහස් අනාවරණය කර ගැනීමේ ශූරයකු වන ඔහු එක්සත් ජාතීන්ගේ සාම හමුදාවේ සේවය කර ජගත් පැසසුම් ලබා ඇත. සිය ජීවිතය තුළින් දහමට සාක්ෂි දැරූ ඔහු සෞභාග්‍යවත් රටක් ගොඩනැගීමට පෙරට විත් තිබේ.

## හෙස්කත් පීටර් කුරුප්පු

**- ගම්පහ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 42**



පමුණුගම මීසමේ බැතිමත් කතෝලිකයකු වූ හෙස්කත් පීටර් කුරුප්පු මහතා ගණකාධිකාරවරයකු හා සැළසුම් නිළධාරියකු ලෙස ස්වකීය වෘත්තීය ජීවිතය ගත කළේය. විසෙන්ති පාවුලා දයා සේවාව තුළ ක්‍රියාකාරී මූලිකයකු වන ඒ මහතා සපුගස්කන්ද එම ශාඛාවේ භාණ්ඩාගාරිකය. කතෝලික අධ්‍යාපනය තුළින් සිය දිවිය නිසි මං ගන්වා ගත් ඒ මහතා සිය දේශපාලන ගමන් මඟ ද කිතුනු කැඳවීම තුළ සාක්ෂාත් කර ගන්නට අදිටන් කරගෙන සිටී.

## නිවන්ත මැන්ඩිස්

**- ගම්පහ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 10**



වත්තල මීසම් පුත්‍රයකු වන නිවන්ත මැන්ඩිස් වත්තල සා. ආනා දේවස්ථාන මරිය හමුදා ප්‍රසීඩියමේ සාමාජිකත්වය ලත් මරිය භටයෙකි. මෘදුකාංග අලෙවි කළමනාකරුවකු ලෙස වෘත්තියේ නියැලෙන නිවන්ත, දේශපාලනය තුළින් යහපත් ලෝකයක් උදෙසා ඇප කැපවීමට අදිටන් කර සිටී.

## එච්. නිහාල් ඇන්ටනි සිල්වා

**- ගම්පහ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 07**



හල්පේ මීසමේ බැතිමත් කතෝලිකයකු වන නිහාල් ඇන්ටනි සිල්වා සිය කතෝලික පන්නරය තුළින් සමාජය තුළ සාක්ෂි දැරීම සිය කැඳවීම ලෙස තේරුම් ගෙන සිටී. ගමේ පල්ලිය හා බැඳි සියලු කටයුතු වලදී උරෙනුර ගැටී කටයුතු කරන්නට උත්සුක වූ ඒ මහතා වඩාත් යහපත් සමාජයක් ගොඩනැගීමට උර දෙන්නට සැදී පැහැදී සිටී.

## ටෙනිසන් ප්‍රනාන්දු

**- ගම්පහ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 19**



ජා-ඇල මීසමේ උපත ලැබූ කතෝලිකයකු වන ටෙනිසන් ප්‍රනාන්දු මහතා උගත්, බුද්ධිමත් විශිෂ්ට පරිපාලකයෙකි. 1985 දී දේශපාලනයට සම්බන්ධ වූ ඒ මහතා වෘත්තීය සමිති කටයුතුවල නායකත්වය ගනිමින් කම්කරු පංතිය හා අත්වැල් බැඳ ගත්තේ ය. වංචාවෙන්, දූෂණයෙන් තොර යුක්තිගරුක හා සාධාරණ සාමාජයක් ගොඩනැඟීමට ඔහු අධිෂ්ඨාන කරගෙන සිටී.

## සම්පත් ප්‍රියංකර පෙරේරා

**- ගම්පහ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 39**



වත්තල මීසමේ උපන් බැතිමත් කතෝලික තරුණයකු වන සම්පත් ප්‍රියංකර පෙරේරා වත්තල ධර්මදූත ළමා සමාජයේ සාමාජිකයෙකි. ධර්මදූතවරය සඳහා ලත් පුහුණුවෙන් පෝෂණය වූ ඔහු දේශපාලනය ඔස්සේ වඩාත් යහපත් ලෝකයක් ගොඩනඟන්නට ඉලක්ක කරගෙන සිටී.

## මාග්‍රට් රෝස් ප්‍රනාන්දු

**- ගම්පහ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 05**



තෝප්පුව මීසමේ උපත ලැබූ මුරුතාන දෙව්මැදුර ට අයත් රෝස් ප්‍රනාන්දු මහත්මිය දහම් පාසල් අධ්‍යාපනය ලබා දහම් පාසලේ දහම් ගුරුවරියක ලෙස ද කටයුතු කළාය. නීතීඥවරියක ලෙස කටයුතු කරමින් කතෝලික දහමට එරෙහි බලවේග මැඩ පැවැත්වීමට නොබියව ඉදිරිපත් වන්නීය. ස්වකීය පළාත් සභා ප්‍රතිපාදන දේවස්ථාන ප්‍රතිසංස්කරණ කටයුතු වලට ද, දහම් පාසල් සංවර්ධනයට ද යොදවා ඇත. කතෝලික දහමින් පන්නරය ලබා දේශපාලනයට පිවිස සිටින ඈය සමාජය යහපත් මිනිසුන්ගේ තෝතැන්නක් කිරීමට අදිටන් කරගෙන සිටින්නීය. කිතුනු මඟට සවියක් යටතේ පළාතේ දේවස්ථාන රැසකට උපකාර කර ඇති ඈය එය අඛණ්ඩව ඉදිරියට රැගෙන යන්නට ද බලාපොරොත්තු වන්නීය.

## ජනතා විමුක්ති පෙරමුණේ කතෝලික අපේක්ෂකයෝ

## එස්. කේ. ඩී. ජූඩ් ක්‍රිස්ටෝපර්


**- ගම්පහ දිස්ත්‍රික්කය**
**- මනාප අංකය 11**



බෝපිටිය මීසමේ කතෝලිකයකු වන ජූඩ් ක්‍රිස්ටෝපර් මහතා රජයේ මුද්‍රණාලයේ එක්සත් කිතුනු සංගමයේ සභාපති වේ. පාස්කු හා නත්තල් සමයන්හි මහරගම පිළිකා රෝහල, බොරැල්ල ළමා රෝහලට සත්කාර ලබා දෙමින් ද, නත්තල් සුපැතුම් පත්, ගීතිකා පොත්, යාච්ඤා පොත් මුද්‍රණයට දිරි දෙයි. දහම් පාසල් මෙන්ම පැවිදි සොයුරියන්ගේ ළදරු පාසල් වලට පක්ෂයේ ප්‍රතිපාදන වලින් ආධාර ලබා දෙයි.

## සංග්‍රහය

## ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ මිතුරාණෝය



**කර්තෘ - ගරු පෝල් ඕ සුලිවන් පියතුමා**
**සිංහල පරිවර්තනය - ජූඩ් රවීන්ද්‍ර විනයසිරි පෙරේරා**
**නොමිලේ බෙදාහැරීම පිණිසයි**

ශුද්ධවූ ත්‍රිත්වය තුළ තෙවන තැනැන්වහන්සේ වන ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳව නූතන සමාජය තුළ පවතින නොතිත් උනන්දුව තව තවත් කුළු ගන්වන්නට ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ මිතුරාණෝය' යන ග්‍රන්ථය හේතුවනු ඇතැයි පවසතොත් නිවැරැදිය.

ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳව දැනුම වර්ධනය කර ගැනීමටත්, උන්වහන්සේ තුළ ජීවත් වෙමින් ශුද්ධාත්ම දීමනා නොමසුරුව ලබාගැනීමටත් සතුටු සියලු කතෝලිකයන්ට මේ පොත් පිංච අමිල නිධානයකි. නොමිලේ බෙදා හරිනු ලබන මේ පොත ලබාග ැනීමට 9"x6" ප්‍රමාණයේ කවරයක් සමග රුපියල් 10/= වටිනාකමැති මුද්දරයක් ජූඩ් රවීන්ද්‍ර විනයසිරි පෙරේරා, අංක 06, මොරගොඩ, ගම්පහ ලිපිනයට එවන්නැයි ඒ මහතා විශේෂයෙන් ඉල්ලා සිටී.

**- මෛත්‍රී**

## ඇසුණු නොඇසුණු

**කර්තෘ - ගරු ශිරාන් චාමිකර පියතුමා**




තම සමිඳු මිදි උයනේ සේවාවට දෙවසරක් සපිරෙද්දී දෙවන නිර්මාණ ග්‍රන්ථයච එළිදැක්වීමට ගරු ශිරාන් චාමික පියතුමා සමත්ව සිටී. වෙනස නොසොයා වෙනස් වෙන්න යන තේමාව සමගින් මෙම කවි පොතේ විවිධ තේමාවන් යටතේ නිර්මාණ 30 ක් අන්තර්ගතය. වෙනස් ආකාරයේ පිටු වැසුම් සිත්තමකින් හැඩ වූ මෙහි පෙරවදන ලියු ප්‍රදීපය ලේඛක මහචාර්ය ඇන්ටන් මීමන මහතාගේ වටිනා අදහස් සමගින් ගරු පියතුමන්ගේ හා ප්‍රවීන තරුණ විද්වතුන්ගේ කෙටි සටහන්ද අන්තර්ගත කිරීම ග්‍රන්ථයට ආලෝකයකි.

තම අත්දැකීම්, අත්විඳීම්, සමාජය පිළිබඳව යථාර්ථය වෙනත් අයෙක් නොදකින අයුරින් දැකීම එය විඳිම නිර්මාණ කරුවකු තුළ තිබිය යුතු විශේෂත්වයකි. ගරු ශිරාන් පියතුමන්ගේ පරිකල්පනා ශක්තියේ විශිෂ්ටත්වයට මේ ග්‍රන්ථය සාක්ෂියකි. මෙතුමන් ගැඹුරු දේ සරලව වටහාදීමට ගන්න උත්සහයද සාර්ථක බැව් කිව යුතුය. මෙහි එන නිර්මාණයන් සියල්ලම මම රසවින්දෙමි. මීට පෙර නිකුත් කළ "දුටු නොදුටු" ග්‍රන්ථයට වඩා මෙවර ග්‍රන්ථය සාර්ථකය.

"අප ජීවිතය තුළ නොඇසුණු සහ නොඇසෙන දෑ බොහෝය. ඇසුණු හා ඇසෙන දෑ අල්පය. නොඇසෙනවා යනු නොතිබෙනවා නොවෙයි. ඇසෙන දේ නොඅසන අය අතර, නොඇසෙන දේ අසන අය ඇසෙන දෙයට වඩා යමක් අසන්නට වෙරදරයි" යනුවෙන් පෙර වදනේ ගරු පියතුමන් සඳහන් කරයි. ඇත්තටම පොතේ නම මෙහෙම ඇමුයේ ඇයි දැයි මගේ හිතේ තිබුණු කුකුසද මෙය කියවීමෙන් නැති වුණි.

**කුමර නයනජිත්**

## අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත

**කර්තෘ - ගරු හෙන්රි සිල්වා පියතුමා**
**මිළ - රු. 30/=**




කොළඹ අගරදගුරු පදවි බයිබල් කොමිසම මගින් ප්‍රකාශයට පත්කරනු ලබන පොත් මාලාවේ 7 වන්න දැන් නිකුත්වී තිබේ. අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත තේමාකර ගනිමින් බයිබල් විශාරද ගරු හෙන්රි සිල්වා පියතුමා මේ අනගි පොත් පිංච සම්පාදනය කර තිබේ.

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රාවකයන්ගේ දූත මෙහෙවර සම්බන්ධ ක්‍රියාකාරකම්ද යම් යම් සිදුවීම්ද විශ්වාසය තුළ පිහිටා ගබඩා කළ දහම් පුස්තකයකි. විශේෂයෙන් කතෝලික සභාව සියළු බාධක හා අභියෝග මැද දැඩි විශ්වාසයෙන් හා කැපවීමෙන් යුතුව නිර්භීත භාවයෙන් යුතුව දූත කාර්ය ඉටුකිරීමේ වගකීම පහදා දෙනුයේ ක්‍රියා පොතයි.

මේ ග්‍රන්ථය ඇසුරු කර ගනිමින් මාතෘකා හතරක් ඔස්සේ කතු පියතුමා දක්වන කරුණු ඉතා සරලය. පැහැදිලිය. සුගම හා ව්‍යක්ත බස් වහරත්, සරලව කරුණු ඉදිරිපත් කිරීමත් හේතුකොට ගෙන මේ පොත් පිංච ඕනෑම අයකුට කියවා පහසුවෙන් තේරුම් ගත හැකිය. කතු පියතුමාට අපෙන් සුපැතුම්



*හංවැල්ල මීසමේ යට්ටෝවිට ඇග්නස් විජේතුංග මහත්මියගේ දෙවන කෘතිය වන 'පියවර' නිර්මාණ සංග්‍රහය පසුගියදා යට්ටෝවිට දේවස්ථාන රැස්වීම් ශාලාවේදී නැගෙනහිර කොළඹ කලාපිය ධර්මෝපදේශ අධ්‍යක්ෂ ගරු මංජුල නිරෝෂන් පියතුමාට පිළිගැන්වූ අයුරු. මෙම අවස්ථාවට හංවැල්ල මීසම් සේවක ගරු ගියෝම් නෝනිස් පියතුමා සුරනිමල රාජපක්ෂ මහතා ඇතුළු පිරිසක් සහභාගි වූහ.*

**- ඇන්තනි හෙට්ටිආරච්චි**

## ෆිලීෂන් අබයකෝන්ගේ සුබස 260

## අරණ

වන, අටවි (අඩවි), අරණ්‍ය සමානාර්ථයි. සමන්/සිරිපා අඩවිය නම් සමනල කඳුබඩ වනයයි. කලාප වන නිලධාරියාට අඩවි වන නිලධාරි කීමේ තේරුමක් නැත. වල, කැලය, හිමය, බැද්ද වනයට වැහැරේ. කැලයට කියන දමිළ කාඩු සිංහලට කඩුව වී යක්කඩුව පරකඩුව ලෙස ගම් රැසකි. කව් සිළුමිණෙහි ඇති 'දඩ' වනයට අප්‍රකට වචනයකි. එහෙත් දඩ තවමත් දඩාවත, දඩමීමා, දඩයම ආදියේ රැකී පවතී. භරත-භාරත, ද්‍රවිඩ-ද්‍රාවිඩ, මධු-මාධව, මනු-මානව මෙන් අරණ්‍ය ආරණ්‍ය වී කැලයට අයිති, කැලයේ තිබෙන, කැලෑබද තේරුම් දෙයි. ආරණ්‍ය සේනාසනය නම් වනගත යෝගාවචර වාසයකි. අරණ්‍යවාසී, වනවාසී සමානයි.

අරණ්‍යය කෙරෙන් බිහිවන හෙළ වදන වූ අරණ මූර්ධජ 'ණ' යන්න විය යුතුද? පදාන්තයේ මූර්ධජ 'ණ' ඇති මාතෘපදවල තද්භව රූපය හලන්ත වේ නම් ඒවා දන්තජ 'න්' විය යුතුය. ඒ අනුව ඒක වචනය 'න' යන්න ගත යුතුය. පාෂාණ - සඳකඩ - පහන්, කර්ණ - කන්, වර්ණ - වන්. ශ්‍රවණ - සවන්, පරිවේණ - පිරි - වෙන්, පුණ්‍ය - පින්, රේණු - රොන් වගයෙනි. 1873 මුද්‍රිත ශුද්ධ සිංහල අකාරාදියක අරන නිදොස්ව දැක්වේ. අරන් අහර නම් ගෙඩි, කොළ, අල ආදියයි. අරන්දර, අරන්තලාව ගම් දෙකකි.

අරණ, අරුණ, වරුණ, කිරණ, දෙරණ, සරණ, සෙවණ බඳු වචන මාධ්‍ය විශේෂාංග නම්වල ප්‍රියතම විලාසිතාවකි. හෝ පලු අරණ අශෝක වනයයි. සූරිය අරණ සූරිය ගසින් ගහණ වනයකි. අනිත් අරන්වල අරණ කවර අරුතක් ගෙන ඇතිදැයි නොදැනේ. අරණ වනයට තවත් වචනයක් මිස වෙන කිසිත් නොවේ. හලේ අරණට උරග බියකරු යයි කාව්‍යශේඛරයේ පවසන්නේ භයංකර සර්පයාව කැලේට දැම්මායි කීමටය.

අතීත කව්පොතකත්, වත්මන් ගීතයකත් අරණ කැලයම බව පෙන්වයි.


මඟ දෙපස අරණේ - සිරි නොතැඳ ගොස් එකෙණේ
වැජඹෙන එරජ කෙසරිඳු ලක ගිරි අරණ
ඔදැතිව කෙලෙස ඇවිදිති රුපු රජ වරණ

*(තිසර සන්දේශය)*

මේ ප්‍රථම වසන්තයයි
දිවි අරණේ මධුමල් පිපෙනා

## ශු. ඌගෝ මුනි ඉතිහාසය හා දෙව්මැඳුරු ඉතිහාසය

**කර්තෘ - ලහිරු ලක්ෂාන් ප්‍රනාන්දු**
**මිළ - රු. 250/=**




ළමා ප්‍රදීපයෙන් ලේඛන කලාවට පිවිසි කොහුවල සා. ජෝසප් නි.ම.නි දෙව්සත්හලේ ඉගෙනුම ලබන ලහිරු ලක්ෂාන් ප්‍රනාන්දු නිෂ්පාදනය හා අධ්‍යක්ෂණය කළ " ශු. ඌගෝ මුනි ඉතිහාසය හා දෙව්මැඳුරු ඉතිහාසය" වාර්තා චිත්‍රපටය ඉතා අගනේය. මීට ශු. ඌගෝ මුනිඳුන්ගේ ජීවිත කතාව සිදුවූ ප්‍රාතිහාර්යයන් මෙන්ම බුරුල්ලපිටිය මීසමේ වසර 163 ක ඉතිහාසයද අන්තර්ගතය.

ඉතා කැපවීමෙන් යුතුව විශේෂයෙන් කාලය සොයාග නිමින් කළ මේ වාර්තා චිත්‍රපටය (පුංචි අඩුපාඩුකම් තිබුණද) හොඳ නිර්මාණයක් බිහි කිරීමට ලහිරු දැක්වූ උනන්දුව අභියෝගයන්ට මුහුණ දුන් ආකාරය අගයමු. පූජක පුහුණුව ලබන ඔබට මෙය ඉදිරියට දිරියක්ම වේවා'යි පතමු. මෙම වාර්තා චිත්‍රපටය සාර්ථක කර ගැනීමට තිරය පිටුපස සිට දායක වූ සැම සියලු දෙනාගේම සේවය අපි අගයමු. ලහිරු ලක්ෂාන් ඔබට ප්‍රදීපය සුබාසිංසන!

## රැකදෙනු මැනවි සදා

කිතුනු දිවියෙ වටිනාකම් දුනි අපට
මල්වන් දරු කැලගෙ රැකවරණය පිහිට
ආදරයයි පන්නුවෙ නිරතුරු සැමට
අති උත්තමයි ඔබ සේවය විදහලට

සුදතුම් වරම් නිරතුරු ඔබ හට ලැබිලා
නොනිමි අමිල සේවය කෙරුමට සැමදා
අයදිමු වරම් දෙවියන්ගෙන් සිරස නමා
ආදර පියතුමා රැකදෙනු මැනවි සදා

**ආචාර්ය මණ්ඩලය**

## දේව විශ්වාසයෙන් වසන්වන තාරුණ්‍ය ඇතුගල්පුර පදවි කතෝලික තරුණ සංගමය

**සංස්කාරක - වර්නන් ශ්‍රේෂන්**





දේව විශ්වාසයෙන් පහන් වන තාරුණ්‍යය තේමාව යටතේ ඇතුගල්පුර පදවි කතෝලික තරුණ සංගමය නිකුත් කළ සඟරාවේ දෙවන කලාපය නිකුත් වී ඇත.

පදවියේ තරුණ පිරිසගේ හරවත්වූ ලිපි, කාව්‍ය නිර්මාණ සමගින් පදවි තරුණ සංගමයේ තොරතුරුද සමගින් හැඩවැඩ වූ මෙම කලාපය පළමු කලාපයට වඩා පියවර ගණනක් ඉදිරියට තබා ඇති බැව් පෙනේ. පිටකවරය ඉතා අර්ථාන්විතය. ඉතා අගනේය.

භා. ජුසේ කනිටු දෙව්සත්හලේ කසුන් මධුෂංක සිසුවාගේ හැකියාවන් අගයමු. ඇතුගල්පුර පදවි කතෝලික තරුණ සංගමයට ප්‍රදීපය සුබාසිරි!

## 'හෙළදිවේ දහම් ගිනි සිළුව' කෘතිය පිළිගැන්වීම



කොළඹ අගරදගුරු පදවි ජුසේවාස් පිය සැමරුම හැඳල වැල්ලපල්ලිය කාර්මෙල් දේවස්ථානයේදී අගරදගුරුපදවි සහායක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් ජුසේ වාස් පිය කමිටු අධ්‍යක්ෂ දකුණු කලාපීය නාහිමි අතිගරු ඇන්තනී ප්‍රනාන්දුපුල්ලේ පියතුමන්ගේ සහ වැල්ල පල්ලිය මීසම් සේවක ගරු ෆීලික්ස් මල්ලවාරච්චි පියතුමන්ගේ සහභාගීත්වයෙන් සිදුවිය. මෙහිදී කතෝලික ගුරුවරයකු, ලේඛකයකු හා ජනමාධ්‍යවේදියකු වන අසේල දසනායක විසින් ජුසේ වාස් පියතුමන් සම්බන්ධව ගවේෂණය කොට රචනා කරන ලද 'හෙළදිවේ දහම් ගිනි සිළුව' කෘතිය රදගුරු හිමිපාණන්ට පිළිගන්වූ අයුරු.

**- තිළිණ අලහකෝන්**

## දෙව්ඳේ සමිඳේ මාර්තු 15 දා නිකුත්වේ

කිතුනු ගායකයකු වන කුඩා පයාගල එඩ්වඩ් අයිවන් පෙරේරාගේ තෙවැනි සංයුක්ත තැටිය "දෙව්ඳේ සමිඳේ" එළිදැක්වීම 2014 මාර්තු මස 15 වන සෙනසුරාදා දින ප.ව. 3.30 ට කළුතර ජුබිලි ශාලාවේදී ජනසන්නිවේදන ජාතික අධ්‍යක්ෂ ගරු බෙනඩික් ජෝශප් පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ.

ගීතිකා 16 ක් අඩංගු මෙම සංයුක්ත තැටිය ක්ලැරේෂියානු නිකායික නිෂ්පාදනයකි. එඩ්වඩ් අයිවන් මහතාගේ පද රචනයෙන්, තනු නිර්මාණයන්ගෙන් සමන්විත මෙහි ගරු ශ්‍රියානන්ද ප්‍රනාන්දු, සමන් මැක්ෂිමස්, සමීර ෆොන්සේකා (නි.ම.නි) පියතුමන්ද, අයිවෝ ඩෙනිස්, චන්දන ලියනආරච්චි හා සොහන් පෙරේරා ඇතුළු පිරිසක්ද ගායනයෙන් එක්වෙති.

# කාදිනල් වරුන්ගේ සුවිශේෂි හමුවක් පැවැත්විනි




ශුද්ධාසනයේ ප්‍රකාශක ගරු පෙඩ්රිකා ලොම්බාර්ඩි පියතුමා විසින් ජාත්‍යන්තර මාධ්‍යයන් වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් පවසා ඇත්තේ, 'පවුල' තේමා කොටගත් කාදිනල් හිමිවරුන්ගේ සුවිශේෂි හමුව පෙබරවාරි මස 21 වැනිදා අවසන් වූ බවයි.

පවුල පිළිබඳ එම සුවිශේෂි සාකච්ඡාවට කාදිනල් හිමිවරුන් 69 දෙනෙක් සහභාගි වූහ. ඔවුහු සියළුදෙනා, පවුල හා අදාළ වන්නාවූ ඒ ඒ කරුණු කාරණා කේන්ද්‍ර කොට ගත් තේමාවක් යටතේ ගැඹුරු හා හද පුබුදුවාලන කරුණු ඉදිරිපත් කරනු ලැබූ බැව්, ශුද්ධාසන ප්‍රකාශක තුමා විසින් තවදුරටත් ප්‍රකාශ කරනු ලැබීය.

කාදිනල් වරුන්ගේ එම සුවිශේෂි හමුව අමතමින් ප්‍රැන්සිස් සුදෙතුම් පියාණන් විසින් අවධාරණය කරනු ලැබුවේ, පවුල පිළිබඳ දේව වචනය තුළ ජීවත් වීමට සහා මාතාව විසින් අප නිරන්තරයෙන් මෙහෙයවනු ලබන බවයි. පවුල තුළ කැරෙන ජීවිත ගමනේදී, කාදිනල් හිමිවරුන් ද, ඔවුන් සමග ගමන් ගන්නා බැව් එතුමා ප්‍රකාශ කළ සේක. පවුල් ගමන වෙනුවෙන් නිරන්තර යාච්ඤාවේ යෙදෙනා ලෙසට ද එතුමා ඉල්ලීමක් කළ සේක. පවුල කේන්ද්‍ර කොටගත් එම කාදිනල් හිමිවරුන්ගේ හමුවේ පූර්ණ වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ යයි අපේක්ෂිතය.

[illegible] මෙලොව එළිය දැකුමට නියමිතව සිටි දරුවා දරුනු මොලේ ආබාධයකින් පෙළෙනා බැවින් කලලය ගබ්සා කරන්නැයි විශේෂඥ වෛද්‍යවරුන් කංඩායමක් විසින් වචනයෙන් හා ලේඛණයෙන් ස්ථිර කොට තිබිණි. දරුවාගේ දෙමාපියන් ද, පවුලේ ඥාති හා මිත්‍ර පීරිස් ද පූර්ණ ඇදැහිල්ලෙන්, VI වැනි පාවුළු සසුන් පියාගේ මැදිහත් බවින් ඉල්ලා සිටියේ දරුවාගේ මොලේ ව්‍යාධිය සම්පූර්ණයෙන් මැ සුව කොට ඔහු නිරෝගි දරුවෙක් ලෙසින් බිහිකර දෙන ලෙසය.

එලෙස VI වැනි පාවුළු සසුන් පියාගේ මැදිහත් බවින් දරුවා කිසිදු මොලේ ආබාධයක් රහිතව, නිරෝගීව උපත ලැබුවේය. දරුවාගේ උපත පරික්ෂාවෙන් පසුව, අදාළ වෛද්‍ය මංඩලය විසින් ස්ථිර කරනු ලැබුවේ, මාරාන්තික මොලේ ආබාධයක්




වැලඳ සිටි එම දරුවා, කිසිදු ආබාධයකින් තොරව උපත ලබා ඇති බවයි. පසුගිය සතියේ, දේව ධාර්මික පිරිසක් විසින්, දරුවාගේ පූර්ණ සුවය, VI වැනි පාවුළු ශුද්ධෝත්තම පියාගේ මැදිහත් කමින් සිදුවී ඇතැයි යනුවෙන් ස්ථිර කරනු ලැබ ඇත. ඊලඟ පියවර වශයෙන් සාන්තුවරයන් බැව් ප්‍රකාශ කැරෙනා මංඩලය විසින් ප්‍රාතිහාර්යයක් ලෙසින් ස්ථිර කරනු ලැබ, ප්‍රැන්සිස් සුදෙතුම් පිය අනුමතියෙන්, මෙම ප්‍රාතිහාර්ය ශුද්ධාසනය විසින් ප්‍රකාශ කරනු ලබයි. ඒ අනුව VI වැනි පාවුළු සසුන් පියා ශුද්ධවරයට ඔසවනු ලැබීම උදාවනු ඇත.

## යුක්‍රේනයේ කිතුනු සභාව ආණ්ඩු විරෝධතා කරුවන්ට සහාය දෙයි

බලාපොරොත්තු නොවූ ආකාරයට, යුක්‍රේනයේ ප්‍රධාන කිතුනු සභා තුනක් වන, යුක්‍රේනයේ ග්‍රීක කතෝලික සභාව ද, යුක්‍රේනයේ ඕතොඩොක්ස් සභාව ද, යුක්‍රේනයේ ඕතොඩොක් පත්‍රියාක සභාව ද, විසින් ආණ්ඩුවට එරෙහි විරෝධතා කරුවන්ට සහාය දැක්වීමට සිය ඇදැහිළිවන්තයන් සමග පෙළ ගැසී සිටිති.

සම්ප්‍රදායි ඕතොඩොක්ස් සභාවන්ට අයත් යතිවරුන් පවා ආණ්ඩු විරෝධි ජනතාවන්ට සහාය දක්වමින් මහ මග ප්‍රධාන ස්ථානයන් හී යාච්ඤාවේ නිරතව සිටිනා බැව් ද දක්නට ලැබිණි.

යුක්‍රේනයේ ප්‍රධාන නගරය වන 'කිව්' හී කූඩාරම් ගසා ඇති අතර ඒවායේ සෙවන ලබමින් දිවා රෑ යාච්ඤාවේ යෙදෙන පිරිස් ද වෙති.

එමෙන්මැ විරෝධතා කරුවන්ගේ ඉල්ලීම මත එම කූඩාරම් මත දිව්‍ය යාගයද සිදු කැරෙනා බැව්, කිතුනු පුවත් විසින් වාර්තා කරැත.

## මාක්ස් වාදය බිඳ වැටීමෙන් විමුක්ති දේව ධර්මය පෙරට

පෙබරවාරි මස 26 වැනිදා, වතිකානයේදී, "දුප්පත්තු වෙනුවෙන් දුප්පත්තු" යන විමුක්ති දේව ධර්මය පිළිබඳ ග්‍රන්ථය, ඇදැහිල්ලේ ධර්මය පිළිබඳ ශුද්ධාසන ප්‍රධානියා විසින් හෙළි දක්වනු ලැබීය. මාක්ස් වාදය බිඳ වැටීමත් සමග විමුක්ති දේව ධර්මය පිළිබඳ මෙම ග්‍රන්ථය කාලීන ප්‍රකාශනයක් ලෙසින් හඳුන්වනු ලැබීය.

මෙම "දුප්පත්තු වෙනුවෙන් දුප්පත්තු" යන ග්‍රන්ථයේ කතුවරයා වන්නේ ජේරාඩ් මුලර් කාදිනල් තුමාය. එතුමා විසින්ද පවසනු ලැබ ඇත්තේ සිය ග්‍රන්ථය මාක්ස් වාදී උගැන්වීම් වලට පිළිතුරු දීමක් නොව, කිතු සමාජ දැකුම පිළිබිඹු කිරීමක් පමණක් වන බවයි.

මෙම ග්‍රන්ථයේ පෙර වදන ලබාදී ඇත්තේ, ප්‍රැන්සිස් ශුද්ධොත්තම පියාණන් විසිනි. ග්‍රන්ථය හඳුන්වා දීමේදී කතුවර කාදිනල් තුමාගේ මිතුරකු වන 85 හැවිරිදි ගුස්ථාවෝ ගුඩිටෙරස් පිය තුමා විසින් ද ප්‍රකාශයක් කරනු ලැබීය.

## කරිටාස් හා මහා මංඩලය ඒඩ්ස් පිළිබඳ සම්මන්ත්‍රණයක්

කරිටාස් ජාත්‍යන්තර ආයතනය ද, ඒඩ්ස් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංසදය ද, ජන සහය සහ සංවර්ධනය පිළිබඳ කතෝලික සංවිධානය ද, මෑතදී එකට රැස්ව, ඒඩ්ස් රෝගය වැළඳ ගැන්ම නවතාලීමට ද, ඊට ප්‍රතිකාර ලබා දීම තේමා කොට ගත් ජගත් මට්ටමේ සංවිධානයක් පවත්වාගෙන යාමට ක්‍රියාකරමින් සිටී. පසුගිය සතියේ පැවැති සාකච්ඡා වාරයේදී, නයිජීරියාවේ කාදිනල් ජෝන් ඔනයියෙකාන් තුමා ද ශුද්ධාසනයේ ඇමෙරිකා තානාපති කෙනත් හැකට් මහාතාද, සිය අදහස් දක්වා සිටියෝය.

එහිදී කෙනත් හැකට් තානාපති වරයා මෙලෙසින් ද පැවැසුවේය "එච්. අයි. වී. රෝග යෙන් ජනතාව බේරා ගැන්ම සඳහා ගනු ලබන ක්‍රියාදාමයන් හී ප්‍රගතියක් දක්නට ලැබේ. එනමුත්, පවත්නා අවාසනාවන්ත වාතාවරණයන් ඔස්සේ, ඒඩ්ස් පිළිබඳ ගනු ලබන පියවරයන් හී වර්ධනයක් ඇති කිරීමට අවශ්‍ය වේ. ඒඩ්ස් රෝගය මර්ධනය කිරීම සඳහා වන කිතුනු ඇදැහිල්ලේ සංවිධානය ද, සමස්ත කතෝලික සභාව ද, ඒ ඒ රාජ්‍ය ආයතනයන් ද විසින් ඒකරාශි වී ගනු ලබන ක්‍රියාමාර්ග ඔස්සේ, ඒඩ්ස් රෝගය නැති කර දැමීමේ පියවර ගැනීම කළ හැකි වනු ඇත."

කාදිනල් තුමා විසින් ද පවසනු ලැබුවේ, ඇතැම් දේශයන් හී ඒඩ්ස් රෝගීන් තවමැ සිය ආදර බැතිය හා ප්‍රතිකාර දක්වන පැවිදි සොහොයුරියන් රාශියක් සිටිනා බැව් ද බොහෝ දෙනා නොදන්නා බවයි. එලෙස ලෝ පුරා වෙසෙන ඒඩ්ස් නිවාරණයෙහි යෙදී සිටිනා කිතුනු ආයතනයන්ගේ ද, රාජ්‍ය ආයතනයන්ගේ ද විවිධ ක්‍රියා මාර්ගයන් තුළින් ඒඩ්ස් රෝගය වැලැකීම හා එම රෝගීන් සුවපත් කිරීමේ අතී සාර්ථක මෙහෙවරක් කළ හැකි යයි ජෝන් ඔනයියෙකාන් කාදිනල් තුමා විසින් අවධාරණය කරනු ලැබීය.

## ලිබියා අන්තවාදිහු කිතුනුවන්ට පහර දෙති

ඊජිප්තු ජාතික කිතුනුවන් 7 දෙනෙකු පැහැරගෙන ගොස් මරා දමා ඇතැයි කිතුනු පුවත් වාර්තා කරයි.

මුහම්මාර් ගඩාෆි ලිබියා පාලනයෙන් පන්නා ද ැමීමෙන් පසුව, බලවත් වී ඇති ත්‍රස්ත පිරිස් විසින් තැන් තැන් හී කිතුනුවන් ඝාතනය කරනා බැව් ඇතැම් විට වාර්තා නොවන බැව් ද හෙළි වී ඇත. "කිතුනුවන් මරා දැමීමෙන්, ඔවුන් බලාපොරොත්තු වන්නේ කුමක් දැයි අපැහැදිළි බැව් ගිම්පානි මාර්ටින්එලි රදගුරු තුමන් විසින් කිතුනු පුවත් වෙත වාර්තා කරැත. කිතුනුවන් අතරෙන් ඕතොඩොක්ස් කොප්ටික් කිතුනුවන් වැඩි වශයෙන් ඉලක්ක කොට පහර දෙනු ලබන බැව් ද වාර්තා කැරෙනා අතර, ඊට හේතු වන්නේ කුමන කරුණක් දැයි හෙළි නොදැක්වී ඇති බැව් රදගුරු හිමිපාණන් විසින් තව දුරටත් ප්‍රකාශ කරනු ලැබ ඇත.

## ලෝකයේ වයස්ගත පැවිදි සොහොයුරිය උපන් දිනය සමරයි

පෙබරවාරි මස 10 වැනිදා, ඉතාලි ජාතික කැන්ඩිඩා බෙල්ලෝති, නම් පැවිදි සොහොයුරිය, සිය 107 වෙනි උපන් දිනය. වතිකානයේදී පැවැත්වූවාය. එතුමිය, ලෝකයේ ජීවත්වන වැඩිම වයස්ගත පැවිදි සොහොයුරිය යයි විශ්වාස කැරේ.

ඇගේ දීර්ඝායු භාවය කෙසේ සිදුවන්නේ දැයි ඇසූ විට, ඈ විසින් පවසනු ලැබුවේ, "සමිඳුන් තුළ ප්‍රීතියෙන් ජීවත්වීම" එහි රහස බවයි.

එතුමිය, ඉතාලියේ වෙරෝනිකා හී ජීවත් වෙයි; ඈ වයස 80 කට පෙර, 'කැමරියාන්' නම් පැවිදි සොහොයුරියන්ගේ නිකායට ඇතුළුව පොරොන්දු දී ඇත. ඈ වතිකානයේදී තම 107 වැනි උපන් දිනය සැමරීම ආරම්භ කළේ, දිව්‍ය යාගය අත් දැකීමෙනි. ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියා ද එතුමියට සුබ උපන් දිනයක් ප්‍රාර්ථනා කළේ යැදුම් හඬෙනි. එතුමියගේ ජීවිත කාලයේදී, එතුමිය රෝමානු සසුන් පියවරුන් 9 දෙනෙකු හැඳින ගෙන ඇත. එතුමන්ලාගෙන් එතුමිය වඩාත් කැමති කාට දැයි ඇසූවිට ඈ ඊට පිළිතුරක් නොදී නිහඬ වූවා යයි වාර්තා වේ.



## ආගමික ආයතනයන් හී රහස් සටන් කරුවන් එපා

මධ්‍ය අප්‍රිකාවේ රිපබ්ලික් රාජ්‍යයේ කිතුනු හා මුස්ලිම් පල්ලි තුළ රහස් සටන් කරුවන් සඟවා තබමින්, ඔවුන් ලවා සටන් ව්‍යාපාරයන් සඳහා ජනතාව පෙළ ගැස්සීම පවත්නා හෙයින්, එම දුර්දාන්ත ක්‍රියා ආගමික ආයතනයන් තුළ පමණක් නොව අන් කිසිදු ස්ථානයක නොකළ යුතු බවට අවවාද කරමින්, එරටේ කතෝලික රදගුරු හිමිපාණන් ද මුස්ලිම් ආගමික නායක තුමා ද විසින් ප්‍රකාශයක් නිකුත් කරනු ලැබ ඇත.

අගරදගුරු හිමි දියුදෝන් නෂා පලෙන්ගා තුමා ද ඔයුමාර් කොබින් ලමායා තුමාද තව දුරටත් මෙලෙසින් දක්වා සිටිති. "රහස් අවි ආයුධ පැළඳ සිටින්නා වූ සියළු දෙනා ඒවා නිසි බලධාරින්ට බාර දිය යුතුය. කිතුනු හා මුස්ලිම් පල්ලි තුළ රහස් ගත අවි ආයුධ සහිත පුද්ගලයන් වහා නිරායුධ කිරීම කල් නොයා කළ යුතුමය."

මධ්‍ය අප්‍රිකාවේ රිපබ්ලික් රාජ්‍ය පුරා අපරාධ ක්‍රියාදාමයන් හා සොර මැරකම් සීඝ්‍රයෙන් පැතිර යාම වළකාලීමට වහා ක්‍රියා කරන්නැයි එරටේ සිටිනා ජාත්‍යන්තර සාම හමුදාවන්ගෙන් ද, ආගමික නායකයෝ සිය ප්‍රකාශනයෙන් ඉල්ලා සිටිති. පෙර පැවැති සෙලේකා හට පිරිස් වලට, මුස්ලිම් ජන කොටස් සහාය දුන්නේ යයි යන චෝදනාව මත ඔවුන් සොය සොයා මරුමුවට පත් කිරීමේ වැය ම ද වහා නවතා දමනා ලෙසට ද, ආගමික නායකයෝ සැමගෙන් ඉල්ලා සිටිති. මධ්‍ය අප්‍රිකා රිපබ්ලික් රාජ්‍යයේ පවත්නා බෙදීම් තත්ත්වය යටතේ ආගමික හේතුන් මත දේශපාලන අරගලයන් ද නිර්මාණය කිරීමට දරණ උත්සහයන් ද පවත්නා හෙයින්, එම දුර්දාන්ත ප්‍රයත්නයන් ද වහා නවතා දමනා ලෙසට ද ආගමික නායකයෝ මහත් කරුණාවෙන් අයැද සිටිත්.

## රෝගීන්ගේ ආලේපය යහපත් එඬේරා සිහි ගන්වයි



පෙබරවාරි මස 26 වෙනිදා, 50,000 පමණ සහභාගී වු ජන හමුවේදී, ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියා විසින් ඇදැහිළි වන්තයන්ගේ සිත් සතන් රෝගීන්ගේ ආලේපය නමැති සක්‍රමේන්තුව කෙරෙහි යොමු කරවනු ලැබීය.

එතුමා මෙලෙස ද අවධාරණය කළ සේක. "වේදනා හා අසනීප අවස්ථාවන් හිදි අප තනි නොවේ." වේදනා අවස්ථාවන් හිදී යහපත් එඬේරා ක්‍රියා කළ අයුරින්, අපේ වේදනාවන් හිදී ද ක්‍රිස්තුන් වහන්සේ රෝගීන්ගේ ආලේපය තුළින් එලෙස ක්‍රියා කරන බව වැටී සිටි අසරණයට තෙල් ගැල්වීම, මගින් මහා බ්‍රහස්පතින්දා ආසිරි ගන්වනු ලබන තෙල් ආලේපනය ඔස්සේ අප දිරි ගන්වනු ලබයි. අසරණයාට ලබාදෙන එදින ස්ප්‍රීතුව ක්‍රිස්තුන් වහන්සේගේ ආදරයේ සහ දයාවේ සළකුණක් ද වේ.

මෙම රෝගීන්ගේ ආලේපනය නමැති සක්‍රමේන්තුව, අපෝස්තුළු වරුන්ගේ කාලයේ සිට පවත්නා බැව් ද ශුද්ධෝත්තම පියා විසින් අවධාරණය කරනු ලැබීය. ඇතැම් අය සිතනා ආකාරයට රෝගීන්ගේ ආලේපනය සඳහා පූජක වරයකු කැඳවීම අවසන් ක්‍රියාවක් ලෙස සිතිය යුතු නැතැයි ද එතුමා පැවැසුවේය.

මෙම රෝගීන්ගේ ආලේපනය, දරුණු ලෙස රෝගී අවස්ථාවන් හිදී මෙන්මැ වයස අවුරුදු 65 ට වැඩි වැඩිහිටියන් විසින් ද ලබා ගත හැකි බැව් එතුමා විසින් පෙන්වා දෙන ලදී.

බැසිල් ෆොන්සේකා විසිනි

සංවාද මණ්ඩපය

# තවමත් ප්‍රමාද නැත

**පසුගිය සතියෙන්...**

## රදගුරු රායප්පු ජෝශප් භූමිකාව

මේ වන විට මෙරට ජාතික අර්බුදය විසඳා යුක්තිය හා සාමය ස්ථාපිත කිරීමේ කේන්ද්‍රීය සාධකයක් බවට පත්ව ඇත්තේ ජනපති රාජපක්ෂ මහතා හා මන්නාරමේ රදගුරු රායප්පු ජෝශප් හිමිපාණන්ගේ ක්‍රියාකාරිත්වයන් ය. (මෙම දූත මෙහෙවරේ දී දේශීය මෙන්ම විදේශීය දුෂ්ට බලවේගවල දැඩි දෝෂ දර්ශනයට ලක්ව සිටින්නේ මෙම චරිතයන් ය) පැමිණි සියළු අභියෝග වලට ධෛර්යයෙන් මුහුණ දුන් ජනපතිවරයා තමන් සතු බලතල තුළ උතුරු පළාත් සභා මැතිවරණය ප්‍රකාශ කළ ද ඒ වන විටත් උතුරේ දේශපාලන පක්ෂ ස්ථාවරයකට පැමිණ එඩිතරව මහජන ඡන්දයකට මුහුණ දීමට මැලිකමක් දක්වමින් සිටියහ (එහිදී දෙමළ ඩයස් පෝරාවෙන් බලපෑම් තිබුණි).

ඒ අවස්ථාවේ දී සමිඳාණන්ගේ දිව්‍යසි කාර්යයේ යෙදෙන්නකු ලෙසත් පීඩිත ජන කණ්ඩායම් මුහුණ දී සිටින අභාග්‍ය සම්පන්න තත්ත්වය පිළිබඳ මනා වැටහීමක් හා බැඳීමක් ඇති පුද්ගලයකු ලෙසත් මෙරට දෙමළ සමාජය තුළ යුක්තිය සඳහා වන හඬක් නැඟීමට ඉතිරිව සිටින එකම මනුෂ්‍යයා ලෙසත් මන්නාරම රදගුරු රායප්පු ජෝශප් හිමිපාණන් විසින් විවිධ මත දරමින් වෙන් වෙන්ව කටයුතු කරමින් සිටි කණ්ඩායම් එක් ස්ථාවරයකට ගෙන "දෙමළ හඬ" එක් තැන් කිරීමටත් මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව දිවුරුම් දීමේ දී පවා ඇති වූ අර්බුදය නිසි ලෙස කළමනාකරණය කර එම දේශපාලන නායකයන් වැඩි පිරිසක් එක ස්ථාවරයකට ගෙන ඒමත් (උන්වහන්සේ ප්‍රකාශ කරන පරිදි නාස්තිකාර පුත්‍රයන්ද සිටින බව) මෙරට ප්‍රජාතන්ත්‍රවාදය යුක්තිය හා සමාදානය තුළින් සාමයක් ස්ථාපිත කිරීමේ ක්‍රියාදාමය තුළ දේශීය හා විදේශීය බලවේග වලට නිසි පිළිතුරු දීමටත් අපේ කාලේ මේ ශ්‍රේෂ්ඨ ලාංකික පුත්‍රයන් දෙදෙනාට හැකි වීම අප ලද අස්වැසිල්ලකි. ජයග්‍රහණයකි.

## විජයග්‍රහණය

විවිධත්වය තුළ ස්ථාපිතව ඇති මානව සමාජය සෑම කාලවකවානුවලදීම ආර්ථික, සාමාජික හා දේශපාලනිකව විවිධ වූ වෙනස්කම්වලට භාජනය වෙමින් මුළු මානව ශිෂ්ටාචාරය පුරාවටම පැමිණි ගමනක අත්දැකීම් සහිතව මේ වන විට ගෝලීය පවුලක් බවට පත් වී ඇත. එහිදී සෑම සාමාජිකයකුටම පිළිගත හැකි ක්‍රමවේද තුළ එම විශ්ව පවුල පවත්වාගෙන යාමට සෑම විටකම සැබෑ ජන නායකයන් කටයුතු කර ඇත. එම නිසා අප ද ඒ මඟ යමින් කළ යුතුව ඇත්තේ අඩසියවසක් පුරා විසඳා ගැනීමට තිබූ අප ජාතික අර්බුදය විසඳා ගැනීමට විවෘත මනසකින් යුතුව ප්‍රයත්න දැරීමය.

ලෝක ඉතිහාසය තුළ එක් පරම්පරාවක් විසින් ඇති කරනු ලැබූ සෑම අර්බුදයක්ම නිරාකරණය කිරීමට ඉතිහාසය විසින් එම ජාතියේ තවත් පරම්පරාවකට අවස්ථාව ලබා දීම ලෝක ඉතිහාසයේ අපට දැකගත හැකිය. යම් හෙයකින් එම පරම්පරාව තමන් මුහුණ දී ඇති අර්බුදය විසඳා ගැනීම අතහැර දැමුවහොත් ඉතිහාසයේ යළි කිසිම දිනක එම අවස්ථාව තවත් පරම්පරාවකට ලබා ගැනීමට ඉඩ ප්‍රස්තාවක් ඉතිරි නොකරනු ඇත. මන්ද ඇදී ඇදී යන අර්බුදය විසින්ම එම සමස්ත සමාජය සම්පූර්ණයෙන්ම වනසා දමන බැවිනි. එය අපගේ හැඟීමයි. අදහසයි. එම නිසා පරම්පරාවක් ලෙස ඉතිහාසයේ හිමිකරුවන් වන දෙවි සමිඳුන් විසින් අප වෙත පවරා ඇති එම දිව්‍යසි කාර්යය කිරීමට තවමත් ප්‍රමාද නැත. ඒ තුළින් අපට එරෙහි සියළු දුෂ්ට බලවේග පරදවා සෞභාග්‍යවත් ලාංකික ජාතියක් හා දේශයක් ගොඩනැඟීමට අපට ලබා දී ඇති එම උතුම් අවස්ථාව අප විසින් හිමි කර ගත යුතුය.

ඒ සඳහා මෙරට රාජ්‍ය කළ යුතුව ඇත්තේ යටත් විජිතවාදීන්ගෙන් නිදහස ලැබීමත් සමඟ අප දේශය තුළ ඇතිකරවනු ලැබූ භේදය සමතුලිත වන ආකාරයේ දේශපාලනමය සංහිඳියාවක් අදාළ පාර්ශව අතර ගොඩනැඟෙනා ආකාරයේ හා මේ වන විට ජාත්‍යන්තර බලවේග වලට ආයුධයක් වී ඇති කරුණු කාරණා සෑමට පිළිගත හැකි විසඳුම් කරා යමින් යුක්තිය හා සහජීවනය ගොඩනැඟිය හැකි වටපිටාවක් ගොඩනැඟීමයි. ඒ සඳහා කළ යුතුව ඇත්තේ මෙරට දෙමළ දේශපාලන ධාරාවන් මෙන්ම සිවිල් ජනතා සංවිධාන ද ඉල්ලා සිටින යුද්ධය අවසන්ව ඇති වටපිටාවක විගසින් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියකට අවතීර්ණය වීමත් වසර ගණනාවක් තුළ යුධ යාන්ත්‍රණයකට සිර වී සිටින ජනතාව එයින් මුදවා ඔවුන්ටද ප්‍රධාන ධාරාව හා එක් වන්නට ඉඩ සලසාදීමත්ය. එසේම යුධ ජයග්‍රහණ වලදී ඉන්දියාව හා ජගත් සංවිධාන අතර ඇති වූ අවබෝධතා අනුව යුහුසුළුව කටයුතු කරමින් අදාළ පාර්ශව විසින් අප වෙත එල්ල කරන බලපෑම් අවම කරගැනීමය. ජාත්‍යන්තරය කුමක් කීවද යුද්ධයකදී මිය ගිය මිනිසුන් ගැන කථා කරනවාට වඩා අප යොමු විය යුත්තේ උතුරු නැඟෙනහිර යුධ යාන්ත්‍රණයට අසුවූ සමාජයන් තුළ ස්ථාපිත කළ යුතු සිවිල් ප්‍රජාතන්ත්‍රවාදී පරිපාලනමය ක්‍රියාදාමයන් ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියට අනුගාමී වීමය. ඒ සඳහා කළ යුතුව ඇත්තේ දැනට ස්ථාපිත කර ඇති පළාත් සභා සඳහා සිවිල් නිලධාරින් පත් කිරීමත් රටේ අන් ප්‍රදේශවල පවත්නා ආකාරයට යුධ හමුදාවන් අදාළ ස්ථාන වලට කැඳවීම හා ප්‍රදේශයේ ජනතාවගේ භූමියේ අයිතිය ස්ථාපනය කරමින් සිවිල් පොලිස් ආරක්ෂක පද්ධතින් පණ ගැන්වීමය. උතුරු පළාත් සභාව සිවිල් ආණ්ඩුකාරයකු ඉල්ලා සිටීම සාධාරණ ඉල්ලීමකි. මන්ද සිවිල් සමාජයක ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වීම යුධ හමුදා පාලකයින්ගෙන් ඉටු නොවන බව හා සාමාන්‍ය ජනතාව ඔවුන්ව සිවිල් පාලකයන් ලෙස පිළිනොගන්නා බව ලොව පුරාම ඇතිවන දේශපාලන පෙරළිය තුළ දැකගැනීමට හැකිය.

උතුරු පළාත් සභාව කිසිවිටෙක දෙමළ ආණ්ඩුකාරයකු ඉල්ලා නැත. එම නිසා මධ්‍යම ආණ්ඩුව කළ යුත්තේ තමන් විසින්ම ස්ථාපිත කළ පළාත් සභාවේ ආණ්ඩුකාරයා ලෙස සිවිල් නිලධාරියකු වහාම පත් කිරීමට කටයුතු කිරීමය.

එහිදී වඩාත්ම වැදගත් සාධකය වන්නේ පළාතේ ජීවත් වන ජනතාවගේ සිතුම් පැතුම් ජනතා අවශ්‍යතා මානව හිමිකම් හා සංස්කෘතික වටිනාකම් පිළිබඳ පුළුල් දැනුමක් හා පුළුල් හදවතක් සහිත සිවිල් නිලධාරියකු වූ ලයනල් ප්‍රනාන්දු, නෙවිල් ජයවීර වැන්නන් සොයා ගැනීමය.

15 පිටුවට

සුසිල් හෙට්ටිආරච්චි
උස්වැටකෙයියාව

# පරිසර සංවර්ධනය ද?
# භෞතික සංවර්ධනය ද?

**පසුගිය සතියෙන්**

### අත්දැකීම්

මුතුරාජවෙල - මීගමු කලපු මහා සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ලබා ඇති ධනාත්මක සහ ඍණාත්මක අත්දැකීම් යෝජිත නගර සංවර්ධනය පිළිබඳ සංවාදයේ දී ඉවහල් කරගත හැකිය. සංවර්ධන සැලැසුම් සකස් කිරීමේදී ජනතාවගේ සහභාගිත්වයේ වටිනාකම කොතරම් වටිනවාද යන්න පිළිබඳව අපට ආදර්ශයක් සපයනුයේ මුතුරාජවෙල වගුරුබිමේ අනවසර පදිංචි ජනතාවගෙන් ගොඩනැගුන "මුතුරාජවෙල ජනතා ඒකාබද්ධ සංවිධානයයි" මුතුරාජවෙල සංවර්ධනය සඳහා සංකල්පමය සැලැසුම් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමෙන් මහා සැලැස්මට දායක වීමට එම ජනතා සංවිධානයට හැකි වූවා පමණක් නොව, එය ක්‍රියාත්මක කිරීම සඳහා වූ රජයේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකත්වය ලබාගෙන ක්‍රියාකාරී වීමට ද සමත් විය. මෙහි ප්‍රතිඵලයක් වූයේ වගුරුබිම් වාසී ප්‍රජාවට "අවරකොටුව ජනාවාසය" ගොඩනැඟීමය.

එමෙන්ම කලපු ධීවර පවුල් සඳහා ලීනස්වේල්ල ප්‍රදේශයේ, අක්කර 6 1/2 ක වගුරු බිම තාක්ෂණික උපදෙස් මත ගොඩ කර නව ගම්මානයක් ගොඩනැගීමට හැකි වීමද තිරසාර ප්‍රතිඵලයකි. ඍණාත්මක අත්දැකීම් වලින් ද අපට අනාගතය සඳහා ඉගෙන ගත හැකි පාඩම් ඇත. අවරකොටුව සංවර්ධිත ජනාවාසයට පදිංචියට පැමිණි පවුල් පදිංචි වී සිටි ඉඩම්වල එනම් වගුරුබිම්වල යළි පවුල් පදිංචි කරවීම සහ අවරකොටුවට ආසන්නව වැසි ජලය රැඳවීමට වෙන් කරන ලද වගුරුබිම් පෙදෙසේ පවුල් පදිංචි කරවීම නිසා ගංවතුර තර්ජනය වැඩිවීම ඍණාත්මක අත්දැකීමය.

එලෙසම සංරක්ෂණ කලාපයටත්, ස්වාරක්ෂක කලාපයටත් අයත් වගුරුබිමේ පිහිටි "පුබුදුගම" සැළැසුම්ගත පාරිසරික වටකුරු ගම්මානයක් බවට පත් කිරීමට නිර්මාණය කරන ලද සංකල්පමය සැලැස්ම ප්‍රතික්ෂේප කිරීම නිසා, ඉතා අවිධිමත් ලෙස ව්‍යාප්ත වන පුබුදුගම නිදන්ගත ගංවතුර (වැසි ජලය) ගොදුරක් බවට පත්වී ඇත.

අවරකොටුව සංවර්ධිත ජනාවාසය ඉදිරිපිට පිහිටි භූමි ප්‍රදේශය සලකුනු කර තිබුණේ මෙම ජනාවාස ප්‍රජාවගේ දරුවන්ගේ, තරුණ තරුණියන්ගේ ක්‍රීඩා භූමිය සහ පොදු ප්‍රදේශය ලෙස සංවර්ධනය කිරීමටය. එහෙත් අවසානයේ දී එම භූමි ප්‍රදේශයේ වානේ කර්මාන්ත ශාලාවක් ඉදිකරන ලදී. අද එම කර්මාන්ත ශාලාවෙන් නිකුත් වන දුම නිසා එම ජනාවාසයේ දරුවන් ශ්වසන ආසාදනයන්ට ගොදුරුවෙමින් සිටී.

ධනාත්මක අත්දැකීම් අත්පත් කරගැනීමේදී ඉවහල් වූ ප්‍රධාන සාධකය වූයේ සංවිධානාත්මක ජනතා සහභාගිත්වය, එයට සෙඩෙක් වැනි ආගමික අංශයන්ගෙන් සහ සිවිල් සමාජ සංවිධාන වලින් ලද සහයෝගිතාවයයි. මේ අතර ඍණාත්මක අත්දැකීම් වලට සාධක වූයේ නීතියේ පාලනයෙන් තොරව දේශපාලන අතපෙවීම් සහ පූර්ව විනිශ්චයන්ගෙන් නොමඟ යන ලද ආගමික ආයතනික මූලිකයන් බව අවධාරණය කරන අතර රාජ්‍ය නිලධාරින්ගේ අකර්මන්‍යතාවය ද ඉවහල් වූ බව කිව යුතුය.

### පාරිසරික තර්ජනයට මුහුණ දීම

යෝජිත කෙරවලපිටිය නව නගරය සඳහා අක්කර 300 යොදා ගැනීමට යන බව ප්‍රදීප කතුවැකියෙන් අනාවරණය කරන ලදි. මෙම නාගරික සංවර්ධනය මහා සැලැස්මේ නාගරික සංවර්ධනය සඳහා වෙන් කර ඇත. දැනටමත් ගොඩ කර ඇති කලාපයේ නම් වගුරුබිම් ගොඩකිරීමක් අවශ්‍ය නොවනු ඇත. එසේ නොවන්නේ නම් කෙරවලපිටිය වැසි ජලය රැඳවීම සඳහා යෝග්‍ය වගුරුබිම් ගොඩ කිරීමට සිදුවේ.

එයින් මතුවන ගංවතුර තර්ජනය ඉතා විනාශකාරී වීම වැළැක්විය නොහැකිය. යෝජිත බෝපිටිය නව නගරය සඳහා මහා සැලැස්ම භූමි ප්‍රමාණයක් වෙන් කර නැති අතර, එම නගරය ගොඩනගනවානම් එය කරන්නට සිදුවනුයේ ඉතා සංවේදී පාරිසරික තත්ත්වයක් පවතින තෙත්බිමේ වගුරුබිම ගොඩකිරීමෙන් ය. මෙයින් මීගමු කලපුවේ මත්ස්‍ය සම්පත කෙරෙහි ඇති වන අනිටු විපාකය කිව නොහැකි තරම්ය.

3000 ක් පමණ ධීවර පවුල් තම ජීවනෝපාය සඳහා කලපුව මත රැඳෙන අතර, එහි වාර්ෂික නිෂ්පාදන වටිනාකම රුපියල් මිලියන 150 ක් පමණ වේ. තවද වෙනත් ප්‍රයෝජනයන් සඳහා ද කලපුව භාවිත වේ. මේ අනුව මීගමු කලපුවේ සම්පූර්ණ වටිනාකම වර්ෂයකට රුපියල් මිලියන 1000 ඉක්මවයි. කාලයේ සලකුණු කියවා ඒ සඳහා සත් ප්‍රතිචාර දැක්වීම ආපදාවක් වූ පසු ප්‍රතික්‍රියා කිරීමට වඩා ප්‍රඥාවන්තය. මේ සඳහා පහත දැක්වෙන අදහස් සැලකිල්ලට ගෙන ක්‍රියාත්මක වෙමු.

- මහා සැලැස්ම සමාලෝචනය කර, එහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට ඉල්ලා ජනමතයක් ගොඩනැගීම, ඒ සඳහා කොළඹ පදවි කරිටාස් - "සෙත් සරණ" ඒ සඳහා පුරෝගාමිත්වය ගැනීම.
- යෝජිත කෙරවලපිටිය, බෝපිටිය නගර සැළැසුම් ජනතාවට ඉදිරිපත් කිරීම සඳහා වත්තල ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් වන ලෙසත්, ඒ සඳහා පුළුල් ජනතා සංවාදයකට පසු ජනමත විචාරණයක් පවත්වන ලෙසත් ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලා සිටීම. මේ සඳහා සෙත් සරණ සහයෝගය සහිතව ප්‍රදේශයේ කතෝලික ගුරු වසම් දායක සභාවන් සහ සෙසු ආගමික නියෝජිතයන් සහිත ජන සභාවක් පිහිටුවා ක්‍රියා කිරීම.

(සැ.යු. - මේ සඳහා තොරතුරු මොරටු සරසවියේ පි. කේ. එස්. මහනාම මහතාගේ "Effective Management for Biodiversity Coservation in Srilankan Coastal Wetland" කෘතියෙන්) - නිමි -

වි.ලෙ. පීරිස්

# ධර්මදානීය සභා විරසකය

**පසුගිය සතියෙන්**

### දූතන වේදය

මෙම සභාවන්ගේ කැපවීම, පරිත්‍යාගශීලි භාවය සම්ප්‍රදායික සභාවන්ට වඩා ඉහලය. ඔවුන් සම්ප්‍රදායික සභාවන්ට අභියෝගයකි. ඔවුන්ගේ නූතනවේදී ක්‍රියාකාරිත්වය ජනතාවගේ සිත් කාවදින සුළු වේ. පීඩිත වූ අසරණ වූ ජනතාව වෙත පිවිසෙන ඔවුන් ජනතාවගේ දුක වේදනාව ඇතුළාන්ත හදවතින්ම බෙදා ගැනීමටත් උදව් උපකාර කිරීමටත් පෙළඹේ.

ඔවුන් තුළ සුවිශේෂී ක්‍රියාශීලි බවක් දැකිය හැකිය. දැඩි කැපවීම, ආත්ම දමනය, ඉවසීම වැනි උතුම් මිනිස් ගුණාංග ඔවුන් තුළ විද්‍යමාන වේ. මෙම වටිනාකම් හේතුවෙන් මෙම සභාවන් වෙත ජනතාව රොද බැඳ ඒකරාශී වේ. එසේම සභාව තුළ පූජක පෙළගැස්මක් හෝ පූජක පරිපාලනයක් හෝ පූජක විධානයන් හෝ නැත. සැබැවින්ම දේව ආදරය, කරුණාව, දයාව ඇදහිලිවතුන් තුළ ජීවමාන යථාර්ථයක් බවට පත් කිරීමට මෙම සභා සාමාජිකත්වය වෙහෙස මහන්සි ගනී. ජාත්‍යන්තර වශයෙන් ව්‍යාප්ත වී ඇති මෙම සභාවන් ඇමරිකානු අර්ධද්වීපයේ දරිද්‍රතාවයෙන් පෙළෙන රටවල්, ලතින් ඇමරිකානු රටවල් හා ආසියා, අප්‍රිකානු රාජ්‍යයන්ගේ ද ධර්මදානීය සභා වේගයෙන් ව්‍යාප්ත වී ඇත.

කිතුනු ඇදහිලිවතුන් ධර්මදානීය සභා වෙත යොමුවීම නොවැළැක්විය හැක්කක් වේ. මන්ද දුගී බවෙන් මිරිකී සිටින ජනතාව වෙත සුභ සාධනයේ හස්තය ධර්මදානීය සභා දිගු කරයි. ඉන් ජනතාව මුදා දුගීන් වෙත සරණය වීමට දුගීන් වෙනුවෙන් කැපවීමට දේව ධර්මයේ මූලික වගකීමකි. මෙය තේරුම් ගත් පාර්ශවයකි බ්‍රසීලයේ මෙන්ම ලතින් ඇමරිකාන රටවල්හි කිතුනුවෝ. එම පාර්ශ්වය ධර්මදානීය නිකායන් වෙතින් ජනතාව වෙත ලබා දෙන සුභ සාධනයට වඩා වෙනස් වූ මිනිස් උදාරත්වය අගය කරන ක්‍රම වේදයකට යොමු වුණි. එනම්, දරිද්‍රතාවයට පත්වන ව්‍යුහය තේරුම් ගෙන දුගීන්ගේ පැත්ත ගැනීමය. ඒතුළින් ධර්මදානීය පිළිවෙතෙන් ඇදහිලිවතුන් මුදාගනු පිණිස විමුක්ති දේව ධර්මවේදීන් ගෙන් සුවිශාල කාර්යයක් කෙරෙන ලදී. එහෙත් එය සියළු ජාතින්ට ගැලපෙන අයුරින් ඉදිරිපත් වී නැත. නමුත් සමාජ විද්‍යාත්මක ආකල්ප ඔස්සේ මෙවැනි නිගමනයකට පැමිණිය හැකිය. එනම් තල්ලු කරන්නාවූ හා ඇදගන්නාවූ හේතුන් ලෙස කිව හැකිය. කිසියම් ස්ථාවර ප්‍රධාන දහරාවේ සභාවක් වුවද ගත් කල එහි නීති මාලාවක් ඇත. චර්යා පද්ධතියක් ඇත. නීතිරීති හෝ චර්යා පද්ධතිය උල්ලංඝනය කරන්නන් හට කිසියම් ලඝු දඬුවම් ක්‍රම ඇත. මේවා ක්‍රියාවට නැංවීමේදී ඇදහිලිවතුන් සභාවෙන් තල්ලුවීමක් සිදුවේ. මන්ද පළිගැනීම, නෙරපා හැරීම, දඬුවම් ක්‍රම දේව නීතියට අයත් නොවේ. එය තල්ලු කිරීමකි.

මෙලෙසින් තල්ලු කරනු ලබන ඇදැහිලිවතුන් වෙත මෙම සභාවන් සමීප වේ. ඔවුන් තල්ලු වී සිටින, පළිගැනීමට ලක් වී සිටින කොන් කර දමා සිටින ජනතාව වෙත දයාවේ දෑත දිගු කරයි. කුඩා කණ්ඩායම් ලෙස ඇදහිලිවතුන්ගේ හදවතට සමීපව කටයුතු කරන මොවුන් තම සභාව සම්බන්ධවත් එහි නීතිරීති හා වරප්‍රසාද සම්බන්ධවත් ඉතා සරළව නම්‍යශිලිව ජනතාවට පැහැදිලි කර දේ. ජනතාවට තමන් සමීප වීම ශුද්ධාත්ම ස්පිරිතුවකින් බව ඇතැම් සභාවන් ප්‍රකාශ කරයි. ඔවුන්ගේ ඉගැන්වීම ද ස්වාමින් වහන්සේගේ නාමයෙන් සිදුවේ. මෙය ඇද ගැනීමකි. සම්ප්‍රදායික සභාවන්ගෙන් තල්ලු වන ජනතාව ඇද ගැනීම සඳහා මෙම සභාවන් ක්‍රියාත්මක නොවන්නේ නම් එම ජනතාව දහමක් නොමැති ජනතාවක් බවට පත්වනු ඇත.

### කිතුනු විශ්වාසයට හා ඇදහිල්ලට එරෙහි කල්ට් වාදය

මුල් අපෝස්තලික යුගයේ ද කිතුනු විශ්වාසයට එරෙහි ඉගැන්වීම් පැවතුනි. ඒවා ගුප්ත ආගම් ලෙස පෙන්වා දිය හැකිය. පසුව ඥානවාදය, මසියොන් වාදය, මොන්තේනු වාදය, ඒරියස් වාදය වැනි මත ඉදිරිපත් වීම හේතුවෙන් කිතුනු ඇදහිල්ලට හා විශ්වාසයට තර්ජන සිදුවිය. මුල් යුගයෙන් ආරම්භ වූ මෙවැනි දුර්මත ඉගැන්වීම් වර්තමානයේ ද පවතී. මෙම වැරදි ඉගැන්වීම් ව්‍යාජ ධර්මයන් කල්ට් වාදය ලෙස පෙන්වා දිය හැකිය. මොවුන් සත්‍ය ධාර්මික ආගමික නමස්කාර විධි හාස්‍යයට ලක් කරති. කල්ට්වාදීන් ද මූලධර්මවාදීන් මෙන් ජනතා හදවතට ඇනෙන සේ ලංව කටයුතු කරයි.

ලබන සතියට

එස්. හේමාල් පෙරේරා
කළුතර

# ජිනීවා හිදී කුමක් වේද?

ගත් නිසාය. 2009 මැයි මස 26 වැනිදාත් ඇය මෙම කවුන්සිලයම අමතමින් එවැනි සටන් පාඨයක් ඉදිරිපත් කළ නිසාය. එහෙත් එදා එය පරාජය කිරීමට ලංකාවට හැකි වුණි. එයින් වසර පහකට පසුව නැවතත් එම සටන් පාඨයම පෙරටු කරගෙන යම් උත්සාහයක් ගන්නා බව පෙනෙන්නට තිබේ.

එම උත්සාහයට එදා මෙන්ම මහා බ්‍රිතාන්‍යයේ ඇමෙරිකා එක්සත් ජනපදයෙන් සහාය ලැබෙනු ඇත. එහෙත් මෙවර ලංකාව වඩාත් දුර්වල ස්ථාවරයක පිහිටා මෙම සටනට මුහුණ දෙන බව කිව යුතුය. ඇත්ත වශයෙන්ම එය එසේ නොවිය යුතුව තිබුණි. එයට හේතු කීපයකි. යුද ගිනි නිවීමටත් පෙර 2009 දී මේ චෝදනා අප හමුවට ගෙනෙන විට එය පරාජය කිරීමට හැකි වුණි. එහෙත් අද සාමය හෝ සාමයේ අත්තිවාරම වසර පහක් තිස්සේ පවතිද්දීත් ලංකාව එම කවුන්සිලයේම පසුවන්නේ වඩාත් අවාසිදායක තත්ත්වයකය. මෙය අරුමයකි. ඒ වගේම කනගාටුවට කරුණකි.

මෙම මානව හිමිකම් කවුන්සිලයේ ඡන්ද බෙදී තිබෙන්නේ ලංකාවේ ඡන්ද ක්‍රමය මෙන් සමානුපාතික ක්‍රමයටය. වෙනත් ආකාරයකට කියන්නේ නම් ලෝකයේ විවිධ කලාපවල ජනගහන අනුපාතය අනුව මානව හිමිකම් කවුන්සලයේ සාමාජිකත්වය බෙදී තිබේ. ඒ අනුව මේ කවුන්සිලයේ ඡන්ද 47 න් 34 ක් හෙවත් සියයට 72 ක්ම එන්නේ ආසියානු පැසිපික්, අප්‍රිකා සහ ලතින් ඇමෙරිකා කලාප තුනෙනි. එනම් අපේ මිතුරු කලාප වලිනි. තුන්වැනි ලෝකයේ රටවලිනි. එනිසා අප අනිවාර්යයෙන්ම ජයග්‍රහණය කළ යුතුව තිබේ. මේ සෙල්ලම කෙරෙන්නේ අපට අවාසිදායක පිට්ටනියක නොවේ. එහෙත් අද අප මෙම කවුන්සිලයට ඇතුළු වන්නේ තුන්වැනි වතාවටත් ජිනීවා විභාගය අසමත් වීමට බොහෝදුරට ඉඩ තිබෙන ලජ්ජාසහගත තත්ත්වයකය.

ජාත්‍යන්තර පරීක්ෂණයක් පිලිබඳ සටන් පාඨය මෙවර ජයග්‍රහණය කළොත් එවැනි පරීක්ෂණයක් අනිවාර්යයෙන්ම පිහිටුවනු ඇත. එය විවිධ ස්වභාවයක් හා ස්වරූප ගන්නට පුළුවන. එක්කෝ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවකුගේ ස්වරූපය ගත හැකිය. නැති නම් ස්වාධීන විශේෂඥයකු හෝ ස්වාධීන විශේෂඥ කණ්ඩායමක ස්වරූපය ගන්නට පුළුවන. එසේත් නැති නම් පරිපූර්ණ වශයෙන් පරීක්ෂණ කොමිසමක් පත් වෙන්නටද පුළුවන. මේ තුනෙන් කුමක් සිදුවේද යන්න කීමට අපට නොහැක. දැනට වැඩි ප්‍රවණතාවක් තිබෙන්නේ ඒ ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවකු යන සටන් පාඨය වටා වැඩි ඡන්ද සංඛ්‍යාවක් ගොනුවීමටය.

ඡන්ද සංඛ්‍යාව අපේ විවේචකයන් සතුවන බවක් පෙනෙන්නට තිබේ. එය එසේ නොවිය යුතුව තිබුණි. අප මේ කතා කරන අවස්ථාව වන විටත් මේ පරාජය වැළැක්වීමේ ඉඩකඩ ලංකාවට තිබේ. ලංකාවේ දෛවය තිබෙන්නේ ලංකාව අතේය. එම දෛවය තිබෙන්නේ හුදකලා වීම තුළ නොවේ. එම දෛවය රැඳී

පවතින්නේ මෙම කවුන්සිලයේ වැඩි ඡන්ද සංඛ්‍යාව අපේ පැත්තට දිනාගත හැකිද නැද්ද යන කාරණාව මතය. එම වැඩි ඡන්ද සංඛ්‍යාව දිනාගත හැකිවන ආකාරයට සහ බටහිර මත පරාජය වන ආකාරයට කටයුතු කිරීමේ සම්පූර්ණ ස්වාධීනත්වය, ස්වයං තීරණ අයිතිය, ස්වෛරීභාවය ලංකාවට තිබේ. 2009 මැයි මාසයෙ 'අප කළේ එයයි. එවැන්නක් නැවත කරන්නට පුළුවන. එහෙත් නැවතත් එවැන්නක් කරාවි යැයි විශ්වාසයක් මට නැත.

ජාත්‍යන්තර පරීක්ෂණයක් පිහිටෙව්වොත් එම පරීක්ෂණයෙන් එන වාර්තාව ලංකාවට හිතවත් වාර්තාවක් වේයැයි සිතිය නොහැක. එවන් වාර්තාවක් පදනම් 'කරගෙන ලෝකයේ සෑම පාර්ලිමේන්තුවකම පාහේ එය සාකච්ඡාවට ලක්වන්නට පුළුවන. ඇතැම් ප්‍රබල රටවල පාර්ලිමේන්තු මේ වාර්තාව පදනම් කරගෙන ලංකාවට විරුද්ධව යම් යම් ආර්ථික සීමා බන්ධන, තහංචි පන වන්නටද හැකිය. බොහෝ රටවල උසාවි මේ ජාත්‍යන්තර පරීක්ෂණ වාර්තාව අනුව ගොස් විශ්ව යුක්තිභාවය යටතේ ලංකාවේ හමුදා නිලධාරීන්ට විරුද්ධව නඩු පවරන්නට පුළුවන. එපමණක් නොව එම නඩු විභාග කර තීන්දු දෙන්නට ද පුළුවන.

එහෙත් මේ ජාත්‍යන්තර පරීක්ෂණයේ ප්‍රධාන අවාසියක් තිබේ. එනම් යුද්ධයේ අවසන් කාලය හෙවත් යුද්ධයේ ප්‍රතිඵලය ජාත්‍යන්තර නීතියට පටහැනි යැයි නිගමනය වුවහොත් යුද්ධ ප්‍රතිඵලය ලිහා දැමීමේ තැතක් ආරම්භ වීමට

රට සිටින ලාංකික සම්භවයකින් යුත් දමිළ ජනතාවගේ ජාත්‍යන්තර ජනමත විමර්ශනයක් ඒ. ජාතීන්ගේ සංවිධානය විසින් කළ යුතු බවය. මෙයින් පෙනෙන්නේ ජයලලිතා සහ ඒ. අයි. ඒ. ඩී. එම්. කේ. පක්ෂය ප්‍රමුඛ තමිල්නාඩුවේ දමිළ ව්‍යාප්තවාදය ලංකාවට විරුද්ධව ප්‍රබල අභියෝගයක් මතුවෙමින් තිබෙන බවය.

මේ මස අගදී ජිනීවා සටන අප පරාජය වුවොත් අප්‍රේල් මැයි මාසවල ඉන්දියාවේ මැතිවරණ සමයෙන් පසු බිහිවන සභාග ආණ්ඩුවේ ජයලලිතා ප්‍රධාන චරිතයක් වේනම් ලංකාවට විරුද්ධව දෙවැනි පෙරමුණකින්ද මහා තර්ජනයක් එල්ලවනු ඇත. මේ පෙරමුණු දෙක එකිනෙක සමග අන්තර් සම්බන්ධිත බවද මතක තබාගත යුතුය. හේතුව බටහිර දමිළ ඩයස්පෝරාව තමිල්නාඩුවේ මුදල් ආයෝජනය කර තිබීමය. එනිසා දේශපාලනයේ යම් යම් මැදිහත්වීම් සහ සමාජ විඥානයේ මැදිහත් වීම් කරමින් තිබේ. එපමණක්ම නොවේ. 2012 දී ජිනීවා නුවර දී ප්‍රථම වතාවට ඉන්දියාව ලංකාවට විරුද්ධව ඡන්දය පාවිච්චි කළේය.

ඊට සති කීපයකට කලින් එවකට ඇමෙරිකා රාජ්‍ය ලේකම්වරිය වූ හිලරි ක්ලින්ටන් මහත්මිය ඉන්දියා සංචාරයකදී තමිල්නාඩුවට ගොස් ජයලලිතා සමග සාකච්ඡා කළ බවද අප මතක තබාගත යුතුය. මෙම පෙරමුණු දෙක එකිනෙක අන්තර් සම්බන්ධිත වූ සමස්ත වටලෑමක කොටස් බවද අමතක නොකළ යුතුය. මෙම සමස්ත වටලෑම පරාජය කිරීමට නම් ජිනීවා සටන පරාජය නොවිය යුතුය. එහෙත් දැනට දකින ආකාරයට එම සටන පරාජයවීමේ ලකුණු දැනටමත් පහළ වී තිබේ.

ඇමෙරිකාවේ සෙනෙට් සභාව ලංකාවට පක්ෂව යෝජනා ඉදිරිපත් කළ බව වාර්තා වී තිබේ. ඇමෙරිකාවේ සෙනෙට් සභාව යනු මේ ලෝකයේ තිබෙන වඩාත් ප්‍රබල ව්‍යවස්ථාදායක

ඉදිරිපත් වී තිබේ. පළමු යෝජනාව ලංකාවට විරුද්ධවය. එනම් ජාත්‍යන්තර පරීක්ෂණයක් පිහිටුවීමේ යෝජනාවය. දෙවැන්න ලංකාවට පක්ෂ යෝජනාවය. මේ යෝජනා දෙකෙන් වඩා ප්‍රබල පිරිස අත්සන් කර තිබෙන්නේ පළමු වැන්නටය. පාලන බලයේ සිටින ඩිමොක්‍රටික් පක්ෂය සහ රිපබ්ලිකන් පක්ෂය එකට හවුල්වී ප්‍රබල සෙනෙට් සභිකයන්ගේ ප්‍රධානත්වයෙන් මේ අත්සන් කිරීම කර තිබේ. එහෙත් ලංකාවට පක්ෂ යෝජනාවට අත්සන් කර ඇත්තේ එක් ඩිමෝක්‍රටික් සෙනෙට් සභිකයකු හැරුණු විට රිපබ්ලිකන් පක්ෂයේ අය පමණි. එනම් විපක්ෂයේ පිරිසයි. ඔබාමාගේ අයවැය පරාජය කිරීමට තම බලය යොදා රිපබ්ලිකන් පක්ෂය උත්සහ ගත්තේය. එහෙත් එය සම්පූර්ණයෙන් ව්‍යර්ථ වී ඔබාමාගේ ජනප්‍රියත්වය ඉහළ ගිය බවද අමතක නොකළ යුතුය. රිපබ්ලිකන් පක්ෂය යනු ප්‍රබල පක්ෂයක් නොවේ. අපේ සහායට ඉන්නේ එම සාමාජිකයන් කීප දෙනා පමණි. ඒ අතරිනුත් කවුරුත් අසා ඇත්තේ එක් නමකි. එනම් ඔරින් හැච්ස්ය. අනෙක් අය ඇමෙරිකාවේ ප්‍රබල දේශපාලන චරිත නොවේ. එහෙත් ලංකාවට විරුද්ධ සෙනෙට් යෝජනාවට අත්සන් කර තිබෙන්නේ පැට්‍රික් ලී, බාබරා බොක්ස්ර ආදී දේශපාලනයේ ප්‍රබල බල කණුය. මේ දෙක තරාදියක තැබුවහොත් බර පැහැදිලිව තිබෙන්නේ ලංකාවට විරුද්ධ යෝජනාව පැත්තේය. මෙය ලංකාවේ ජයක් නොවේ. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව ගත් විට ලංකාවට පක්ෂව කතා කර ඇත්තේ 1980 ගණන්වල සිට ලංකාවට හිතවත්ව කතා කළ කොන්සර්වේටිව් පාක්ෂික නේස්බි සාමිවරයා පමණි. එහෙත් ලංකාවට විරුද්ධව බ්‍රිතාන්‍ය අගමැතිවරයා සහ විපක්ෂ නායකයා යන දෙදෙනාම කතා කර තිබේ. ලෝකයේ පාර්ලිමේන්තුවල ලංකා හිතෛෂී පිරිස පැහැදිලි හැකිලීමකට ලක්ව ඇති බව පිළිගත යුතුය. මෙය සිදුනොවිය යුතු තත්ත්වයකි.

ඉදිරිපත් වීමට යන්නේ අතිශය භයානක යෝජනාවකි. මෙය සම්මත වුවොත් නුදුරු අනාගතයේදී එ. ජාතීන්ගේ මහා මණ්ඩලය පවා ලංකාවට විරුද්ධව යෝජනාවක් සම්මත කර ගැනීමේ හැකියාවක් තිබේ. තුන්වැනි ලෝකයේ බහුතරයක් වන ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේදී ලංකාවට විරුද්ධව යෝජනාවක් සම්මත කළ හැකි නම් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේත් යෝජනාවක් සම්මත කර ගැනීමට පුළුවන. මීට පෙර කවදාවත් මෙවැනි තත්ත්වයක් ඇති වුයේ නැත.

**මහාචාර්ය දයාන් ජයතිලක**

# පළාත් සභා ඡන්දය සහ ජිනීවා අභියෝගය

මාර්තු මස 29 දා පළාත් සභා ඡන්දය පවත්වා මාර්තු මස 30 දා ජිනිවා හි ශ්‍රී ලංකාවට එරෙහිව ක්‍රියාකිරීමට කටයුතු කරන අයට පාඩමක් කියා දීමට රජය සූදානමින් සිටින බව පැවසේ. එය විරුද්ධ පක්ෂය දකින්නේ ජිනිවා පෙන්වා කෙසේ හෝ ඡන්දය දිනා ගැනීමට රජය කටයුතු කරන බවයි. රජය පවසන්නේ ඡන්ද ප්‍රතිඵල පෙන්වා ජිනිවා වලට පණිවුඩයක් දීමටය. මෙයින් වඩාත් නිවැරදි වන්නේ කුමක්ද යන්න තීරණය කිරීමේදි දෙවැන්න වඩා වැදගත් බව අපට පෙනේ. වත්මන් රජයට මේ වන තෙක් ඡන්ද දිනා ගැනීම එතරම් අභියෝගයක් වී නැත. ඊට හේතුව ප්‍රබල විරුද්ධ පක්ෂයක් ගොඩ නැංවී නොතිබීම හා රජය අප්‍රසාදයට පත්වීමට තරම් වාතාවරණයක් මේ වන විටත් ගොඩනැංවී නොතිබීමය. එසේ නම් මෙවර ඡන්දය මගින් යම් පණිවුඩයක් ජිනිවා හරහා කරන බලපෑම්වලට පෙන්නුම් කළ හැකි නම් එය රටට වැදගත්ය. ඒ නිසා පළාත් සභා පැවැත්වෙන පළාත් සභා දෙක පිළිබඳව විමසුමක් කිරීම කාලෝචිතය.

ජිනිවාවලදි බොහෝ විට සාකච්ඡාවට ලක් කරන්නේ උතුරේ යුද්ධය සම්බන්ධයෙන් ක්‍රියා කළ ආකාරය ගැන හා ජනතාවට වන හිරිහැර ගැන ප්‍රශ්න කිරීම බව පැවසේ. එහෙත් උතුරේ ත්‍රස්තවාදය මුළුමනින්ම නවතා දමා ඒ තුළින් රට තුළ පූර්ණ සාමයක් සඳහා වාතාවරණයක් සකස් කොට, උතුරු පළාතද සීඝ්‍ර සංවර්ධනයකට ලක් කිරීමට රජය පොහොසත් වී ඇති තත්ත්වයක් තුළ ජිනිවා හරහා සිදුකිරීමට යන්නේ හුදෙක්ම ජාත්‍යන්තර ඩයස් පෝරාවට ඇති වුවමනාව ඉෂ්ට සිද්ධ කිරීම බව කාටත් පැහැදිලිය. ඒ නිසා මේ වන විට උතුරු පළාතෙත්, ඡන්ද පැවැත්වෙන බස්නාහිර හා දකුණු පළාතෙත් ආර්ථික සංවර්ධනයේ ප්‍රවනතා සැලකිල්ලට භාජනය කිරීම කාලෝචිතය. මේ ලිපිය වෙන්වනුයේ ඒ සඳහාය.

අප මුලින්ම පළාත් සභා මැතිවරණ පැවැත්වෙන බස්නාහිර පළාත හා දකුණු පළාතේ සංවර්ධනයත් හා උතුරු පළාත පරීක්ෂා කර බලමු. වත්මන් රජය 2006 බලයට පැමිණෙන විට ප්‍රාදේශීය වශයෙන් රටේ දළ දේශිය නිෂ්පාදනයට මේ පළාත් තුන දායක වූ ප්‍රතිශතයන් මෙසේය.

බස්නාහිර 50.1%

දකුණ 9.3%

උතුර 2.9%

රජය බලයට පැමිණ වසර 7 ක් සම්පූර්ණ වන මේ මොහොතේ මෙම පළාත් තුන දළ දේශිය නිෂ්පාදනයට දායක වූ ප්‍රතිශතයන් මෙසේ වාර්තා වේ.

බස්නාහිර 43.2%

දකුණ 11.5%

උතුර 4.0%

මෙයින් පෙන්නුම් කරනුයේ 2006 වන විට "කොළඹට කිරි - ගමට කැකිරි" යනුවෙන් පවසමින් දකුණේ ත්‍රස්තවාදීන් ගෙන ගිය අරගලයට පිළියම් වශයෙන් බස්නාහිර පළාතේ දායකත්වය 50% සිට 43% දක්වා අඩු කරමින් එය අනිකුත් පළාත් අතර බෙදා හරිමින් ප්‍රාදේශීය ආර්ථික විෂමතාව තුනී කිරීමට රජය සමත් වූ බවය. එනම 9% ක් වූ දකුණේ දායකත්වය 11.5% ක් දක්වා වැඩි කිරීමත්, 2.9% ක් වූ උතුරේ දායකත්වය 4% දක්වා වැඩි කිරීමත් තුළින් රටේ නොදියුණු පළාත් සංවර්ධනය කිරීමට රජය විශාල වශයෙන් ඇප කැප වී සිටින බව පෙනී යයි. සියල්ලම දකුණට කරනවා යයි බොහෝ දෙනකු නගන චෝදනාව ද මෙයින් බොරු වී තිබේ. දකුණට වගේ අපට එරෙහිව නැඟී සිටි උතුරට ද එක වගේ සේවාවක් කිරීමට රජය කටයුතු කර ඇත.

ජිනිවා හි හඬක් නගන උතුරේ ආර්ථිකය සීඝ්‍රයෙන් වර්ධනය කිරීමට රජය විශාල කාර්යභාරයක් ඉටුකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 26% ක ආර්ථික වර්ධන වේගයක් 2012 දි උතුරට ලබා දෙමින් ශ්‍රී ලංකාවේ වැඩිම වර්ධන වේගය වාර්තා කළ පළාත බවට පත්කර තිබේ. මුළු රටේම වර්ධන වේගය 6.4% සමග සසඳන විට උතුරු පළාතේ පමණක් එමෙන් සිවු ගුණයක වර්ධනයක් වාර්තා කිරීම ම ජිනිවා හි ශ්‍රී ලංකාවට විරුද්ධව මත ඉදිරිපත් කරන අයට හොඳ පාඩමකි. 2012 බස්නාහිර පළාතේ ආර්ථික වර්ධන වේගය වූයේ 13.7% කි. එය මුළු රටේ වර්ධනය මෙන් දෙගුණයකි. දකුනු පළාතේ වර්ධන වේගය 21% කි. එය මුළු රටේ වර්ධනය මෙන් තුන් ගුණයකි. ඒ අනුව රටේ ජනගහනයෙන් 1/2 කට වඩා නියෝජනය කරන බස්නාහිර හා දකුණු පළාත්වලට වඩා යුද්ධයෙන් හෙම්බත් වූ උතුරු පළාත දියුණු කිරීමට රජය දරන උත්සාහය සුළුකොට තැකිය නොහැකිය. උතුරේ ජනතාවගේ නිමැවුම් මට්ටම යුද්ධයෙන් පසු වර්ෂයේ (2010) රුපියල් බිලියන 194 සිට 2012 වන විට බිලියන 305 දක්වා වසර 3 ක් ඇතුළත බිලියන 110 කින් වැඩිකර තිබේ. එම ජනයාගේ ඒක පුද්ගල ආදායම 2010 රුපියල් 162,000/- සිට 2012 දි රු. 288.000/- දක්වා 126,000/- කින් වැඩිකර දී තිබේ. මේ නිසා ත්‍රස්තවාදය නවතා දැමුයේ උතුරු පළාත සීඝ්‍රයෙන් සංවර්ධනය කොට එම පළාතේ ජනතාවට සීඝ්‍ර දියුණුවක් ඇතිකර දීමට බව ශ්‍රී ලංකාවට එරෙහි වන ජන කොටස්, ජාත්‍යන්තරයේ රටවල් හා ආයතන දැන ගන්නේ නම් හොඳය. එවැනි තත්ත්වයක් තුළ රජයට රටේ ජනතාවගේ පක්ෂතිත්වය පෙරට වඩා වැඩියෙන් තිබෙන බව පෙන්වීමට පක්ෂ භේදයෙන් තොරව රට වෙනුවෙන් රජයට ඡන්දය දීමට ඇතැම් කොටස් සැදි පැහැදි සිටි. අද වන විට ඡන්දය පැවැත්වෙන බස්නාහිර පළාතේ ඒක පුද්ගල ආදායමද රුපියල් 564,000 කි. එය රටේ ඒක පුද්ගල ආදායම වූ රු. 373,000 ට සාපේක්ෂව දෙගුණයකට ආසන්න ගණනකි. දකුණු පළාතේ ජනයාගේ ඒක පුද්ගල ආදායම ද රු. 353,000 කි. එය රටේ ඒක පුද්ගල ආදායම් මට්ටමට සමීප වී තිබේ. බස්නාහිර පළාත 2012 දී 13.7% කින් වර්ධනය වූ අතර දකුනු පළාත 21.3% කින් වර්ධනය වී ඇත. මේ අනුව ඡන්දය පවත්වන රටේ ජනගහනයෙන් භාගයකට වඩා නියෝජනය වන, පළාත් සභා දෙකක ඡන්දය මගින් ලබාදෙන ඡන්ද ප්‍රතිඵලය මගින් ලොවට ප්‍රකාශ කළ හැකි ප්‍රධාන පණිවුඩ තුනකි.

- රජය උතුරේ ජනතාවට යුද්ධයෙන් පසුව කරන වැඩි සැලකිල්ල දකුණේ ජනතාව අනුමත කරන බව
- දකුණේ ජනතාව මෙන්ම බස්නාහිර පළාතේ ජනතාව යුද්ධයට පෙරත්, යුද්ධයේදිත්, යුද්ධයෙන් පසුවත් රජය සමග සිටින බව
- රජයට එරෙහිව ජාත්‍යන්තරය නගන චෝදනා හුදෙක් ම බොරු චෝදනා බව

මේ අනුව මාර්තු 29 ඡන්දයත් මාර්තු 28 ජිනිවා කථා බහත් වඩාත් තීරණාත්මක තත්ත්වයන් දෙකක් බව අවසාන වශයෙන් සඳහන් කරමු.

**වින්සන් මර්වින් ප්‍රනාන්දු**

පහන්

# අපෙන් සමුගත් සම්මානනීය කිතුනු රංගධරයා
# අසේල ජයකොඩි

නොවේ ලෝකය රඟහලක් පුදැසුනැකි මැ එයා පසක් කොට රඟහලෙන් සමුගත් සහෘදය! අසේලය!

යන්නම් කියාද ගිහින් එන්නම් කියාද නොකියාම ආව ගිය මිතුරාන අවුරුද්දකට කලින් කොයි ගියාද නුඹ?

ලිව්වේ මම මගේ කවියක "හිටියානම් යාලුවෙක් අසේල වගේ යාලුවෙක්" කියා නුඹ දසත සැරූ යුගයේ මම වෙනතක සිටි වෙලාවක මිසක හිතකින් නොවේ නුඹ නැති බව පිළිගන්නට

ඉතිං හදුය, නුඹ විඩා හැරියාද හාන්සිපුටුවක් නොමැතිවම කෙසේනම් ගලපන්නද ස්මරණ පබැදුම් නුඹ මත

රත්න ශ්‍රී මහ කිවිඳාගෙ සල්ගහ යට මට නුඹ හමු විය "බෙදී විසිරී ගියත් දස අත කැඳැලි හැර දා සියල්ලෝ කොහේ නුඹ කොයි තැනෙක ඉන්නෙද නොදත්තෙමු අපි කුරුල්ලෝ වැදී හී සර නුඹ වැටුනු වග කියන විට වැඩි මහල්ලෝ මගේ පැනේත් ලේ ගලන්නට වුනා සොයුරු කුරුල්ලෝ"

ජ්‍යෙෂ්ඨ කිවි පරාක්‍රම කොඩිතුවක්කුගෙ "සංසාරෙට මං ආසයි" හි 30 පිටුවෙ නුඹ හමු විය "විදුරු මිනිසා නටමිනි ගිනි තිරයක රඟන්නේය අළු ඇලි නැති ගින්නක ඔහු රිදී රුවින් රඟන්නේය.

වීදුරු මිනිසා නිදමිනි නිදන ඔහු ම දකින්නේය වීදුරු සිහිනයක් තුළින් හෙට දවසේ රූ රූ තල"

මට මතකයි හැඩය වෙනස් කළා අපි ජපන් "චොපර්" සයිකලේක මට සයිකලයක් ගන්න සල්ලි මදි වුන නිසා අපි ගියා පමුණුගම විංකලේකට දෙකට කැඩිලා තිබුනු බයිසිකලයක් ගත්ත උඹ පදිනව.

මම පොල්ල උඩ බයිසිකලෙත් උස්සං මුදු කංද දිගෙ, ඇල පාර අයිනෙ පල්ලමේ අපි හැටට හැටේ විද්දා නුඹෙ ගී හඬ මුතුරාජවෙල සිසාරා ගියා අපි සිංදු කිව්වා කඳානෙට එනකල්ම

ඒ බෝදියාබඳු පියතුමාගෙ තේවාචාරි යුගයයි. නාගොඩ මරිය හමුදාව, තරුණ සමිතිය වගී වෙලා හිටියා ඔහු තුළින් ආපු අලුත් ප්‍රාණයට, ඇන්තනි පියතුමාගෙන් ලද නිදහසට, අපි නාට්‍යමය බව එක් කළා මුලු පල්ලියටම

පාස්කුව අපි කළා ඇට්ටි හැලෙන්න ජනවාරි පලවෙනිදාවක අපි අල්තාරෙ උඩට ආකාසෙන් ජේසුව ගොඩ බැස්සුවා අපි නත්තල් ගවලෙන වෙනුවට පල්ලිය ඇතුලෙ බංකර් හැදුවා මකුලු දැල් විව්වා පල්ලියෙ මංගල්ලෙ වීදි පෙරහරට ස්නාවක ජුවාම් තුමාගෙ ජීවිත කථාව වීදි නාට්‍යයක් වගේ පෙන්නුවා කැරොල් ගියා අපි ගොන් කරත්ත බැඳගෙන රඟපෑවා අපි ඔන්න බොලේ අපි පල්ලිය හිංදා නළුවෝ වුනා ඉතින් අපි ට හිතුනා නළුවෝම වෙන්න.

ඥානාර්ථෙ දැන්වීමකට අපි ගියා නායකකන්ද පල්ලියට "විශ්ව රංග ශිල්ප ශාලිකාව" අපේ රංගන බිහි දොර ජයලාල්, ජනක්, ලාල් කළුබෝවිල, ජූඩ් රොයිස්ටන් නුඹ, මම, ගිහාන්, නිෂාන්ත, ධම්ම, ප්‍රියන්ත, චාල්ස්, ස්වර්ණා තව මහ ගොඩක් නළු පැටවු

පානුයි හකුරුයි කකා අපි මුලින්ම වේදිකාගත වුනා ලියොන් අමරනාත් ගේ "භූතාවේශ" එක්ක.

මරිය හටයෝ බයිට් කළා අපිව අපි වෙසක් නාට්‍යයක බකට් දෙකකට රඟපානවා කියලා අපිට මෙක මහ විසාල නැගීමක් වුනා. අපි ඒකෙන් හොඳටම ෆෝම් වුනා අපි ගියා හැම තැනම පරාක්‍රම නිරිඇල්ල ගෙ "මායා ශක්ති" රෑඩ් කොරන්ස් ගෙ වෙස් මූණු පන්ති



නුඹ මත් වුනා රඟහලට මම සෙට් උනා කැම්පස් යන්න ඉතිං මම හැලුනා නුඹ ඉගිළුනා.

හඳයගෙ ටෙලියක් නුඹට සෙට් වුනු දා උඹ ආවා මාව හොයන් නුගේගොඩට. අපි ජ්ලෙන්ටි බිව්වා "සිංතටික් සිහිනය" ගැන කථා කර කර ඊට පස්සෙ වසන්ත ඔබේසේකර ගෙ "සලෙලු වරම" අද්මිරාල් සරත් වීරසේකර ගෙ "ගාමිනි" මිෂෙල් ගෙ "වල්මත් වූවෝ" සුගත් තිත්තවැල්ල ගෙ "සපිරිවර" රාජිත ගෙ "හංසයින්ටත් මම ආසයි" ධම්මගෙ ගෙ "ප්‍රේමලාල් ආවට පස්සෙ" නිහාල් ගෙ "බොර දිය කඳුර" රොජර් ගෙ "පස්වැන්නා" ජූඩ් රොයිස්ටන් ගෙ "රඟහල" නුඹෙ රුව විනිවිද ගියා.

රයිගම්, සින්ගීස්, යෞවන සම්මාන සම්මාන පිට සම්මාන කොට කැලී පිත්තල පුවරු, පුන් කලස් නුඹ සම්මානනීය වුනා ඇත්තටම නුඹ මහ නළුවෙක් වුනා. වෙලාවක් නැති වුනා නුඹට හැමදාම ෂූටින්/ ප්‍රැක්ටිස් මට හැමදාම ලෙක්චස්/ මීටින්.

කොහේ හරි හංදියක අවේලාවේ හමුවුනාම කථා කළා අපි ජේසු ගැන, ජුදාස් ගැන තර්ක කළා අපි අන්තිම රාත්‍රි භෝජනය ගැන තෝමස් ගැන, පේදුරු ගැන විශ්වාස කළා නුඹ තෝරාගත් තැනැත්තකු බව නුඹ විස්තර කළා නුඹ ස්වාමින් වහන්සේ තුළ නිර්මාණකරණය ගැන සිහින තිබුනා නුඹට Classic නත්තල් නාට්‍ය ගැන Reality කැරොල් ගැන Live පාස්කු ගැන හිර වුනාම සේරි-වානිජ කලාව තුළ අවංකව දුක්වුනා නුඹ තලෙන්තු වලින් සූදු කෙලින්න වීම ගැන එකඟ වුනේ නැහැ නුඹ නළුකම කඹුරන්න ඒ තුළින් පිම්බෙන්න අතේ දුර විසිකළා නුඹ.

හැමෝටම එකම විදිහට හැමෝවම වැළඳ ගත්තා නුඹ හිඟන්නාටත් 'මචං' කිව්වා නුඹ "ඕක හරි මදි, උඹේ තත්ත්වෙට සුදුසු නැහැ නේද" ඇහුවම "ජේසු මෙහෙමයිනේ කළේ" කිව්වා නුඹ.

අපි රාමුව තුළ කොටුවුනා. නුඹ ජනතාවගේ නළුවා වුනා. නිරායාසයෙන්ම.

පල්ලියට, මරිය හමුදාවට ආඩම්බරයක් ගෙනාවා නුඹ අතරමන් වුන, අතහැර දැමූ බැටළුවන් සමග සිටියා නුඹ

නුඹ උන්ට යහපත් එඬේරෙක් වුනා නුඹත් එක්ක ඉන්න කොට පිළිගැනීමක් ලැබුනා ඔවුනට. නුඹ ඔවුන්ව රැලට එක් කළා ආයෙත් වටිනා කමක් දුන්නා නුඹ නුඹ සමග සිටි හැමෝටම.

තැති ගැන්වූ විට අර්නස්ට් සහෝදරයාගේ වියෝව ඒ මලගෙදර රැයේ සරලව ප්‍රකාශකළා නුඹ අපි මැරෙන මිනිසුන් බව එය මියෙන්නා පිළිබඳව උන්වහන්සේගේ කැඳවීම බව එය ජීවත් වන්නන් පිළිබඳව උන්වහන්සේගේ සැලැස්ම බව දැන සිටියා නුඹ කැමති බව ජේසු නුඹට ඇඳහුවා නුඹ. දයාබර චාන්දනී, කපාපු පලුව දුව කවීෂා, පොඩිමෑන් බිනුර ගැන සැලැස්මක් ඇති බව.

නොදැක විශ්වාස කළ එකම මිත්‍රය! ගොලියත්ලා ලඟ නොනැමුනු දාවිත් ගේ ගල් කැටය! අපි නැවත පුදසුනේ කන්තාරු රඟපාමු කුරුසියේ දකුණුපස, ඉදිරිපස, වම්පසද ඉඳගෙන කවි කියමු එතෙක් අපි එනතුරා මරිමවුන් තුරුල්ලේ උණුසුමට සැතැපෙන්න!

ලෙජියෝ මරියේ!

**වජිර දීප්ති වීරකෝන්**
නාගොඩ මරිය හමුදාව ආදි ජ්‍යෙෂ්ඨ පිරිමි ප්‍රසීඩියම වෙනුවෙන්

# චිත්‍ර හා මූර්තිකලාවේ කිතුනු සළකුණ
# ජෝශප් විමල් ද සිල්වා

කුඩා කල සිට චිත්‍ර ශිල්පය ගැන හැකියාවක් ඇති බොරලැස්සේ ජෝශප් විමල් ද සිල්වා පාසල් අවධියේදී සම්මාන සහ සහතික පත් රාශියක් දිනා ඇත. 1965 දී ඥානාර්ථ ප්‍රදීප පත්‍රයෙන් පවත්වන ලද (නත්තල් කාඩ් පත්) තරගයකින් සම්මාන සහතිකද 1971 සංස්කෘතික දෙපාර්තමේන්තුව හා ලංකා කලා සංගමය විසින් පවත් වන ලද වාර්ෂික තරගයෙන් හා 1974 තරගයෙන් (සමස්ත ලංකා) ද්‍රව්‍ය බලා ඇඳීම ප්‍රථම ස්ථානය හා සම්මාන සහතිකය වැනි දක්ෂතා පෙන්වන ලදි.

කැලණිය විශ්ව විද්‍යාලයේ සෞන්දර්ය පීඨයේ 1970 සිට 1975 දක්වා පස් අවුරුදු ඩිප්ලෝමා පළමු පෙල සාමාර්ථයද ලබා ලංකාවේ ප්‍රධාන ගොඩනැගිලි රාශියක අර්ධ උන්නත කැටයම් (Relief) Terra Cotta නිර්මාණය කිරීම ආරම්භ කරන ලදී. 1978 සිට 1991 වර්ෂය දක්වා සෞන්දර්ය ගුරුවරයකු ලෙස කටුකෙන්ද මහ විද්‍යාලයේ සේවය කරමින් මහඟු සේවයක් ඉටු කරමින් ජනප්‍රසාදයට පත්විය. එම කාලය තුළදී සමස්ත ලංකා තරග ප්‍රථම ස්ථාන හා සම්මාන එකදිග ටම ලබාදෙමින් ළමුන්ගේ ප්‍රසාදයට පත්විය. තවද මෙවැනි සාර්ථක ප්‍රතිඵල ලබා දුන් නිසා අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මෙම ගුරු භවතා හට ප්‍රණාම සහතික පවා ලබා දී ඇත. එකල රජයේ (ගම් උදාව) වැඩසටහන සඳහා ප්‍රදර්ශන රථ නිර්මාණයද කර ඇත.

1972 වර්ෂයේදී මහජන බැංකු ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා (එකල විශාල ගොඩනැගිල්ල තට්ටු 14 කි) එයින් තට්ටු 12 කම මෙම නිර්මාණ කිරීම සඳහා ලංකාවේ ප්‍රධාන ශිල්පින් කීප දෙනෙක් (මංජු ශ්‍රී, ජෝර්ජ් කීට්, සේනක



සේනානායක) වැනි ශිල්පින් කීපදෙනා අතරට ජෝශප් විමල්ද සිල්වා තරුණ ශිල්පියාවද තෝරා ගන්නා ලදි. ඒ ගෘහ නිර්මාණ ශිල්පි සුරෙන් වික්‍රමසිංහ ඇතුල තේරීම් කමිටුවයි. 1972 සිට අද දක්වා ගොඩනැගිලි විශාල සංඛ්‍යාවකම නිර්මාණ සඳහා ආරාධනා ලැබුනි. ගෘහ නිර්මාණ ශිල්පි ජෙෆ්රි බාවා මහතා සඳහා "බතේ උපත" ලී කැටයමද City Bank සඳහා ටෙරා කොටා රිලිෆ් එකක් ගෘහ නිර්මාණ ශිල්පි ජේ. ඩී. නිල්ගිරිය මහතාටද කොමර්ෂල් බැංකුව සඳහා ටෙරා කොටා නිර්මාණයත් ගෘහ නිර්මාණ ශිල්පි සුරත් වික්‍රමසිංහ මහතාටද කොන්ක්‍රීට් මියුරල් එකක් ගෘහ නිර්මාණ ශිල්පි මිහිඳු කීර්තිරත්න මහතාටද ඩොල්ෆින් හෝටලයේ කාමර හා විමසීම් කවුන්ටරය සඳහා ටෙරා කොටා කැටයම්ද (ගෘහ නිර්මාණ ශිල්පි ඇෂ්ලි ඩිවොස්) මහතාටද ට්‍රාන්ස් ඒෂියා හෝටලය සඳහා ක්‍රොන්කීට් මියුරල් 48 ක් ගෘහ නිර්මාණ ශිල්පි නවින් ගුණරත්න මහතා නිර්මාණය කිරීම ජනවසම ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා ටෙරාකොටා මියුරල් එකක් නිර්මාණය කිරීම බේරුවල රිවරිනා හෝටලය සඳහා "හිරු සහ සඳ" නමැති අර්ධ උනත කැටයමක් නිර්මාණය කිරීම 1983 වර්ෂයේ බ්‍රිතාන්‍ය අගමැති මාග්‍රට් තැචර් මහත්මියට එවකට මහ වැලි ඇමතිව සිටි ගාමිණී දිසානායක මහතා විසින් ප්‍රදානය කිරීම සඳහා තඹ වලින් සිහිවටන ඵලකයක් නිර්මාණය කිරීම එතුමා විසින්ම එවක ලෝක බැංකු සභාපති තුමාට ප්‍රදානය කිරීම සඳහා සිහි වටන ඵලකයක් නිර්මාණය කිරීම ආදි හෝටල් සහ බැංකු ගොඩනැගිලි රාශියකටම නිර්මාණ සඳහා මෙම ශිල්පියා දායක විය.

විජය රජුගේ ශ්‍රී ලංකා ගමනය නැමති තේක්කවලින් සදන ලද අර්ධ උනත කැටයම දැනට ජපානයේ ඇත. එහි ඡායාරූපයක් 1982 සෙරන්ඩිබ් එයාලංකා මැගසින් එකේ මුල් පිටුව සැරසවීම සඳහා යොදා ඇත. තවද රටවල් කීපයක ඇමරිකාව ජර්මනිය මාලදිවයින එංගලන්තය ඉන්දියාව වැනි රටවලද කුඩා මූර්ති දේව රූප හා බුද්ධ ප්‍රතිමා ලෝකයේ රටවල් බොහෝමයකම මෙම නිර්මාණ ගෙන ගොස් ඇත.

2010 ජූලි මස එංගලන්තයේ නොර්විච් නගරයේ ඇසම්බ්ලි හවුස් හි මසයක පමණ චිත්‍ර මූර්ති ලී කැටයම් ප්‍රදර්ශනයක් පවත්වන ලදි. තවද 2011 වර්ෂයේ එංගලන්තය හේඩන් නගරයේ කමයුනිටි හෝල් එකකට අඩි හැටක් පමණ දිග මාබල් මියුරල් එකක් නිර්මාණය කරන ලදි.

2012 පම්බල දිමුතු පදනම ගොඩනැගිල්ල සඳහා අඩි 12xඅඩි 5 මාබල් සිමෙන්ති වලින් මියුරල් එකක් නිර්මාණය කිරීම එහි තේමාව වනුයේ "පාපයට ඇණ ගැසුණ ජීවිත කුරුසියේ ඇණ ගැසුනු ජේසු තුළින් ගලවා ගැනීම" 2013 ජා-ඇල "පුණරෝදය" මධ්‍යස්ථානය සඳහා මාබල් මියුරල් එකක් නිර්මාණය කිරීම 2013 ගරු ජූඩ් නික්ලස් පියතුමා සඳහා ආදරයේ වේදනාව නැමති කුරුසියක් නිර්මාණය කිරීම.

Glass, Carving, Engreving, Stain Glass, Sand Blasting ආදි මධ්‍ය තුළ මෙම ශිල්පියා අලුත් නිර්මාණ කරමින් සිටියි.

අවුරුදු 42 පමණ කාලයක් වෙහෙස වී අති දුෂ්කර ගමනක යෙදෙමින් ඉදිරියේදී තවත් හරවත් නිර්මාණ කිරීමේ බලාපොරොත්තුවෙන් සිටියි.

# ත්‍යාගිවන්තවූ සැමරුම් උලෙළ

කඳාන, හපුගොඩ ආශ්චර්යයුක්ත දේවමාතා දෙව්මැඳුරේ බෙල්ජියම් ජාතික ගරු ෆර්නන්ඩ් මොයිස් නි.ම.නි පියතුමා කළ සේවය අනුස්මරණය සඳහා සිදුකරනු ලැබීය. අනතුරුව ගුණානුස්මරණ උත්සවය මීසම් ධර්ම සේවා සහා ශාලාවේ පැවැත්විය. එම උලෙළේ වැදගත් අංශය වූයේ මීසම් ධර්මසේවා සහා ශාලාව එදින සිට 'ගරු ෆර්නන්ඩ් මොයිස් නි.ම.නි සමරු ශාලාව' ලෙස නම් කිරීමය. එම මීසම් ධර්ම සේවා සහා ශාලාවේ නිර්මාණකරු හා නිර්මාතෘ වූයේ අද විශ්‍රාම සුවයෙන් වෙසෙන ගරු බැසිල් නික්ලස් හෙට්ටිආරච්චි පියතුමාය. එදා නොදියුණුව පැවති හපුගොඩ සභාවේ සැදැහැවත් ජනතාවට කෙළින් සිටින්නට හැකි අධ්‍යාත්මික. සාමාජික දැනුමෙන් පොහොසත් කරන්නට ගරු ෆර්නන්ඩ් මොයිස් නි.ම.නි පියතුමා දැරූ කැපවීම විශිෂ්ට විය. ඒ එතුමාගේ උදාර සේවයට කෘතගුණ සැළකීමේ නූතන ලකුණ ලෙස ඉහත සඳහන් කළ මීසම් ධර්මසේවා සහා ශාලාව එතුමා නමින් නම් කිරීමට හපුගොඩ ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටුව තීරණය කළේය. එම ශාලාව ගරු ෆර්නන්ඩ් මොයිස් නි.ම.නි පිය සමරු ශාලාව ලෙස නම් කිරීමට හපුගොඩ ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටුව එම ශාලාවේ නිර්මාතෘ ගරු බැසිල් නික්ලස් පියතුමාගෙන් අවසරය යැදීය. ඒ අනුව එම උත්සව දින විශේෂ ආරාධිත අමුත්තා ලෙස පැමිණි ඉසුඹු ලැබ සිටින ගරු බැසිල් නික්ලස් හෙට්ටිආරච්චි පියතුමා විසින් එම මීසම් ධර්ම ශාලාව එදා සිට ගරු ෆර්නන්ඩ් මොයිස් නි.ම.නි ගුණානුස්මරණ ශාලාව ලෙස වූ ලේඛන සමරු ඵලකය නිරාවරණය කරනු ලැබීය. එම ශාලාවේ පුවරුව මීසම් සේවක ගරු රසික ඉවාන් කුරේ පියතුමා අතින්ද, ගරු ෆර්නන්ඩ් මොයිස් නි.ම.නි පිය ඡායාරූපය හපුගොඩ මීසම් සහයක ගරු අජිත් සුරංග පියතුමා අතින් ද නිරාවරණය කෙරිණි.

බටගම මීසම්පතිව අවු. 22 සේවා කාලය තුළ බටගම, හපුගොඩ, බංඩිගම දේවස්ථානයට දහම් දූතයකු ලෙස ආධ්‍යාත්මික, ආත්මික, අධ්‍යාපනික සේවාවක කැපවී කළ කරුණු රාශියක් ආවර්ජනය කරමින් බටගම මීසම වෙනුවෙන් ප්‍රවීණාචාර්ය නෙවිල් ඇන්ටන් ජයමහ මහතා දීර්ඝ ඉතිහාසයක කරුනු මඟින් ඒ ගරු පිය බුහුමනට බඳුන් කෙරිණි.

හපුගොඩ මීසම හා හපුගොඩ ජ්‍යෙෂ්ඨ පුරවැසි කමිටුව වෙනුවෙන් ගරු ෆර්නන්ඩ් මොයිස් නි.ම.නි පිය ඇගැයු ඩී. එස්. පතිරණ මහතා මොයිස් පියතුමා ජීවිතයේ බාහිර ලෝකයට වඩා මිනිස් ඇතුලාන්තය උතුම් ස්ථානයකට ජීවිත ආදර්ශයෙන් ගෙනගිය පියතුමකු ලෙස ඇගැයීය.

මුලසුනේවූ ගරු රසික ඉවාන් කුරේ පියතුමා ගරු මොයිස් පියතුමාගේ දැහැමි ජීවිත චර්යාව එතුමාගේ පූජක දිවියට පෙර සිට දුටු බව අගයන විදේශීය ගරු පියවරු සහා මාතාවට කළ සේවාවන්ද අනුස්මරණය කෙරිනි.

එදින විශේෂ ආරාධිත ලෙස පැමිණි ගරු බැසිල් නික්ලස් පියතුමා ගරු මොයිස් පියතුමා පනහ දශකයේ විශාල සේවා රැසක් හපුගොඩ ජනතාවට කර තුබු බැවින් එතුමාට ඒ සමයේ සේවය කිරීමට පහසු පරිසරයක් හපුගොඩ නිර්මාණය වී තුබු බව කෘතගුණ පූර්වකව ඇගැයුමට බඳුන් කෙරිණ.

එදින මෙම උලෙළේ විශේෂ කරුණක් වූ යේ හපුගොඩ මීසමේ ඉහත පියවරුන්ට එදා විවිධාකාරයෙන් මහත් සහයක් දැක්වූ මිල්ටන් ගුණසේකර මහතා විසින් දෙව්මැඳුරේ හා කනයාරාමයේ ඉතිහාසය ලියූ අත් පිටපත් දෙකක් හපුගොඩ මීසමේ ගරු මීසම් සේවක පියතුමාටත්, කනයාරාමයේ ප්‍රධාන පැවිදි සොයුරියටත් ප්‍රදානය කිරීමය. අනතුරුව ඒ මහතා ද ඒ ගරු පියවරුන්ගේ සේවා මතක සටහන් ඉදිරිපත් කෙරිණි.

මෙම උලෙළට මැසනඩ් විදුහලේ ආත්මික සේවා ගරු ක්‍රිෂාන්ත ප්‍රනාන්දු නි.ම.නි පියතුමාද සහභාගිවූ අතර හපුගොඩ දෙටු පුරවැසි කමිටුවේ ගරු සභාපති ක්‍රිස්ටෝපර් සිල්වා හා ගරු ලේකම් එම්. ඒ. පින්තු මහතුන්ගේ දෙසුම් වලින් සභාවේ කටයුතු නිමවිය.

**ඩී. සි. පතිරණ**

**නිදහස්ව ... 1 පිටුවෙන්**

මෙවර පළාත් සභා මැතිවරණයට පෙර මැතිවරණ දිනයේදී මෙන්ම මැතිවරණයෙන් පසුවත් ප්‍රචණ්ඩත්වයෙන් තොරව, හිංසනය හා දූෂණයෙන් තොර සාමකාමී වාතාවරණයක් පවත්වාගෙන යන්නට කටයුතු කරන්නැයි සියළු දේශපාලන පක්ෂ වලින් මීගමුව කලාපයේ පූජක හා පැවිදි සංඝය ඉල්ලා සිටී.

ස්වකීය හෘද සාක්ෂියට එකඟව නිදහස් හා ස්වාධීනව ඡන්දය පාවිච්චි කිරීමට අවකාශ සලසා දෙන ලෙස ආරක්ෂක අංශ, පොලීසිය හා මැතිවරණ කොමසාරිස්වරයාගෙන් ද ඉල්ලා සිටින ඔවුන් මේ සඳහා දේව මැදිහත්කම පතා යාච්ඤා කරන්නැයි ජනතාවගෙන් ඉල්ලා සිටී.

**තවමත් ප්‍රමාද ... 12 පිටුවෙන්**

අපට හැඟෙන පරිදි ඒ සඳහා මෙම ප්‍රශ්නය පිළිබඳ පුළුල් දැනුමක් සහිතව ජාත්‍යන්තරය හා කරට කර සිටිය හැකි මොහාන් සමරනායක, දයාන් ජයතිලක, ආචාර්ය ලක්සිරි ප්‍රනාන්දු වැන්නන් අතරින් සුදුස්සකු උතුරු ආණ්ඩුකාරයා ලෙස පත්වුවහොත් ඉදිරියේදී අපට ජාත්‍යන්තරය චිල්ල කිරීමට සූදානම්ව ඇති ප්‍රහාරයේ බරපතලකම බොහෝ දුරට අඩුකර ගත හැකි වන අතර දේශපාලනික වටපිටාවක් ගොඩනැගෙනු ඇත. - නිමි -

# "මුතුරාජවෙල අප ස්වාමිදූ" දෙව්මැඳුරට සැදැහැවතුන්ගෙන් ආධාර පතයි

අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ යෝජනාවක් අනුව නම් කළ "මුතුරාජවෙල අප ස්වාමිදූ" දෙව්මැඳුර පමුණුගම බෝපිටිය තීල්සිරිගම මුතුරාජවෙල ගම්මානයේ 7 වන පටුමගේ අක්කර එකහමාරක භූමි භාගයේ ගොඩනැඟීමට නියමිතය.



බෝපිටිය මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමාගේ මැදහත් වීමෙන් යෝජිත භූමි භාගය ගොඩ කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

මෙම දර්ශනීය දෙව්මැඳුර ගොඩනැඟීම සඳහා ඔබ සැමගේ ආධාරය අපේක්ෂා කැරේ. එම පරිත්‍යාග යන් මීසම් සේවක ගරු එරින්ටන් සිල්වා පියතුමා, සා. නිකුලා දෙව්මැඳුර, බෝපිටිය, පමුණුගම ලිපිනයට හෝ පමුණුගම බෝපිටිය හැටන් නැෂනල් බැංකු ශාඛාවේ අංක 210020002564 ඉතිරි කිරීමේ ගිණුමට යොමු කළ හැකිය. වැඩි විස්තර සඳහා 0777922003 ඔස්සේ ගරු පියතුමන් ඇමතිය හැකිය.

ගරු එරින්ටන් සිල්වා පියතුමා දෙව්මැඳුර ගොඩනැඟීමට යෝජිත භූමිය ගොඩ කිරීමේ කටයුතු පරික්ෂා කරනු සේයාරුවෙන් දැක්වේ. **(සේයා - ඇන්ටන් හපුආරච්චි, සටහන - ජෝ. සංගපාලආරච්චි)**



සාම්ප්‍රදායික, චතාරික ගීතිකා වලින් සමන්විත "දෙවියනී, මාගේ දෙවියනී" සී. ඩී. තැටිය එහි සම්පාදක සුනිල් ශාන්ත වර්ණකුලසූරිය මහතා ඉකුත් ළමා දින උලෙළේ දී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙත පිළිගැන්විය.

කේ. බී. එඩ්වඩ් ප්‍රනාන්දු සංගීත සංයෝජනය කළ මෙහි සංගීත අධ්‍යක්ෂණය හා ගායනය සම්පාදකවරයා සතු වන අතර ලෝරන්ස් මාටින්, ලෙස්ලි ප්‍රනාන්දු, සමනලී ප්‍රනාන්දු, කරිෂ්මා ප්‍රනාන්දු ගායනයෙන් සහය වූහ. ජාතික ජනවන්දනා කමිටුවේ අනුමැතිය මෙ සී. ඩී. පටයට ලැබී තිබේ. **(නිමල ලක්ෂිත)**

# පාස්කු අතිරේකය 2014

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මඟින් මෙවර චතාරිකය හා පාස්කු මංගල්‍යය නිමිති කොට ගෙන ජාතික පුවත් පතක් සමඟ ශුද්ධවූ සතිය තුළ නොමිලයේ බෙදාහැරීම සඳහා විශේෂ පාස්කු අතිරේකයක් මුද්‍රණය කිරීමට කටයුතු සූදානම් කර ඇත.

ඒ සඳහා ඔබගේ හරවත් සාරගර්භ ගද්‍ය, පද්‍ය, නිර්මාණ, ලිපි, කෙටිකතා සහ වාර්තා පහත ලිපිනයට යොමු කරන්න.

එම නිර්මාණ මීට පෙර පුවත්පතක පළ නොවූ නිර්මාණ බවටත් ඒවා ස්වයං නිර්මාණ බවටත් තමන් විසින්ම සහතික කර තමන් අයත් මීසම් සේවක පියතුමන්ගේ අත්සන හා නිල මුද්‍රාව සහිත නිර්දේශය ඉදිරිපත් කළ යුතුය.

පැහැදිලි අකුරින් ලියන ලද හෝ මුද්‍රිත නිර්මාණ 2014. 03. 20 දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.

**අධ්‍යක්ෂ,**
**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**
**අංක 155/10, කාසල් වීදිය**
**කොළඹ 08.**

# පළමුවන වසර සිහිකිරීම



**මනු උපත : 1923. 05. 02**
**සග සැපත : 2013. 04. 17**

හමුවේ දිනක ඒ ලස්සන
ලොවෙහි අප

වෙන්නප්පුව උල්හිටියා පාරේ
"රෝහන" හි විසූ
විශ්‍රාමලත් පාඨශාලාචාරිණී
**ඩබ්ලිව්. මේරි මාග්‍රට් වාස් මිය**

අප අතරින් වෙන්ව සගසුව දිනා 2014. 04. 17 දිනට පුරා වසරකි. ඇගේ ආත්මය වෙනුවෙන් දෙවිඳුන් හා මරිමවුන් යදින මෙන් කාරුණිකව ඉල්ලා සිටින්නේ,

ගරු අල්පෝන්ස් මාරි (ශු.ප.) පැවිදි සොයුරිය ඇතුළු ඥාති පිරිසයි.

## නිවැරදි කිරීමයි

පසුගිය පෙබරවාරි මස 16 දා ඥානාර්ථ ප්‍රදීපය මැද පිටුවේ පළවූ ඉතාලියේ වෙසෙන ශ්‍රම සංක්‍රමිකයින්ව සුදොතුම් පියා බැහැදැකීමේ උත්සවය සම්බන්ධ ලිපියේ පළවූ ඡායාරූප වලින් කිහිපයක් ඉතාලියේ වෙසෙන ආර්. එෆ්. දිල්හාන් නමැති අයකුගේ බවත්, ඔහුගේ නම පළ නොවූයේ ප්‍රමාද දෝෂයකින් බැවින් ඒ ගැන අපගේ කණගාටුව ප්‍රකාශ කරනු කැමැත්තෙමු. - කර්තෘ පියතුමා

**කතෝලික ළමා නිවාසයක පරිපාලන හා**
**කළමනාකරණ තනතුරු සඳහා ඇබෑර්තු ඇත.**
**විමසන්න - 0718482693**

# බෝලවලාන ආවේ මරියා කන්‍යාරාම විදුහලේ ගුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවේ

මීගමුව බෝලවලාන අක්කර පනහ ආවේ මරියා විදුහලේ උසස් පෙළ භෞතික විද්‍යාව, ජෛවීය විද්‍යාව, භූගෝල විද්‍යා විෂයයන් ඉගැන්වීම සඳහා ගුරු මහත්ම මහත්මීන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත.

සියලු විස්තර විදුහල්පතිනි ගරු සිරිමා ඔපනායක පැවිදි සොහොයුරිය ඇමතීමෙන් හෝ විදුහලින් ලබාගත හැකිය. දුර. ඇමතුම 031-5318318, 0313311400 **(ටී. සුනිල් ප්‍රනාන්දු)**

# මංගල ආසිරි !



කුරුණෑගල පදවියට අයත් වික්ෂෝප දේවමාතා දෙව්මැඳුරේ ප්‍රධාන දහම් ගුරුවරියක ලෙසද දේවස්ථානයේ ගායනා කණ්ඩායමේ සාමාජිකාවක හා ජාතික තරුණ කතෝලික සංගමයේ සාමාජිකාවක ලෙසද කැපවූ සේවාවක් ඉටු කළ ආසිරි රසාංජලී මෙනෙවිය පසුගියදා අතිනත ගත්තාය.

ඇයගේ අත ගත්තේ කඳාන බටගම රොහාන් ප්‍රසන්න මහතාය. විවාහ මංගල දිව්‍ය යාගය කුරුණෑගල පදවි පරිපාලන නාහිමි අතිගරු පියල් ජානක පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් සිදු කළ අතර පදවි මරිය හමුදා අධ්‍යක්ෂ ගරු ලයනල් ප්‍රනාන්දු පියතුමා ද ඊට සහභාගි විය. නව යුවළට සුපැතුම්. **(නිමල් ඒ. අල්මේදා)**



පමුණුගම මීසමේ දහම් සේවිකාවක වන පැතුම් මෙනෙවිය පසුගියදා හිමාද්‍රර්ශ මහතා සමඟ යුග දිවියට පිවිසුනාය.

ඇය පමුණුගම බිම්පඳුර ප්‍රදේශයේ දූ දරුවන්ට දහම් දැනුම දෙමින් ළමා සමාජ බිහි කරමින් හා ඇගේ ගායන, නර්තන හැකියාවන් තුළින් ද දරු දැරියන් ආගමික හැදියාවක් වෙත යොමු කිරීමට උනන්දු විය. ඇය අතගත් හිමාද්‍රර්ශ මහතා ගරු නලීන් සුරාජ් පියතුමන්ගේ සොහොයුරකු ද වේ. නව යුවළට සුබ පැතුම්. **(බෙන්ජමින් කිරිහෙට්ටි)**

# කළ පව් සිහිකර සමිඳුන් සොයා යමු

## තලවිල චතාරික මංගල්‍යය අදයි

කල්පිටිය අර්ධද්වීපයේ ඇති සුන්දරම ස්ථානය විටක මෙය විය නොහැකිද? දිස්ත්‍රික්කයේ වැඩිම ජන ගඟක් එකතු වන්නේ මෙතැන නැත්නම් වෙන කොහිද? එය වසරකට දෙවතාවකි. සාන්ත ආනා මෑණියන්ට කැප කර ඇති තලවිල සිද්ධස්ථානය ඉතා වැදගත් මෙන්ම වාසනාවන්ත ස්ථානයකි.

දිනපතා පුදබිම කරා ඇදී එන කිතුනුවන් මෙන්ම අන්‍යාගමික ජනතාව දේව ආදරය අත්දකින්නේ අහසින් වැටෙන වැසි මෙනි. අබල, දුබල ජනයා, දුක වේදනාව දරා ගන්නට බැරිව හඬන වැළපෙන ජනයා සන්තානා මෑණියන්ට දුක කියන්නේ එම දුකට, කඳුලට පිහිට වන්නේ ඕතුමී නිසාමය. රෝද පුටුවල හිඳගෙන, තුති පුදන, දුක කියන කිතුනුවන්, අත්වාරු අතැතිව ඕතුමිය හමුවන සැදැහැවතුන් බලාපොරොත්තු සුන්වී මං මුලාවී දිවි නසා ගැනීමට ප්‍රථම සන්තානා මෑණියන් පාමුල වැඳ වැටී පසුතැවිලි වන මිනිසුන් හා පවුල් පිටින් බලාපොරොත්තු උදෙසා කන්නලව් කරන දුගී ජනයාගෙන් ගහන වූ ස්ථානයකි.

මෙ වර්ෂයේ චතාරික මංගල්‍ය සඳහා මෙහි ඇදී එන වන්දනාකරුවන්ට දෙවිඳුන් ආරාධනා කරන්නේ හදවතින්ම අර්ථාන්විත මංගල්‍යයකට සහභාගි වන්නටය. "කළ පව් සිහිකර සමිඳුන් සොයා යමු" මෙවර චතාරික මංගල්‍යයේ තේමාවයි. දෙවිඳු වෙත හැරෙන්නට පව් මඟ අතහැර දෙවිඳු සොයන්නට මෙවර මංගල්‍යය අපට ආරාධනා කරයි. **(තලවිල සිද්ධස්ථාන සහයක ගරු නිරෝෂන් ශ්‍රී කාන්ත පියතුමා)**

# යුගදිවියේ රජත සැමරුම



පමුණුගම බිම්පඳුර මර්වින් බියට්‍රිස් රුද්‍රිගු යුවළගේ විවාහ දිවියේ විසිපස් වසර වෙනුවෙන් තුති පිදීමේ දිව්‍ය යාගයක් පසුගියදා පැවැත්විණ.

පවුල් සේවා නව අධ්‍යක්ෂ ගරු ක්ලෝඩ් වනසිංහ හා අයිවන් පෙරේරා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් පමුණුගම දෙව්මැඳුරේදී මෙය පැවැත්විණි. මොවුන් අගරදගුරු පදවි තුඩැල්ල විවාහ අපේක්ෂක යුවළ සඳහා දේශන මෙහෙයවනු ලබයි. පමුණුගම විවාහ හමුවේ සභාපති යුවළ වන අතර බියට්‍රිස් මහත්මිය පමුණුගම දිව්‍ය හෘදය සමිතියේ ක්‍රියාකාරී සාමාජිකාවකි. දියණියන් දෙදෙනකුගේ දයාබර දෙමාපියන් වන මොවුනට සුබ පැතුම්.

# දයා සේවියා සගසුව දිනයි



හල්පෙ මීසමට අයත් කළුවාරිප්පුව ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයේ සා. වින්සන්ද පාවුලා සංගමයේ සභාපති ධුරය දරමින් දෙව්මැඳුරට හා ප්‍රදේශයට ඉමහත් සේවාවක් ඉටු කළ ඩබ්. ජී. සුනිල් ප්‍රනාන්දු මහතා පසුගියදා සගසුව දිනීය.

සෙලින්කෝ ඉන්ෂුවරන්ස් සමාග මෙ විධායක නිලධාරියකු ලෙස සේවය කොට විශ්‍රාම ලබා සිටි ඒ මහතා තම දැනුම, කුසලතාවයන් හා විවිධ ආයතන හා තිබූ සබඳතාවයන් තුළින් දේවස්ථානයට හා ප්‍රදේශයේ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් කැපවී කටයුතු කළේය.

දිව්‍ය හෘදය සමිතියේ හා මීසම් කමිටුවේ සාමාජිකයකු වූ ඒ මහතා "ඥානාර්ථ ප්‍රදීපය", "භක්ති ප්‍රබෝධනය" පුවත්පත්, සඟරා සමඟ ද සමීපව කටයුතු කරමින් එම පත්‍ර, සඟරා කළුවාරිප්පුව ප්‍රදේශයේ බෙදාහැරීමේ නියෝජිතයා වශයෙන් ද කටයුතු කළේය. ඒ මහතාගේ ආත්මයට සදා මොක් සුව පතමු. **(ටී. සුනිල් ප්‍රනාන්දු)**

**කළුතර පියවර පුස්තකාලයට ආධාර පිණිස**
**මහින්ද නාමල් ගුරු පියාණන්ගේ ගී පද සරණීය**
**තිලැස ගේය ප්‍රසංගය**
**2014. 03. 16 දින සවස 2.30 ට**
**කළුතර සිරිකුරුස විදුහල් ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ.**
**එදින තිලැස ගේය පද සරණීය දොරට වැඩීම ද සිදුවේ.**